sinhalaebooks.com

# පෙර භවය පැවසූ දරුවෝ

පෙර භවය හෙළිදරව් කළ දරුවන්ගේ විශ්මිත කතා



sinhalaebooks.com

# පෙර භවයේ කැපුණු ඇඟිලි අහිමි වී යළි උපදියි

බැලුවෝ - 1451 අදහස් - 0



පෙර භවය හෙළි කළ දරුවන් අතරින් සිරුරේ කොටස් අඩුවී උපත ලැබූ දරුවෝද සිටිති. අැතැම් විට ඔවුන්ගේ සිරුරුවල කොටස් අඩුවූයේ පෙර භවයේ සිදුවූ අනතුරු නිසා බැව්ද ඔවුහු ප්‍රකාශ කරති.

අතක ඇඟිලි අහිමිවී උපත ලැබූ දරුවෙක් පෙර භවය පිළිබඳව අතිශය පුදුම කරුණු අනාවරණය කළේය. මෙම දරුවා උපත ලැබුවේ ඉන්දියාවේ ඩිපාති දිස්ත්‍රික්කයේය. මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලොව පුරා සිදුකළ පුනර්භව පර්යේෂණ අතර මෙම දරුවාගේ කතා පුවත අතිශය වැදගත් පුනර්භව සාධාකයක් ලෙස පර්යේෂණ වාර්තාවලට ඇතුළත් කර තිබේ.

sinhalaebooks.com

ලෙක්පාල් නම් එම දරුවා දකුණු අතේ ඇඟිලි පහම අහිම්වී උපත ලැබීය. ඉන්දියාවේදී ඔහු උපත ලැබුවේ 1971 වසරේදීය. තම පුත්‍රයාගේ දකුණු අතේ ඇඟිලි අහිම්වී ඉපදීම ගැන දෙමාපියෝ බලවත් කම්පාවට පත්ව සිටියහ. දරුවාට වෙනත් කිසිදු ආබාධිත තත්ත්වයක් නොවීය. එහෙත් ඔහුට වරින් වර උදරාබාධ ඇති විය. ඒ නිසා ශාරීරික වැඩීම තරමක් දුර්වලවී තිබිණි. ඔහු බහතෝරන අවදිය වූයේ වසර හතරකට පමණ පසුවය.

දිනක් සිය සොහොයුරිය ඇමතූ දරුවා ඔහුට වෙනත් නිවසක් ඇති බවත් එහිදී පියා විසින් ක්‍රියා කරවන ලද යන්ත්‍රයකට හසුවී අතේ ඇඟිලි කැපී ගිය බවත් අනාවරණය කළේය.



**උපතින් ඇඟිලි අහිම්වී තිබූ අයුරු**

sinhalaebooks.com

තම මල්ලිගේ එම ප්‍රකාශයෙන් මවිතයට පත්වූ සොයුරිය ඒ බැව් දෙමාපියන්ටද කියා සිටියාය. මේ අතර ඔහු නිතර නිතර 'තල්' යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයක් ගැන හෙළි කරන්නට විය. ඔහු නිතර කියා සිටියේ උපත ලබා සිටින ප්‍රදේශයේ සිටිය නොහැකි බවය.

ඔහු හෙළිකරන තොරතුරු සොයා බැලීමට දෙමාපියන් එතරම් උනන්දුවක් නොගත්හ. එහෙත් දරුවා පැවසුවේ ඔහුට පෙර නිවසට යෑමට අවශ්‍ය බවය. ඒ වන විට තම දරුවා කිසියම් පෙරභව තොරතුරක් අණාවරණය කරන බැව් දෙමාපියෝ අවබෝධ කරගෙන සිටියහ.
දින කීපයක් ගත විය. මව විසින් දරුවා වඩාගෙන සිටියාය. ඒ අවස්ථාවේ අසල්වැසි කාන්තාවක් නිවසට පැමිණියාය. දරුවාගේ අතේ ඇඟිලි පරීක්ෂා කළ ඇය වෙනත් ගමක දරුවෙකුගේ ඇඟිලි ඒ අයුරින්ම කැපී මිය ගිය බවත් එය සිදුවූයේ පියා විසින් කොළ වර්ග කැපීමට යොදාගත් යන්ත්‍රයකට හසුවීමෙන් බවත් කීවාය. එම අනතුර සිදුවූ ප්‍රදේශය 'නග්ලාතල්' යනුවෙන්ද හැඳින්වූ බවත් අ◌ැය ප්‍රකාශ කළාය.

එහෙත් දෙමාපියෝ එහි සත්‍යතාවය සොයා බැලීමට ඉදිරිපත් නොවී සිටියහ. පෙර භවයේ සිටි නෑදෑ හිතවතුන් කිසිවකු◌ෙග් නම් ඔහුගෙන් හෙළි නොවිණි. වැඩිමහල් සොහොයුරකු සහ සොහොයුරියක පමණක් සිටි බැව් ඔහු හෙළි කළේය.

sinhalaebooks.com

තවත් සති කීපයක් ගත විය. දරුවා හෙළි කරන පෙරභව තොරතුරු ඔහු අනාවරණය කළ ගම් ප්‍රදේශයටද පැතිර ගියේය. එහි සිට පැමිණි ගම්වැසියකු දරුවාගේ දෙමාපියන් හමුවී ඔහු එම ගම් ප්‍රදේශයට රැගෙන යාමට ඉල්ලා සිටියහ. ඒ අනුව ලෙක්පාල් දරුවාට පෙරභව නිවසට යෑමට අවස්ථාව ලැබිණි. එහි ගිය ඔහු පෙරභවයේ තම ඇඟිලි කැපී ගිය යන්ත්‍රය සහ නිවසද නිවැරදිව හඳුනා ගත්තේය.


එම දරුවා ප්‍රකාශ කළ පරිදි ඇඟිලි අහිමිවී මියගොස් තිබුණේ හකිම්සින් නමැති අටදෙනකුගෙන් යුත් පවුලක විසූ සිව්වන දරුවාය. පියා විසින් ක්‍රියාත්මක කළ යන්ත්‍රයට ඔහු තම අත දමනවිට වයස අවුරුදු හතරක් පමණ විය. පියා ක්‍රියාත්මක කළ යන්ත්‍රය ගවයින්ට ආහාර සඳහා කොළ වර්ග කැපීමට භාවිතා කරනු ලබන යන්ත්‍රයක් විය. හකිම්සින් දරුවා එදා පියා ක්‍රියාත්මක කරනු ලැබූ යන්ත්‍රය අසල සිටියේය.

ස්ථානයෙන් එම යන්ත්‍රය ක්‍රියාත්මක කරනු ලබන්නේ එක් අයෙක් යන්ත්‍රයට කොළ වර්ග ඇතුල් කිරීමත් වෙනත් අයකු යන්ත්‍රයේ රෝදය ක්‍රියාත්මක කිරීමෙනි. එහි එක් පසෙකින් යන්ත්‍රයට ඇතුළු කරනු ලබන කොළ කැබලි ලෙස කැපීම පිණිස පිහිතලයක් කැරකී ක්‍රියාත්මක කෙරේ.

sinhalaebooks.com

එදින එම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබුවේ පියා විසින් පමණය. යන්ත්‍රයට කොළ ඇතුළු කිරීමෙන් යන්ත්‍රය ක්‍රියාත්මක වීමත් ඔහු අතින් සිදුවෙමින් තිබිණි. ඒ අසල සිටි දරුවා එක්වරම යන්ත්‍රයට අත දැම්මේය. එහෙත් ඒ බැව් පියා නොදුටුවේය. ක්‍රියාත්මක වෙමින් තිබූ යන්ත්‍රයට හසුවී දරුවාගේ දකුණු අතේ ඇඟිලි සියල්ල කැපී වෙන්විය.

වහාම දරුවා ඔසවා ගත් පියා සිය වැඩිමහල් පුත්‍රයාද සහ අසල්වැසියන් සමඟින් ළඟම තිබූ රෝහල වෙත ඔහු රැගෙන ගියේය. ඒ වන විට හොඳ සිහියෙන් සිටි දරුවා රෝහලේදී බෙහෙත් දමන විටත් සිහියෙන් සිටි නමුත් වෙලුම් පටි දැමීමත් සමඟ ටික වේලාවකින් සිහිසුන්විය.



**කොළ කපන යන්ත්‍රය**

sinhalaebooks.com

රෝහලේදී ඖෂධ එන්නත් කිරීමෙන් පසු ඔහු ආපසු නිවස වෙත ගෙන එනු ලැබීය. මාස දහයක් පමණ ගතවිය. අතේ තුවාලය සුවවිය. එහෙත් හදිසියේ සෑදුණු උණ රෝගයක් නිසා ඔහු රෝගාතුර විය. නැවතත් වහා ඔහු රෝහල් ගත කැරිණි. එහිදී ද ඖෂධ එන්නත් කිරීමෙන් පසු නැවත නිවස වෙත පැමිණියේය. නිවසට පැමිණීමත් සමඟ ඔහු මරණයට පත්විය.

ඇඟිලි අහිමි වීම නිසා එම දරුවා සුවපත්වී සිටි කාලය තුළදී ඔහු වමත භාවිතා කර තිබූ බවද පර්යේෂණවලදී අනාවරණය විය. අතේ ඇඟිලිවලට ප්‍රතිකාර කිරීමේදී නිතර නිතර දරුවා තම ඇඟිලි අහිමිවීම පිළිබඳව මහත් දුකෙන් සිට අති බැව්ද හෙළිවිය. දකුණු අතේ ඇඟිලි අහිමිවීම නිසා ඔහුට වැඩි වශයෙන් වමතට හුරුවීමටද සිදුවී තිබිණි.

මහාචාර්ය ස්ටීවන්සන් විසින් මෙම දරුවා පිළිබඳව සිදුකළ පුනර්භව පර්යේෂණය (BIRTH DEFECTS OF THE EXTREMITIES) යනුවෙන් වෙනමම අංශයකට ඇතුළත් කර ඇත. උපතින් ඇඟිලි අහිමිව උපත ලැබූ දරුවෙක් එම ඇඟිලි අහිමිවීමට හේතුව පෙර භවයේදී ඇඟිලි කැපීයාම බව අනාවරණය කිරීම අතිශය දුර්ලභ සිදුවීමක් ලෙස පිළිගැනීමට සිදුවිය.

sinhalaebooks.com



**බීබීසී චිත්‍රපටයේ දර්ශනයක්**

පෙරභවය හෙළි කළ දරුවා අනාවරණය කළ එම සිදුවීම ඒ අයුරින්ම සනාථවූ අන්දම මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලියන ලද (REINCARNATION AND BIOLOGY) පර්යේෂණ වාර්තාවට ඇතුළත් කර අත්තේ WHEN HAKUM WAS ABOUT THREE AND HALF YEARS OLD HE PUT HIS HAND INTO A FODDER CHOPPING MACHINE. ON THE DAY OF HIS ACCIDENT HIS FATHER WAS OPERATING THE MACHINE BY HIMSELF. UNDER THESE CIRCUMSTANCES HE DID NOT SEE HIS YOUNG SON APPROACH THE MACHINE AND THRUST HIS RIGHT HAND INTO THE PART WHERE THE BLADES WERE CUTTING. HUKUM'S FINGERS WERE INSTANTLY SEVERED. යනුවෙනි.

sinhalaebooks.com

උපතින් ඇඟිලි අහිමිවූ මෙම දරුවාගේ පුනර්භව සාධකය පිළිබඳව බීබීසී ආයතනයද පර්යේෂණ වාර්තා චිත්‍රපටයක්ද නිපදවීය. පෙර භවයේ මරණය සිදුවී වසර එකහමාරකින් පමණ ලෙක්පාල්ගේ උපත සිදුවී ඇති බැව් එම පර්යේෂණයේදී අනාවරණය වීය. මහාචාර්ය ස්ටීවන්සන් විසින් මෙම දරුවාගේ ඇඟිලි අහිමිවීම සිදුවී ඇති ආකාරය වෛද්‍ය වාර්තා මගින් නිරීක්ෂණය කිරීම සඳහා එක්ස් කිරණ පරීක්ෂණයක්ද සිදු කරනු ලැබීය. එක්ස් කිරණ මගින් සනාථ වූයේ ඔහුගේ ඇඟිලි අහිමිවීම අස්ථි මගින්ද කැපී වෙන්වී තිබූ අයුරු දර්ශනය වන බැවිය.

එම එක්ස් කිරණ වාර්තාවද මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලියන ලද පර්යේෂණ ග්‍රන්ථයකටද ඇතුළත් කර ඇත. 1998 දී බීබීසී ආයතනය නිපදවූ IN SEARCH OF THE DEAD නම් චිත්‍රපටයටද ලෙක්පාල්ගේ කතා පුවත ඇතුළත් කර ඇත.

sinhalaebooks.com

# ඉංගිරියේදී මියගොස් දොඩන්ගොඩදී යළි උපදී

බැලුවෝ - 1619 අදහස් - 0

## පෙර භවයේ ප්‍රබල සාක්කි

**හැත්තෑවේ දශකයේදී මහත් ආන්දෝලනයක් ඇති කළ පුනර්භවය සිදුවීමක් වූයේ දොඩන්ගොඩ ප්‍රදේශයේදී උපත ලැබූ දරුවකු හෙළි කළ පුනර්භවය සාධකයි. එදා එම දරුවා විසින් හෙළි කරනු ලැබුවේ ඉංගිරියේ පදිංචිව සිටි ජයතිස්ස නම් ව්‍යාපාරිකයකුගේ ජීවිත තොරතුරුය. එම පුනර්භව පර්යේෂණයේදී පෙර භවයේ නෑදෑ හිතවතුන් හඳුනා ගැනීම සඳහා හඳුනා ගැනීමේ පෙරට්ටුවක්ද පවත්වනු ලැබීය. එහිදී එම දරුවා විසින් ඉතා සාර්ථක අයුරින් පෙරභව ඥාති හිතවතුන් කීප දෙනෙක්ම නිවැරදිව හඳුනාගනු ලැබීය. එහෙත් මෙම පුනර්භව සාධකය අන් කතාවලට වඩා සුවිශේෂී බවක්ද දක්නට ලැබිණි.**

පුද්ගලයකු මියයෑමෙන් පසු යළි උපතක් සිදුවීමේදී මව් කුස තුළ සිටින මාස නවයක පමණ කාල සීමාවකට පෙර පෙරභවයේ තැනැත්තාගේ මරණය සිදුවිය යුතු යයි සාමාන්‍ය පිළිගැනීමය. එහෙත් මෙම දරුවා හෙළිකළ පෙරභව පුද්ගලයා මරණයට පත්වී තිබුණේ එම දරුවාගේ උපත සිදුවීමෙන් පසුවය. අතිශය දුර්ලභ මෙවැනි සිදුවීම්

sinhalaebooks.com

ඉන්දියාව, බුරුමය සහ තායිලන්තයේ පර්යේෂණ අතරින්ද වාර්තා වී තිබේ. ලොව ප්‍රකට පුනර්භව පර්යේෂකයකු වූ මහාචාර්ය ඉයන් ස්ටීවන්සන්ගේ පර්යේෂණ අතර එවැනි සිදුවීම් රැසක් ඇතුළත් වේ. මහාචාර්ය ස්ටීවන්සන් ඒ පිළිබඳව කරන ලද හැඳින්වීමක්ද පර්යේෂණ වාර්තාවකට ඇතුළත් කර ඇත. එහි සංස්කෘත භාෂාවෙන් හැඳින්වෙන වදනක්ද ඉදිරිපත් කර තිබේ. එය මෙසේය. (පරකායප්‍රවේශ) PARAKAYAPREVESH

THIS SANSKRIT WORD DESIGNATES THE TAKING OVER OF A LIVING BODY, AFTER ITS BIRTH BY A PERSONALITY NOT THE ORIGINAL OWNER OF THE BODY. THE LITERAL TRASNLATION OF THE WORD IS "ENTERING ANOTHER BODY' THE WORD IS USUALLY TRANSLATED BY THE ENGLISH WORD POSSESSION යනුවෙනි. මේ යටතේ අනාවරණය වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම පුනර්භව සාධකය වූයේ දොඩන්ගොඩදී උපත ලද දරුවාගේ කතා පුවතය. අජිත් නම් එම දරුවා උපත ලැබුවේ 1969 දෙසැම්බර් මාසයේදී නාගොඩ රෝහලේදීය. පවුලේ බාලම දරුවා ලෙස උපත ලද එම දරුවා වයස අවුරුදු එකහමාරක් වන විට බහ තෝරන වියට පත්විය. දෙවසර පිරීමත් සමඟ අජිත්ට ඉතා හොඳින් කතා කිරීමට හැකියාව ලැබිණි. දිනක් නිවෙසට ගෙනා එළවළු වර්ග කීපයක් අතර තිබූ කැරට් ගෙඩි කීපයක් දුටු දරුවා ඒ දෙස බලා

sinhalaebooks.com



“අපේ ගෙදරට නම් කැරට් ගේන්නේ ගෝනි ගණන්” යයි කීය. මව ඒ වදන පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකළාය. නැවතත් මව ඇමතූ දරුවා ‘මගේ කඩේට කැරට් ෙගෝනි ගෙනාවාම වැඩ කරන කොල්ලෝ ලිහාගෙන කනවා’ යයි පැවසීය. එම වදනින් දරුවාගේ මව මවිතයට පත්වූවාය. කැරට් ගෝනිමගින් ගෙන එන දර්ශනයක් ඒ වන විට ඔහු කිසි දිනෙක දැක නොතිබීම එයට හේතුව විය.

“ඔයාගෙ කඩේ තියෙන්නේ කොහේද?’ පුංචි ප්‍රශ්නයක් සිය පුතුට ඉදිරිපත් කළාය. එයට ක්ෂණයෙන් පිළිතුරු දුන් දරුවා,

”ඉංගිරියේ” යයි එක්වරම කීය. අජිත් කිසියම් පෙරභවයක තොරතුරු හෙළිකරන බැව් දෙමාපියන්ට අවබෝධ විය. එහෙත් ඒ පිළිබඳ වැඩිදුර විමසීමට මාපියෝ උත්සාහ නොකළහ.


sinhalaebooks.com

එහෙත් අජිත් සිය පෙරභවයේ මතක සටහන් වරින් වර හෙළිකරන්නට උත්සාහ කළේය.

'අපේ ඒ ගෙදර මීට වැඩිය ලොකුයි. ගේ ඉස්සරහ බෙලි ගහක් තියෙනවා. එහිදී නෑවෙ ඔළුව අල්ලලා. ආදී වශයෙන් පෙර මතක සටහන් ඔහු අනාවරණය කළේය. ඒ සමඟම 'එහෙදි කාර් එක ඇන්දේ හැපුණා' යනුවෙන්ද ඔහු ප්‍රකාශ කළේය.

පෙරභවය හෙළි කරන මෙම දරුවාගේ පුනර්භව පර්ෙයේෂණ සඳහා අප ඔහු හමුවන විට ඒ පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදුවී නොතිබිණි. ඒ වනවිට අජිත්ට වයස අවුරුදු පහක් පමණ වූ අතර ඔහුට පෙරභවය පිළිබඳ ඉතා හොඳ මතකයන් තිබිණි.

sinhalaebooks.com



"ඔයා ඉස්සර හිටියේ කොහේද?" යයි අප එදා එම දරුවාගෙන් විමසූවිට ඔහු පෙරභවයේ සිදුවීම් එකින් එක විස්තර කරන්නට වූයේ පුදුමාකාර ලෙසටය. ඔහු හෙළි කළ තොරතුරු අතර පෙරභවයේදී විවාහකයකු බවත් දරුවන් සහ බිරිඳ පිළිබඳවත් අනාවරණය කළේය. "මගේ නෝනයි දරුවොයි හිටියා. මම එදා කාර් එක එළවාගෙන යන කොට කාර් එක ඇන්දෙ හැපිලා වතුරට වැටුණා" යයිද කීය

"කාර් එක හැපුණාම මාව ඉස්පිරිතාලෙ ගෙන ගියා" යනුවෙන්ද පැවසූ ඔහු කාරයේ තවත් අයකු සිටි බැව්ද පැවසුවේ ඒ පිළිබඳව පැහැදිලි පිළිතුරු නොදෙමිනි. පෙර භවයේ නමද ඔහු අනාවරණය කළේ අප ඒ පිළිබඳව විමසීමක් කළ විට දී ය.

sinhalaebooks.com

"ඔයාගෙ ඉස්සර නම මොකක්ද?" යයි අප විමසූ විට 'ජයතිස්ස' යි එම දරුවා පිළිතුරු දුන්නේය. ඒ අනුව ඔහු හෙළිකළ පෙරභවයේ නිවෙසත් නෑදෑ පිරිසත් හමුවීමට එම දරුවාට එදා අවස්ථාව ලැබිණි.

අජිත්ගේ මෙම පුනර්භව පර්යේෂණ සඳහා මහාචාර්ය ස්ටීවන්සන්ද ශ්‍රී ලංකාවට පැමිණියේය. හොරණ තානායම් පොළේදී අජිත්ට පෙර නෑදෑ පිරිස හඳුනාගැනීමේ පෙරට්ටුවකටද සහභාගීවීමට හැකි විය. එහිදී පෙරභවයේ ජයතිස්ස මහතා ඇසුරු කළ නෑදෑ හිතවතුන් කීප දෙනෙක්ම කුඩා අජිත් විසින් හඳුනාගනු ලැබීය. ඔහු අනාවරණය කළ පෙරභවයේ තොරතුරු අනුව සනාථ වූයේ ඉංගිරියේ ව්‍යාපාරිකයකු ලෙස ජීවත්ව හිටි ජයතිස්ස නම් අයෙකුගේ ජීවිතය පිළිබඳ එම දරුවා අනාවරණය කළ බවය. ජයතිස්ස මහතා මියගොස් තිබුණේ ඔහු පදවාගෙන ගිය මෝටර් රථය ඉංගිරිය පාලමේ ඇන්දේ වැදී දියට වැටීම නිසාය. ඔහු සමඟ ගමන්ගත් සේවිකාවක්ද එම අනතුරෙන් මරණයට පත්වී තිබිණි. ජයතිස්ස මහතාගේ දූ දරුවෝ සහ ඥාතීන්ද එදා මෙම පුනර්භව පර්යේෂණයට සහභාගී වූහ. අජිත් විසින් හෙළි කරන ලද සියලු තොරතුරු සත්‍ය බව එදා සනාථ විය.

sinhalaebooks.com

එහෙත් මෙම පුනර්භව පර්යේෂණයේදී මතුවූ ගැටලුවක් වූයේ ජයතිස්ස මහතාගේ මරණය සිදුවී ඇත්තේ පෙරභවය හෙළි කළ අජිත් ගේ උපත සිදුවී මාස දෙකහමාරකට පමණ පසුවය වීමය. ජයතිස්ස මහතාගේ මරණය සිදුවූයේ 1970 මාර්තු මාසයේදීය. අජිත් උපත ලැබුවේ 1969 දෙසැම්බර් 22 වනදා ය. අජිත් විසින් හෙළි කළ පෙරභව කරුණු සනාථ වීමේදී ඔහු පැවසූ පරිදි ඔහු පදිංචිව සිටි නිවෙස අජිත්ගේ නිවසට වඩා ප්‍රමාණයෙන් විශාල නිවෙසක් විය. නිවස ඉදිරිපිට බෙලි ගසක් සහ කොළ පාට ගේට්ටුවක් තිබිණි. 'ඔළුව අල්ලා නානවා' යනුවෙන් කළ ප්‍රකාශය එම නිවෙසේ ජලය ලබාගැනීම ජල කරාම මඟින් සිදු කර තිබීම නිසා ස්නානය කිරීම සිදුවී තිබුණේ නාන කාමර තුළ ජල කරාමයකිනි. අජිත් පැවසූ පරිදි පෙරභවයේ ඔහු විවාහක දරුවන් සය දෙනෙකුගේ පියෙකි. ඔහු ව්‍යාපාරිකයකු වූ අතර කඩ කීපයක හිමිකරුවෙකු ද විය.

ජයතිස්ස මහතා ඇසුරු කළ පුද්ගලයන් හඳුනාගැනීම සඳහා පවත්වන ලද හඳුනාගැනීමේ පෙරට්ටුවේදී ඔහු ඇසුරු කළ භික්ෂූන් වහන්සේ නමක්ද නිවැරදිව හඳුනාගැනීමට හැකිවූයේ අතිශය පුදුම අයුරිනි. එම භික්ෂූන් වහන්සේ දුටු විගස එම හිමියන්ගේ නමද අජිත් නිවැරදිව ප්‍රකාශ කළේ පෙරභව ඥාතීන් පුදුමයට පත් කරවමිනි.

sinhalaebooks.com

පුනර්භව සිදුවීම් අතර උපත හා මරණය අතර ගැටලු සිදුවී මතුවූ ඉන්දියාවේ සිදුවීම් කීපයක් ද ඇත. මහාචාර්ය ස්ටීවන්සන්ගේ පර්යේෂණ ග්‍රන්ථයක්වූ (SEVEN CASES SUGGESTIVE OF REINCARNATION IN INDIA) නම් ග්‍රන්ථයේ ඇතුළත් එක් සිදුවීමක පෙරභවයේ තැනැත්තා මරණයට පත්වී ඇත්තේ පෙරභවය හෙළි කළ දරුවා උපත ලබා වසර තුනහමාරකට පසුවය.



ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ ජීවත්ව සිටි ජස්බීර් නම් එම දරුවා වයස අවුරුදු තුන හමාරේදී වසූරිය රෝගයෙන් මරණයට පත්විය. මියගිය දරුවාගේ සිරුර භූමිදානය සඳහා ඔහුගේ පියා ඇතුළු ඥාතීහු කටයුතු පිළියෙළ කරමින් සිටියහ. එහිදී පියාට දක්නට ලැබුණේ මියගොස් සිටි දරුවාගේ සිරුර චලනයවීමකි. වහාම භූමිදාන කටයුතු නතර කැරිණි. යළිත් ප්‍රාණය ලැබූ සිරුර ස්වසන ක්‍රියාවලිය ආරම්භ කර තිබිණි. අනතුරුව ඔහුට

sinhalaebooks.com

කතා කිරීමට හැකි විය. ඔහු ප්‍රකාශ කළේ වෙනත් ගමක් වූ 'වේගේදී' නම් ප්‍රදේශයේ පදිංචිව සිටි පුද්ගලයෙකුගේ තොරතුරුය. ඔහු ඉතා උසස් කුලයක අයකු බැව් හෙළිකළ දරුවා ආහාර පාන පවා වෙනස් අයුරින් ඉල්ලා සිටියේය. ඒ සමඟම පෙරභවයේ තොරතුරු හෙළි කරමින් එහිදී ගත් ආහාර වර්ගයක් විසවීමෙන් පසු මරණය සිදුවූ බව කීය. මංගල උත්සවයකට ගොස් එන අතරතුර ඔහු ගමන් ගත් කරත්තයෙන් වැටුණු බැව්ද එම දරුවා කීය. ඒ පිළිබඳව සිදු කළ විමර්ශනයේදී පෙර භවයේ තැනැත්තාගේ නම්ද පැහැදිලිව අනාවරණය කිරීමට එම දරුවාට හැකිවූ බවද දක්නට ලැබිණි. ඔහු විසින් හෙළි කරනු ලැබුවේ විසි දෙහැවිරිදි වියේ පසුවූ සොබාරම් නම් තරුණයකුගේ ජීවිත තොරතුරුය. සොබාරම්ගේ මරණය සිදුවූයේ 1954 මැයි මාසයේදීය. ඒ වනවිට ජස්බීර් අවුරුදු තුනහමාරක දරුවකුව සිටියේය. සොබාරම් තරුණයා මියයෑමට හේතු වූයේ මංගල උත්සවයකදී ගත් ආහාර වර්ගයක් වසවීම නිසාය. ඔහු පැවසූ පරිදි එදින ගමන්ගත් කරත්තයෙන් වැටීමද සිදුවී තිබිණි.

පෙරභවයේ නිවෙස සහ පුද්ගලයා පිළිබඳව හෙළිවීමෙන් පසු එම දරුවාට පෙරභව ඥාතීන් හඳුනාගැනීමට ද අවස්ථාව ලබාදුන්නේය. එහිදී මාපියන් ඇතුළු ඥාතීන් කීප දෙනෙක්ම ඔහු නිවැරදිව හඳුනාගැනීමද විශේෂත්වයක් විය. මෙහිදී සනාථ වූයේ ජස්බීරගේ වයස අවුරුදු තුනහමාරක සිරුරට සොබාරම් ඇතුළු වී යළි

sinhalaebooks.com

උපත සිදුවී ඇති බවය. මහාචාර්ය ස්ටීවන්සන්ගේ පර්යේෂණ වාර්තාවේ ජස්බීර්ගේ අධිමානසික තත්ත්වය පිළිබඳව සඳහන් කර ඇත. (COMMENTS ON THE EXIDENCE OF PARANORMAL KNOWLEDGE ON THE PART OF JASBIR යනුවෙන් ඔහුගේ හඳුනා ගැනීම් පිළිබඳව හැඳින්වීමක් කර තිබේ. එහි මෙම පුනර්භව සාධකයේ සනාථවීම දක්වා ඇත්තේ (THAT JASBIR HAD DETAILED KNOWLEDGE OF THE LIFE AND DEATH OF SOBHARAM SEEMS ENTIRELY CLEAR FROM THE LIST OF THE STATEMENTS HE MADE AND RECOGNITIONS HE ACHIEVED) යනුවෙනි.

ඉන්දියාවෙන් හෙළිවූ තවත් පුනර්භව සාධකයක් අනුව චිපානි දිස්ත්‍රික්කයේ පදිංචිව සිටි 'මුන්නා' නම් පාසල් දරුවකු ඛේදජනක ලෙස මරා දමනු ලැබීය. මළ සිරුර ලඳු කැලෑවක තිබී මාපියන් විසින් සොයාගනු ලැබුවේ දෙදිනකට පසුවය. එය සිදුවූයේ 1957 ජනවාරි 19 වැනිදාය. මාපියන් සමඟ පැවති දේපළ ආරවුලක් නිසා පුද්ගලයන් දෙදෙනකු විසින් එම දරුවා ඝාතනය කළ බැව් සනාථ විය. එහෙත් ඇසින් දුටු සාක්ෂි නොමැතිවීමෙන් මිනීමරුවෝ නිදහස් වූහ. පවුලේ එකම දරුවා වූ මුන්නාට සිදුවූ ශෝකජනක සිදුවීම නිසා මාපියෝ අතිශය කම්පාවට පත්ව සිටියහ. මුන්නා මරණයට පත්වී මාස හයක් ගතවිණි. 1951 ජූලි මසදී වෙනත් දිස්ත්‍රික්කයක උපත ලද රවි නම් දරුවෙක් බහ තෝරන වියට පැමිණ පෙරභව තොරතුරු අනාවරණය කළේය.

sinhalaebooks.com

පුද්ගලයන් දෙදෙනකු විසින් ඔහු මරා දැමුණු බවත් ඔවුන්ගේ නම් සිය මතකයේ ඇති බැව් ඔහු හෙළි කළේය. මිනීමරුවන්ගේ නම් අනාවරණය කිරීම මෙම දරුවා හෙළි කළ තොරතුරු අතර විශේෂත්වයක් විය. මුන්නා හෙළි කළ පෙරභව කරුණු විමර්ශනය කිරීම පුනර්භව පර්යේෂකයන්ට ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳ පූර්ණ පර්යේෂණයක් සිදු කෙරිණි. එහිදී පෙර භවයේ මිනීමැරුම සිදු කළ ස්ථානය පවා නිවැරදිව පෙන්වා දීමට එදා එම දරුවාට හැකිවිය. මුන්නා මරා දමන අවස්ථාවේ ඔහුගේ ගෙල කැපීම නිසා සිදුවූ තුවාලය උපන් ලපයක් ලෙස රවිගේ සිරුරේ දක්නට ලැබීමද සුවිශේෂී සිදුවීමක් මෙන්ම පෙර භවය පිළිබඳ ප්‍රබල සාක්ෂියක්ද විය. මෙම පුනර්භව සාධකය මඟින් සනාථ වූයේ 1951 ජනවාරි 19 වැනිදා මරුමුවට පත්වූ මුන්නා ඒ වන විට මව් කුසක් තුළ වැඩෙමින් මාස හයක්ව සිටි සිරුරකට ඇතුළත් වී රවි නමින් යළි උපත ලබා ඇති බවය.

# අම්පිටියේ සුදු නාගයෙකු වී සිට මාතර ඉපදුනු දරුවාගේ පුනර්භවය




පුනර්භව පර්යේෂණවලදී සත්ත්ව ජිවිත ගතකල බැව් අනාවරණය කළ දරුවන් දුර්ලභය. ඇමරිකාවේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ පුනර්භව පර්යේෂණ අංශයේ ඇති පුනර්භව සාධක තුන්දහස් පන්සියයක් පමණ අතරද එවැනි සිදුවීම් ඇත්තේ සියයට එකක පමණ ප්‍රමාණයකි.

ශ්‍රී ලංකාවේ පුනර්භව පර්යේෂණ හාරසීයක් පමණ ප්‍රමාණයකින් සත්ත්ව ජීවිත ගතකල බැව් අනාවරණය වුයේ දරුවන් සිව්දෙනෙකුගේ පමණි. ශ්‍රී ලංකාවෙන් හෙළි වූ එවැනි පුනර්භව සාධක අතර භාවකු, කුරුල්ලෙකු, වඳුරෙකු සහ එළුවකුගේ ජීවිත තොරතුරු හෙළි කළ දරුවන් සිව්දෙනෙකු සිටිති.

නාගයකු ලෙස ජීවත්ව සිටි බැව් හෙළි කළ දරුවකු පිළිබඳව පසුගියදා මාතර ප්‍රදේශයෙන් අනාවරණය විය. නාගයකුගේ ජිවන තොරතුරු හෙළි කළ ඒම දරුවා පෙරභවය පිලිබඳ මතකය අවදි කර ඇත්තේ වයස අවුරුදු හතරේ පමණ සිටය. දරුවා අනාවරණය කළ එම තොරතුරු දෙමාපියෝ කිසිම අවධානයකට යොමු නොකළහ.

ඇතැම් විට එම දරුවා, පෙරභවයේ නාග ජීවිතය ගැන හෙළි කරන ඇතැම් අවස්ථාවලදී සිහි නැති වන තත්ත්වයන්ද දෙමාපියන්ට දක්නට ලැබුණි. දැනට දසවන වියේ පසුවන වම දරුවා දිගින් දිගටම නාග ජීවිතය ගැන හෙළි කරමින් තමන් සිටි ස්ථානයත් ප්‍රදේශයත් නිවැරදිව ප්‍රකාශ කර ඇත. මේ නිසා දෙමාපියෝ එම දරුවාගේ තොරතුරු පිළිබඳව සොයා බැලීමක් සිදු කළහ.

එහිදී දරුවාගේ ප්‍රකාශ සනාථ කරමින් මියගිය නාගයකු පිළිබඳව සොයාගැනීමට දෙමාපියන්ට අවස්ථාව උදාවී තිබේ. ඒ අනුව නගය මියගිය ස්ථානයත් ජීවත්ව සිටි පුජනීය ස්ථානයත් සොයා යාමටද එම දරුවාට පසුගියදා අවස්ථාව ලැබිණි. අතිශය පුදුම උපදවන එම පුනර්භව සාධකය පිලිබඳ කරන ලද විමර්ශනයක් මෙම ලිපියෙන් අනාවරණය කෙරේ.

නාග ජීවිතය හෙළි කළ එම දරුවා ප්‍රකාශ කර ඇත්තේ මුගටියෙකුගේ පහර දීමක් නිසා මරණයට පත්වූ බවය. පෙර භවය හෙළි කරන අවස්ථාවලදී තම හිසට දැඩි වේදනාවක් දැනෙන බවත් ඇතැම්විට සිරුර අප්‍රාණික වන බවත් එම දරුවා ප්‍රකාශ කර තිබේ.

පවුලේ එකම දරුවා ලෙස උපත ලැබූ පුත්‍රයාට දිනුෂ යනුවෙන් දෙමාපියෝ නම් තැබුහ. දිනුෂ උපත ලැබුවේ 2002 වසරේ මාර්තු මාසයේදී ගාල්ල මහා රෝහලේදීය. හරියටම මාස නාමයක් සම්පූර්ණ වී මෙලොවට බිහි වූ එකම දරුවා උපතින්ම නිරෝගිමත් දරුවෙකු විය. ඉපදී දින ගනනක් ඇතුලත එම දරුවා තුලින් මවට දක්නට ලැබුණු විශේෂත්වයක් විය.

එනම් තිගැස්සී අවදි වී දෙතොල් මුමුණන බවයි. සිගිති දරුවෝ ඇතැම් විට සිදු කරන සාමාන්‍ය ක්‍රියාවකට වෙනස් ගති සිරිතක් ලෙස මවට මෙය දැනෙන්නට විය දෙතොල් මුමුණ කිසියම් දෙයක් ප්‍රකාශ කිරීමට දරුවා උත්සහ ගන්න බවක්ද මවට දක්නට ලැබිණි.

මාස පහක් පමණ ගතවිය . දිනක් තම සිගිති පුත්‍රයා නැවීමට මව ඔහු ජාල බේසමක තැබිය. එකවරම දෙපා හකුලාගත් සිගිති දරුවා " වැඩගන්න " "වැඩගන්න " යයි ප්‍රකාශ කළේය. මාස පහක් දරුවෙක් ලෙස සිටි තම පුත්‍රයා පැහැදිලිවම එම වචන උච්චාරණය කිරීම ගැන මව පුදුමයට පත් උවුවය . තවත් මාස කිහිපයක් ගතවිය.

අන් දරුවන්ට වඩා ඉක්මනින් කතා කිරීමේ හැකියාව මේ දරුවාට ලැබිණි. කිසියම් උරග සතකු දුටු විගස උ පසුපසින් දිව යාමටද මෙම දරුවා උනන්දු වන බවක්ද මව දුටුවාය. ඇතැම් විට භික්ෂුන් වහන්සේ නමක් දුටු විගස උන්වහන්සේලා පිටුපස යාමටත් ඔහු උනන්දුවන්නට විය. දරුවාගේ මෙම හැසිරී රටාව පිලිබදව මව එතරම් අවදානයක් යොමු නොකළාය.

කුඩා කෘමියකු පවා මරණයට පත්වීම මෙම දරුවා මහත් දුකට පත් වීමේ සිදුවීමක් ලෙසද මව දුටුවාය. කිසිදු සත්ත්වයකුට පහර දීමට හෝ දුටු විගස සතුන්ට ගහන්න එපා යැයි ඔහුගේ මුවින් පිටවන්නට විය. තම දරුවා සතුන්ට ඉමහත් ආදරයක් දක්වන බවද ඉතා කුඩාකල සිටම ඔහු තුලත් දක්නට කබුනු තවත් සුවිශේෂී ගති සිරිතක් වී තිබිණි.

මේ අතර දිනක් මව ඇමතූ සිඟිති දරුවා
"මම එහෙදි හිටියේ නයෙක් වෙලා. මම කිසිම
සතෙක්ව මැරුවේ නෑ. ටයි පැවසිය. තම පුත්‍රයාගේ
මෙම ප්‍රකාශය පිළිබඳව ඇය සිය සැමියාට ද හෙළි
කළේය. එහෙත් පිය ඒ පිළිබඳව කිසිඳු අවධානයක්
නොකළේය. කුඩා දරුවන්ගේ සුරඟන කතාවක් ලෙස
තම පුත්‍රයා මඟින්ද හෙළි වන්නේ යැයි ඔහු පැවසිය.

"මම ඉස්සර හිටියේ "ගැට" කියන පැත්තේ යයිද තවත්
දිනක් ඔහු කිවේය. ගැට ගැට යනිවෙන් පැවසු
පුත්‍රයාගෙන් මව ඒ පිළිබඳව විමසුවාය.
"මට මතක එච්චරයි, යනුවෙන් දරුවාගේ පිළිතුර විය.
ඒ වන විට තුන් හැවිරිදි වියේ පසුවූ දරුවා පුජනිය
ස්ථානයක තොරතුරුද වරින් වර හෙළි කරන්නට විය.
"මම හිටපු පන්සලට යන්න ඕනෑ. එහිදී මට මුගටියෙක්
ගැහැව්වා. යැයි ද තවත් දිනක් ඔහු කියා සිටියේය.
අනුරාධපුරයට යන්න ඕනෑ. යනුවෙන්ද තවත් දිනක්
දරුවා ප්‍රකාශ කළේය.

ඔහු හිටි ප්‍රදේශය ලෙස ගැට යනුවෙන් ප්‍රකාශ කිරීම
නිසා ගැට යන අකුරු මුලට එන ගම් ප්‍රදේශ පිළිබඳව
මව විමසීමෙන් සිටියාය. එහිදී මාව මැරුණම මගේ
සිරුර මම හිටපු පන්සලේ වත්තේ භූමිදාන කළා
යනුවෙන්ද දරුවා ප්‍රකාශ කළේය. තවත් සති කීපයක්
ගතවිය. 'ගැට' කියමින් සිටි දරුවා 'ගැටමාන්න' යැයි
දිනක් පැවසිය.

ගැටමාන්න පන්සලට මම යනවා.එහිදී මම සුදු
නාගයෙක් යැයිද ඔහු පැවසිය. තමදරුවගේ ප්‍රකාශ
පිළිබඳව සොයා බැලීමට මාව උනන්දු වුවද පියා එයට
එතරම් උනන්දුවක් නොදැක්විය.

ඇතැම්විට ප්‍රකාශ කරන අවස්ථාවලදී ඔහුට දැඩි හිසේ වේදනාවක් ඇතිවන බව දරුවා ප්‍රකාශ කළේය. ඇතැම් විට ඔහුට එම අවස්ථාවලදී සිහි නැතිවන තරම් තත්ත්වයක්ද දක්නට කබිනි. මේ නිසා දරුවාට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමටද දෙමාපියෝ උනන්දු වූහ. නිතර නිතර සිහි නැති වීමත් හිසේ ඇතිවන අධික වේදනාව පිලිබඳ දරුවා හෙළි කරන බව දෙමාපියෝ වෛද්‍ය අංශවලට ප්‍රකාශ කළහ. එහෙත් වෛද්‍ය අංශවලින්ද ඒ පිලිබඳ පැහැදිලි පිළිතුරක් නොලැබිණි.

තවත් වසරක් පමණ ගතවිය. දරුවා පාසල් යාමද ආරම්භ කලේය. ඔහුගේ එකම ඉල්ලීම වුයේ ඔහු පෙර භවයේ නයකු ලෙස සිටි ප්‍රදේශයට කැඳවාගෙන යන ලෙසය. එම පූජනීය ස්ථානයට ගොස් පූජාවක් පැවැත්විය යුතු බවද ඔහු කියා සිටියේය. "සමහර වෙලාවට කව්ද ඇවිත් කතා කරනවා.

ඉස්කෝලේ යන්න පුළුවන්නන් නම් හිටපු තැනට යන්න බැරිද කියල අහනවා වගේ මට දැනෙනවා." යැයිද එම දරුවා කීප විටක්ම මව සමඟ කිවේය. දරුවා ප්‍රකාශ කල කරුණු අනුව එවැනි ගම ප්‍රදේශයක සිදුවූ නාගයකුගේ මරණයක් පිළිබඳව සොයාබැලීමක් කිරීමට මව සිතුවාය.

ඒ අනුව දරුවාගේ ප්‍රකාශය පරිදි ඔහු ඒ ප්‍රදේශයට රැගෙන යාමට මව සිතුවාය. පිය එතරම් කැමැත්තක් නොදැක්වුවද දරුවාගේ ඉල්ලීම පරිදි පෙර සිටි බව හෙළි කල ගැටමාන්න ප්‍රදේශයට දරුවා රැගෙන යාමට මව තීරණය කළාය. ඒ වන විට පුංචි දිනුෂ කල ප්‍රකාශ වලට ඇතුලත්ව තිබු කරුණු අනුව සුදු නාගයකු ලෙස ජීවත්ව සිටි බවත් එහිදී සිටි පූජනීය ස්ථානය ඉතා පැරණි බවත් අනාවරණය විය.

ඒ අනුව පුංචි දිනුෂට පසුගිය දිනක ඔහු ජීවත්ව සිටි බව හෙළි කල පූජනීය ස්ථනය වෙත යාමට අවස්ථාව ලැබිණි. එහිදී නාග ජීවිතය ගතකල ස්ථානයේ ගසක තිබු බෙනයක්ද පෙන්වා දීමට එම දරුවාට හැකිවී තිබේ.

පුංචි දිනුෂ හෙළි කල තොරතුරු වලට සමාන වී ඇත්තේ මිට වසර දහයකට උඩදී ගැටමාන්න විහාර ස්ථානය අවට ජිවත් වූ නාගයකු පිලිබඳවය. නගය ජීවත්ව සිටි ගස් බෙනය දත් දක්නට ඇති අතර මියගොස් සිටි නාගයාගේ සිරුර ප්‍රදේශවාසීන් දැක ඇත්තේ ගස් බෙනය තුලින් හිස පිටතට එන අයුරින් සිටියදීය. දරුවා ප්‍රකාශ කල පරිදි එම නාග සිරුර පුජනීය ස්ථානයට රැගෙන ගොස් ආගමික වතාවත් පවා සිදුකිරීමෙන් පසු අවසන් කටයුතු කර ඇත. අතිශය පුදුම අයුරින් නාග ජීවිතය හෙළි කල දරුවාගේ දෙමාපියන්ගෙන් සහ ප්‍රදේශ වාසින්ගෙන්ද පුජනීය ස්ථානයේ සංඝයා වහන්සේගෙනුත් තොරතුරු විමසීමට අපට අවස්ථාව ලැබිණි.

එහිදී අප මුලින්ම හමුවුයේ දරුවාගේ මවය. මෙම දරුවාගේ තොරතුරු තවමත් ප්‍රසිද්ධියකින් තොරව තබා ගැනීමට දෙමාපියෝ කැමතිය. එහෙත් පර්යේෂණ සිදුකිරීම සඳහා කරුණු හෙළි කිරීමට ඔවුහු කැමැත්ත පල කළහ. ඒ අනුව මව සමඟ කල සම්මුඛ සාකච්චා ඒ අයුරින්ම මෙහි සඳහන් කල හැකිය. ඇයට ඉදිරිපත් කල ප්‍රශ්නයත් ඇය දුන් පිලිතුරුත් මෙසේය.

ප්‍රශ්නය : ඔබේ දරුවා පෙර භවයක් ගැන තොරතුරු අනාවරණය කලේ කුමන වයසේ සිටියදීද?
පිළිතුර : වයස අවුරුදු තුනේදී පමණ.
ප්‍රශ්නය : පෙර භාවයේදී ඔහු සිටියේ කෙසේද කියා හෙළි කළේද?
පිළිතුර : නාගයකු ලෙස සිටි බැව් කිවා.
ප්‍රශ්නය : එය ප්‍රකාශ කලේ කෙසේද?
පිළිතුර : මම සුදු නාගයෙක් වෙලා හිටියා යයි ප්‍රකාශ කළා
ප්‍රශ්නය : එය පැවසුවේ කෙසේද?
පිළිතුර : "ෂු" "ෂු" යනුවෙන් හඬ නැගීමක් ඔහු පුරුදුව සිටියා.
ප්‍රශ්නය : "ෂු" "ෂු" යන හඬ නගමින් ඔහු කිසියන් ක්‍රියාවක් කළාද?
පිළිතුර : නෑ ක්‍රියාවක් කලේ නෑ. නමුත් නය වෙලා හිඳිද්දී මෙහෙමයි කියා ඒ හඬ නිකුත් කළා.
ප්‍රශ්නය : නයෙකු මෙන් කරන විලාශයක් නිරූපනය කළාද?
පිළිතුර : නෑ
ප්‍රශ්නය : නයෙකු ලෙස සිටි බැව් හෙළි කළා අනෙකුත් කරුණු මොනවාද?
පිළිතුර : කිසිම කෙනෙකුට අනතුරක් කලේ නෑ කියා කිවා.
ප්‍රශ්නය : ආහාරයට ගත් දේවල් එහෙම කීවාද?
පිළිතුර : පුජ භූමියේදී පලතුරු කෑවා යැයි කිවා.
ප්‍රශ්නය : පුජා භූමිය ගැන හෙළි කලේ කෙසේද?
පිළිතුර : පන්සලේ ගස් බෙනයක සිටි බැව් කිවා.
ප්‍රශ්නය : එහිදී කුමක් සිදුවුයේ යැයි හෙලි කළාද?
පිළිතුර : ඔව්. මුගටියෙක් හිසට පහර දුන් බව කිවා.
ප්‍රශ්නය : මැරුණ බැව් කීවාද?
පිළිතුර : ඔව්.
ප්‍රශ්නය : නාගයා ලෙස සිටි ස්ථාන වල නම් ප්‍රකාශ කළාද?
පිළිතුර : ගැටමාන්න පන්සල අසල අම්පිටිය පුජා භූමිය යැයි කිවා.
ප්‍රශ්නය : මරණින් පසු සිදුවීම් හෙළි කළාද?
පිළිතුර : ඔව්. සිරුරට සිදුකල ආගමික වතාවත් ගැනත් කිවා.

ප්‍රශ්නය : එය සිදුකල ස්ථානය ගැන කීවාද?
පිළිතුර : ඔව්. පුජා භූමිය යන වචනය කිවා. එතනට ගිහින් පුජාවක් තියන්න ඕනෑ යැයිද කිවා.
ප්‍රශ්නය : දරුවා රැගෙන ගිය දිනයේ සිදුවූයේ කුමක්ද?
පිළිතුර : නාගයා සිටියා ගස් බෙනය නිවැරදිව පෙන්වා දුන්නා. ජීවත්ව සිටි පුජනීය ස්ථානයත් නිවැරදිව හඳුනා ගත්තා.
ප්‍රශ්නය : දරුවා කළා ප්‍රකාශත් නාගයාගේ ජීවිතයත් පිළිබඳව ඔබ සිතන්නේ කුමක්ද?
පිළිතුර : දෙමාපියන් වශයෙන් අපවත් එම ප්‍රදේශය ගැනවත් එවැනි නාගයකු සිටි බවත් හෝ දන්නේ නෑ. එසේ තිබියදී මේ කුඩා දරුවා එම තොරතුරු නිවැරදිව හෙළිකළේ කෙසේද යන්න අපටත් ප්‍රශ්නයක්. සියල්ල සත්‍ය වුණා.
ප්‍රශ්නය : සත්‍ය වූ බැව් ඔබලාට පැහැදිලි වුයේ කෙසේද?
පිළිතුර : නාගයාගේ සිරුර අවසන් කටයුතු සිදුකල අයුරු දුටු සාක්කිත් අපට ලැබුණා. ඒ තොරතුරු සත්‍ය ලෙස ඔප්පු වුණා.

සුදු නාගයා ජීවත්ව සිටියදී අම්පිටිය ප්‍රදේශයටත් ගැටමාන්න විහාරස්ථානයටත් මෙම නාගයා නිතර පැමිණ තිබේ. එම නාගයා ජීවත්ව සිටියදී ගයමන්න විහාර ස්ථානයට පැමිණෙන බැව් එහි ප්‍රදේශවාසියෝ සාක්ෂි දරති. එම නාගයා මියගොස් සිටි අයුරු සිය ඇසින් දුටු ගම්වාසීන් කිහිප දෙනෙක්වද හම්වීමට අපට අවස්ථාව ලැබිණි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන ගාමිණී සමරවික්‍රම මහතාද එම නාග සිරුර දුටු එක් අයෙකි. ඒ මෑත තම දුටු නාගයා පිළිබඳව අප සමඟ අදහස් ප්‍රකාශ කලේ මෙලෙසිනි.

සුදු නාගයෙක් එම ප්‍රදේශයේ සිටියා. එම නාගයා ජීවත්ව සිටියේ අම්පිටිය පූජා භූමියේ ගස් බෙනයකයි. ආදී 4 1/2 ක් පමණ දිග සුදු නාගයෙක්., අම්පිටිය නාග රාජයා කියලත් හැඳින්වුව. දවසක් ඒ නාගයා ගස් බෙනයෙන් හිස එලියට දමාගෙන සිටි අයුරින් මියගොස් සිටියා. ගැටමාන්න විහාරස්ථානයටත් යන නිසා අපි එහි නායක හිමියන්ට ඒ බැව් දැනුම් දුන්නා. පසුව ඒ හිමියන්ගේ උපදෙස් පරිදි නාගයාගේ සිරුර බෙනය තුලින් ඉවතට ගෙන ආගමික වතාවත් සිදුකළා. එදා ඒ සිදුවීම බලන්නත් නාගයාට ගෞරව කරන්නත් ගම්වාසීන් විශාල පිරිසක් පූජා භූමියට රැස්ව සිටියා යැයි පැවසිය.

නාගයාගේ අවසන් කටයුතු සිදුකළා අවදියේ පුරාණ විහාරයේ සිටි තවමත් එහි වැඩවසන අකුරුගොඩ පඤ්ඤාසේකර හිමියෝද අම්පිටියේ පියතිලක මහතාද මෙම නාගයා පිලිබඳ තොරතුරු අනාවරණය කළහ. එදා නාගයා ගස් බෙනය තුලින් පිටතට ගත් අවස්ථාවේ හිස පෙදෙසේ සිරීම් තුවාල දක්නට ලැබුණා. සිරුරේ නම් තුවාල දුටුවේ නෑ. යැයි පියතිලක මහතා අනාවරණය කළේය.
මෙම දරුවාගේ පුනර්භව සාධකය පිළිබඳව සිදුකළ විමර්ශනයේදී නාගයා සිටි ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමට එම දරුවාට හැකිවී තිබේ. නාගයා සිටි අම්පිටිය පූජා භූමියත් ගැටමාන්න විහාරස්ථානයත් නිවැරදිව හඳුනා ගැනීමට දරුවාට හැකිවී තිබේ. නාගයා පිළිබඳව සිදුකළ ආගමික වතාවත්ද නිවැරදිව මෙම දරුවා හෙළි කර තිබේ.

ගැටමාන්න විහාරස්ථානයත් අම්පිටිය පූජා භූමියත් අතර දුර ප්‍රමාණය හරියටම කිලෝ මීටර් එකකි. එම දුර ගෙවා නාගයා එම ස්ථාන දෙකටම පැමිණීමද නිතර සිදුවී තිබේ. දරුවා ප්‍රකාශ කරනුයේ නාග ජීවිතය අවසන් වුයේ මුගටි ප්‍රහාරයකින් බවය. නාග සිරුර දුටු ප්‍රදේශවාසීන් දැක ඇති අන්දමට නාගයාගේ හිසට තුවාල සිදුවී ඇත. දරුවා පෙර දවස හෙළි කරන අවස්ථාවලදී හිසේ දැඩි වේදනාවක් ඇතිවන බැව් ප්‍රකාශ කර තිබේ.

sinhalaebooks.com

# පෙර ආත්මයේ හිමිනමක්ව සිට මියගිය පොඩි සාදු නැවත ඉපදී සිදුකළ හෙළිදරව්ව – Photos



“පුනුරුප්පත්තිය”යන වචනයේ අදහස වන්නේ යම් පුද්ගලයෙකු මරණයෙන් පසුව නැවත නැවතත් උපත ලැබීමයි. මෙය බොහෝමයක් බෞද්ධ දර්ශන්ට අනුව ගොඩ දෙනෙක් විශ්වාස කරන කරුණකි. එයින් අදහස් වන්නේ මරණයෙන් පසුව පුද්ගලයෙකුගේ ආත්මය ශරීරයෙන් වෙන්ව අලුත් ශරීරයක උපත ලබන මතයයි.

එලෙස නැවත ඉපදීම පුනුරුප්පත්තිය වන අතර පුනර්භවය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකු මියගිය භවයේ සිදුවීම් සමුදායන්ය. මියගිය පසු නැවත නැවත ඉපදී පෙර භවයේ සිදුවීම් නැවත මතකයට නැගීමත් මෙම පුනර්භවයේ සිදුවන දෙයකි.

sinhalaebooks.com

එවැනි පෙර භවයක නැවත ඉපදීමක් පිළිබඳ පුවතක් වාර්තා වුණා. ඒ තමයි 2006 වසරේදී උපන් කුඩා දරුවෙකු තමාගේ පෙර භවය නැවත මතක් වී ඒ පිළිබඳව දෙමව්පියන්ට ප්‍රකාශ කිරීම.කුඩා දරුවා ගිය භවයේ හාමුදුරුනමක් සිටියදී පන්සලේදී මිය ගිය බවයි දරුවා ප්‍රකාශ කරන කරුණු අණුව මව්පිටන්ට සනාථ වී තිබෙන්නේ.මේ සිදුවීම පිළිබඳව ජාතික පුවත්පතක පළවී තිබුනේ මෙලෙසයි..

2006 වසරේදී උපත් ලද කළිඟු ඉපදී අට මසක් වැනි ඉතා කුඩා වයසේදී බහ තේරීමට උත්සාහ ගත් දරුවෙක් විය. ඒ සමඟම ඔහු තුළින් දක්නට ලැබුණ විශේෂත්වයක් වූයේ බුද්ධ රූපවලට දැඩි ලැදියාවක් දැක්වීමය. අන් දරුවන් මෙන් වෙනත් ක්‍රීඩා භාණ්ඩ ඔහු ප්‍රිය නොකළේය. බුද්ධරූපයක් දුටු විගස ඒ දෙස බොහෝ වේලාවක් බලා සිටියේය. වයස අවුරුදු එකහමාරක් පමණ වන විට හොඳින් වචන උච්චාරණය කිරීමටද ඔහුට හැකියාව ලැබිණි. පාලි ගාථ සහ පිරිත් වදන් කීමටද ඔහු පුරුදුව සිටියේය.

දෙවසරක් වයස් වන විට නිතර නිතර ගාථ කියමින් මල් පූජා කිරීමටද ඔහු උනන්දුවිය. කිසියම් විටෙක බුද්ධරූපයක් දුටු විට එය රැගෙන දෙන ලෙස මාපියන්ගෙන් ඉල්ලා සිටියේය. ඒ අයුරින් නිවෙසට ගෙන එන බුද්ධරූප දැඩි භක්තියෙන් උස ස්ථානයක තබා වැඳුම් පිදුම් කිරීමටද ඔහු පුරුදුව සිටියේය. තම දරුවා මෙතරම් ආගමික භක්තියකට හුරුවූයේ කෙසේ දැයි මාපියෝ පුදුමයට පත්ව සිටියහ. ඒ වන විට ඔහුට මල් පහන් පූජා කරන ගාථාද කට පාඩමින් කිව හැකි වීමද පුදුම උපදවන සුළුවිය.

මේ අතර දිනක් මව අමතා “

sinhalaebooks.com

බබාව ජෝවලට වැටුණා .'' යයි කීවේය. දරුවා එසේ කියන්නේ කුමක්දැයි මවට අවබෝධයක් නොවීය. තවත් දිනක් නිවෙසින් පිට මව සමඟ ගමන් කරමින් සිටියදී විහාරස්ථානයක වැලක එල්ලා තිබූ සිවුරක් දුටුවේය. ඒ දෙසට අත දිගුකළ කළිඟු '' ඒ වගේ එකක් '' යයි කීවේය.

තම පුත්‍රයා කිසියම් පෙර භවයක් පිළිබඳ හෙළි කිරීමක් කරන බැව් මාපියන්ට වැටහුණි. දින කීපයකට පසු නැවතත් මව ඇමතූ කළිඟු ''

මට තව අම්මෙක් ඉන්නවා. ඒ සුදු අම්මා''

යයිද කීවේය. අනතුරුව පෙරභවයේදී ෙසායුරු සොහොයුරියන් කීප දෙනෙක්ම සිටින බැව් පැවසුවේ. ''

'' යනුවෙනි. දරුවා ප්‍රකාශ කරන වදන් සහ ඔහු තුළ තිබූ පිරිත් සහ ගාථා කීමේ හැකියාව නිසා ඔහු පෙරභවයේදී පන්සලක ජීවත් වූ අයෙකු බැව් මාපියන්ට සැක සිතුණි. එහෙත් ඒ පිළිබඳව ඔවුහු දැඩි අවධානයක් යොමු නොකළහ.

මේ අතර පෙරභවයේ ජීවන තොරතුරු නිතර හෙළි කළ කළිඟු ''

මට අනෙක් අම්මා බලන්න යන්න ඕනෑ ''යයි දින කීපයක්ම කියා සිටියේය. පෙර භවයක් පිළිබඳ දරුවා හෙළි කරන බැව් අවබෝධ වූවත් ඔහු සිටි ප්‍රදේශයක් ඒ වන විට අනාවරණය නොවීය. සති කීපයක් ගතවිය.

මට මගේ සුදු අම්මාව සොයා දුන්නේ නෑ

sinhalaebooks.com

'' කළිඟු සිය මවට නැවත කීවේය.

එයට පිළිතුරු දුන් මව.

''ඔයාගෙ අම්මව සොයා දෙන්න ඔයා හිටියෙ කොහේද?'' යයි ප්‍රශ්න කළාය. ටික වේලාවක් කල්පනාවේ යෙදී සිටි දරුවා 'දැදිගම' ' යයි හෙළි කළේය. තවත් දිනක් නිවසේ සිටියදී ගාථාවක් කී දරුවා මම එහෙදී පිරිත් කියනවා යයිද ප්‍රකාශ කළේය. ඔහු නිතර පැවසූ වදනක් වූයේ ''සුදු අම්මා'' යනුවෙනි. වරක් පියාගේ කනේ දක්නට තිබූ ගැටිත්තක් අතින් ස්පර්ශ කළ දරුවා.

''තාත්තගෙ කනේ තියෙන්නෙ හරියට පුළුන් ඇටයක් වගේ'' යයි කීවේය. පුළුන් ඇටයක් යන වදනක් ඒ වන විට කිසි දිනෙක භාවිතා නොවීය. පුළුන් ඇටයක් දැක ගැනීමට හෝ එම දරුවාට ඒ වන විට අවස්ථාවක් නොලැබුණු බැවිද පියාට පැහැදිලිය. එසේ නම් දරුවා පුළුන් ඇටය යයි ප්‍රකාශ කළේ ඇයිද යන්නද මාපියන්ට ප්‍රශ්නයක් වීය. බිලි නැන්දා යන වදනක්ද ඔහු අනාවරණය කළේය.

මේ අයුරින් පෙර භවයට සම්බන්ධ ඔහු අනාවරණය කළ තොරතුරු අනුව පෙරභවයේ නිවෙස සොයා බැලීමට මාපියෝ තීරණය කළහ. කළිඟුගේ පියා ඒ පිළිබඳ විමර්ශනයක් කිරීමට දැදිගම ප්‍රදේශයට ගියේය. කිසියම් විහාරස්ථානයක සිටි අයෙක් දියේ ගිලීමකින් මරුමුවට පත් වූයේද යන්න ඔහු පරීක්ෂා කළේය. එහිදී ඔහුට අසන්නට ලැබුණේ දැදිගම පුරාණ විහාරයේ සිටි සුමනසිරි නම් භික්ෂූන් වහන්සේ නමක් ළිදේ වැටීමකින් අපවත් වූ බවකි. ඒ අනුව දරුවා එම ස්ථානයට රැගෙන ඒමට පියා උනන්දුවීම නිසා කළිඟුට එම විහාරස්ථානයට ඒමට අවස්ථාව ලැබිණි.

sinhalaebooks.com

එදා කළිඟු විහාරස්ථානයට පැමිණෙන බැව් ආරංචි පැතිර යාම නිසා පෙරභවයේ මව සහ ඥාතීන් කීප දෙනෙක්ද විහාරස්ථානයට පැමිණ සිටියහ. විහාරස්ථානයේදී ඔහු “මේ මගේ පන්සල යයි එකවරම ප්‍රකාශ කළේය. අනතුරුව එහි තිබූ බුදු මැදුර වෙත දිව ගියේ ඉතා පුරුදු අයෙකු විලසිනි.

එහි තිබූ විෂ්ණු දේවාලය වෙතද ගිය දරුවා එහි ඇති වෙනස්කම් කීපයක් ගැනද විමසා සිටියේය. කළිඟු විහාරස්ථානයට එන විට නා හිමියෝ එහි නොසිටියහ. විහාරස්ථානයේ පුරුදු ලීලාවෙන් ස්වල්ප වේලාවක් ගත කළ දරුවා ඊළඟට ගියේ ඔහු පෙරභවයේදී වැටුණු ළිඳ වෙතය. මේ අතර තුර නා හිමියෝ පන්සලට වැඩම කර සිටියහ. උන්වහන්සේ සිටි ස්ථානයට ගිය කළිඳු නාහිමියන් දෙස ටික වේලාවක් බලා සිටියේය. නාහිමියන්ට වැඳ නමස්කාර කළ ඔහු එහි එල්ලා තිබූ ඡායාරූපයක් දෙසට අත දිගුකර එය හඳුනාගත් බැව් කළිඳුගේ මව අප සමඟ පැවසුවාය.

ඉන්පසු ඔහු ඉල්ලා සිටියේ නිවෙසට යායුතු බවය. ඒ අනුව ඔහු පෙර භව නිවස වෙත කැඳවාගෙන ගියේය. එහිදී ඔහු එම නිවෙස තුළදී ඉතා හොඳින් පුරුදු තැනක් ලෙස එහි ඇතුළු වූයේ රැස්ව සිටි අය පුදුමයට පත් කරවමිනි. නිවෙසේ කාමරයක් තුළට ගිය දරුවා එහි තිබූ ඇඳක් මත වැතිර ටික වේලාවක් නිදහසේ සිටියේය. පෙර භවයේ මව ප්‍රකාශ කළේ කළිඳුගේ පෙරභවය වූ සුමනසිරි හිමියන් නිවෙසට පැමිණි අවස්ථාවල දී එම කාමරයේ ඇඳේ සිට විවේක ගන්නා බවය.

sinhalaebooks.com

කළිඳුගේ පුනර්භවය පිළිබඳව විමර්ශනයක් සඳහා අප ගිය විටෙකදී ඔහු අනාවරණය කළ පුළුන් ඇට කතාව ගැනද විමසීමක් කළෙමු. එහිදී අනාවරණය වූයේ අතිශය ප්‍රබල සාක්කියකි. එනම් කළිඳු ප්‍රකාශ කළ "බිලි නැන්දා" සමඟ ඔහු පැවිදි වීමට පෙර නිවෙසේ සිටියදී පුළුන් ඇට ඇහිලීමට ගිය බවය, මේ අයුරින් කළඟු හෙළි කළ පෙරභව කරුණ රැසක් සනාථවීමෙන් පසු මේ පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීමට අපට අවස්ථාව ලැබිණි. එහිදී සුමනසිරි හිමියන්ගේ මව හමුවූ විටදී ඇය ඒ පිළිබඳ ප්‍රකාශ කළේ මෙසේය.

මගේ හාමුදුරු පුතා උපන්නෙ 1963 අගෝස්තු මාසේ එයාගෙ ගිහි නම හේමචන්ද්‍ර එයා පස්වෙනි දරුවා එයා මහණ වුණෝ වයස අවුරුදු දොළහෙදී එදා හාමුදුරුවො ළිදේ වැටුණ කියලා මට ආරංචි වුණ ගමන් මම පන්සලට ගියා. ළිඳ ළඟ සෙනග පිරිලා හිටියා. මිනිය අරගෙන මරණ පරීක්ෂණයට ගෙන ගියා. එයත් කුඩා කාලෙදි ආගමට හරිම කැමතියි. මහණවෙන්න කැමතියි කියලා එයා තමයි ඒ තීරණය ගත්තේ. කළිඳු පුතා එදා ගෙදරට ඇවිත් එක පාරටම එයා හිටපු කාමරයට දුවගෙන ගියා. එතන තිබුණු ඇඳට ගිහින් දිගාවුනේ හාමුදුරුවො ගෙදර ආපු වෙලාවට ගෙදර හැසිරුන විදිහටමයි.

sinhalaebooks.com

"ලොරියෙන් දර ගෙනාවා" යිය එයා කියලා තිබුණා. එයාගෙ තාත්ත ලොරියෙන් ලී ගෙනා බව හෙළි කිරීමත් පුදුමයි. හාමුදුරු පුතා කළිඳු විදියට නැවත ඉපදිලා කියලා මම විශ්වාස කරනවායි පැවසූ ඇය නිතරම වගේ එයා මා බලන්න ගෙදර එනවා. ඇවිත් එයාගේ කාමරයට ගිහින් විවේක ගන්නවා. පැවිදි ජීවිතයේදී පිරිත් කියන්න හරිම දක්ෂයි. එදා කළිඳු දරුවා පන්සලට ආපු වෙලාවෙ මම හිටියා. ආපු වාහනය නවත්තපු ගමන් ඒකෙන් බැහැලා මෙන්න මගේ පන්සල කියල මහ හයියෙන් කෑ ගහල කියනව මට ඇසුණා. මා ළඟට දුවගෙන ඇවිත් මා දිහා බලාගෙන හිටියා. අම්මා කියලා නම් කිව්වේ නෑ. එදා ඇවිත් විෂ්ණු දේවාලෙ තිබුණ තැන හරියටම පෙන්නුවා. පන්සලේ ඇතැම් ස්ථාන වෙනස් වෙලා කියලත් කිව්වා. ඒ පුතා කියපු තොරතුරුවලින් අයියලා අක්කලා නංගිලා ඉන්නවා කියපු සේරම ඇත්ත. ඊටත් වඩා පුදුම වැදගත් ප්‍රකාශයක් තමයි "බිලි නැන්දා" ගැන කියපු කතාව යයි මව ප්‍රකාශ කළාය.

සුමනසිරි හිමියන් වැඩ විසූ දැදිගම විහාරස්ථානයේ නායක හිමියන්ගෙන්ද ඒ පිළිබඳව අපි විමසීමක් කළෙමු. උන්වහන්සේ අප සමඟ කළ ප්‍රකාශය මෙසේය.

sinhalaebooks.com

එදා මට මතකයි දහවල් පොඩි හාමුදුරුවො ළිදේ වැටිලා කියලා මට කිව්වා. ළිදෙන් ගොඩගන්න කොට මරණය සිදු වෙලා. සිරුර ගොඩගන්නා විට සිවුර ජලය උඩ පාවී තිබුණා. කළිඳු පන්සලට එන විට මම හිටියේ. එයා ඇවිත් වැටුණු ළිඳ පෙන්නලා තිබුණා. අපවත් වුණ පොඩි හාමුදුරුවො පිරිත් කීමට පුදුම දක්ෂතාවක් තිබුණු හිමි නමක්. එදා පන්සලට ඇවිත් හැසුරුණේ හොඳට හුරු පුරුදු කෙනෙක් විදියටයි. යනුවෙන් නායක හිමියෝ පැවසූහ.

කළිඳු විසින් පිරිත් සහ ගාථා කීම ආරම්භ කරනු ලැබුවේ අවුරුදු දෙකක පමණ කුඩා කළ සිටය. ඔහු තුළ බුද්ධරූපවලට තිබූ දැඩි ආශාව අතිශය පුදුම උපදවන සුළුවිය. වරින් වර ඔහු මාපියන් මගින් ගෙන්වා ගත් බුද්ධ රූප රැසක් ඔහු එක්රැස් කර තිබිණි. ඒ අතර දේව රූපද විය. එම දේව රූප කිසිවෙකුගේ ඉගැන්වීමක් නොමැතිව අදාළ දේවරූප හඳුන්වා දීමටද එදා මෙම දරුවාට හැකියාව තිබිණි. එසේ නම් කළ දේවරූප අතර විෂ්ණු කතරගම සහ සමන් යන දෙවිවරුන්ගේ රූප ඇතුළත් වීය.

මෙම දරුවා ප්‍රකාශ කළ පෙර භව තොරතුරු අතර පුද්ගල නම් කීපයක්ද සඳහන් කර තිබිණි. එහෙත් එම නම් වලට අදාල අය සොයා ගැනීම දුෂ්කර විය. මිය යන විට තරුණ වියේ සිටි නිසා මිතුරන් සිටි බවත් ඔවුන් ගේ නම් පවුලේ අය හෝ විහාරස්ථානයේ හිමිවරුන්ගේ හෝ නොදැන සිටි බවත් ඒ පිළිබඳව සිදුකළ විමර්ශනයේදී හෙළිවිය.

sinhalaebooks.com

පෙර භවය හෙළිකළ මෙම දරුවා උපත ලබා ඇත්තේ 2006 සැප්තැම්බර් මාසයේදී කොළඹ කාසල් රෝහලේදීය ඔහු අනාවරණය කළ පෙරභවය ලෙස හෙළි වූ සුමනසිරි හිමියෝ අපවත් වී ඇත්තේ 1989 අගෝස්තු මාසයේදීය. ඒ අනුව උපත සහ මරණය අතර කාලය වසර දාහතක් ගත වී ඇති බැව් දක්නට ලැබේ.

කළිඳුගේ පුනර්භව පර්යේෂණයේදී ඔහු හෙළි කළ පෙරභව තොරතුරු ලිඛිතව සටහන් වී ඇත්තේ මෙසේය.

කළිඳු හෙළි කළ මෙම තොරතුරු අතරින් පුද්ගල නම් සහ බවුන් ගෙදර යනුවෙන් හැදින්වූයේ කුමක්දැයි නිරීක්ෂණය නොවිනි. ඔහු ප්‍රකාශ කළ පරිදි දැදිගම විහාරස්ථානයකදී ළිදේ වැටීමක් නිසා මරණයක් සිදුවී ඇත්තේ සුමන සිරි හිමියන්ගේ අපවත් වීම පමණක් බැවිද මෙම පරියේෂණයේදී දක්නට ලැබිණි. පුනර්භව පර්යේෂණවලදී පෙරභවයේ භික්ෂූන් වහන්සේ ලෙස ජීවත්ව සිටි බැව් හෙළි කළ දරුවන් පිළිබඳ සිදුකළ පර්යේෂණ (Children who speak of memories of a previous life as a Buddhist monk) ලෙස පුනර්භව සාධක වලට ඇතුළත් වී තිබේ. මේ වන විට ශ්‍රීලංකාවේ දරුවන් පස් දෙනෙකු පමණ පෙරභවයේ භික්ෂූන් වහන්සේ ලෙස ජීවත්ව සිටි බැව් අනාවරණ කර ඇත. ඒ අතරින් තුන්දෙනියේ දුමින්ද සහ කෙසෙල්හේනාවේ රුවන් යන දරුවන්ගේ සිදුවීම් ප්‍රබල සාක්කි ලෙස විදේශිය පර්යේෂණ වාර්තාවලටද ඇතුළත් කර ඇත.

sinhalaebooks.com



පෙර භවයේ මව



sinhalaebooks.com





sinhalaebooks.com

# පෙර භවයේ භාවෙකු වූ යළි උපන් දරුවෙක්

බැලුවෝ - 2072 අදහස් - 0

පෙර භවය හෙළි කළ දරුවන් මගින් සත්ත්ව ජීවිත අනාවරණය වූ පුනර්භව සාධක දුර්ලභ ය. ලොව රටවල් රැසක සිදුකර ඇති පුනර්භව පර්යේෂණ දහස් ගණනක් අතර එවැනි සිදුවීම් වාර්තා වී ඇත්තේ දහයකටත් වඩා අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේ පුනර්භව සිදුවීම් තුන්සිය හැටක පමණ ප්‍රමාණයකින් සත්ත්ව ජීවිත හෙළි වූයේ දරුවන් තිදෙනකුගෙන් පමණි. සත්ත්ව ජීවිතයක් ගත කළ බැව් පැහැදිලිව සනාථ වූ එක් දරුවකු උපත ලැබුවේ වැලිවේරිය ප්‍රදේශයේ ය. එම දරුවා අනාවරණය කළේ ‍පෙර භවයකදී භාවෙකු ලෙස ජීවත්ව සිටි බවය. එහිදී දඩයක්කරුවකු විසින් තබන ලද වෙඩි පහරකින් මරණයට පත්වූ බැව් ඔහු පැවසීය. වෙඩි තැබීම සිදුවූ ස්ථානයද එම දරුවා නිවැරදිව හෙළි කළේය.

sinhalaebooks.com




භාවෙකු ලෙස සිටි බැව් පැවසූ ඔහුගේ මාපියන් වූයේ වැලිවේරියේ පදිංචිව සිටි ජූලියස් සහ රොසලින් යුවළය. ඔවුන්ගේ වැඩිමහල් පුත්‍රයාට නම් තබන ලද්දේ වර්ණසිරි යනුවෙනි. වර්ණසිරි සිය පෙරභවය හෙළි කරන විට ඔහු සිව්වන වියේ පසුවිය.

පෙරභව ජීවිත තොරතුරු හෙළි කරමින් ඔහු ප්‍රථම වරට ප්‍රකාශ කළේ පෙර භවයේදී ජීවත්ව සිටියේ කිඹුල්ගොඩ ප්‍රදේශයේ බවකි. දිනක් පියා ඇමතූ දරුවා,

sinhalaebooks.com

"මම හිටියේ කිඹුල්ගොඩ" යයි පැවසීය. තම පුත්‍රයාගේ එම වදන පිළිබඳව විමසීමක් කිරීමට සිතූ පියා,

'කිඹුල්ගොඩ කොහේද? යයි ප්‍රශ්න කළේය. එයට පිළිතුරු දුන් වර්ණසිරි,

"ඒ ගෙදර ලොකුයි. ඒ ගේ තිබුණෙ ඉස්කෝලෙ ළඟ. ගේ ළඟ බෝක්කුවකුත් තියෙනවා" යනුවෙන් පෙර භව මතක සටහන් අවදි කළේය. අනතුරුව වර්ණසිරිගේ පෙරභව හෙළි කිරීම දිනෙන් දින වැඩි වන්නට විය.

පෙරභවයේ මව පාසල් ගුරුවරියක් බැව් ද හෙළි කළ ඔහු තම මවට දැන් මවට වඩා මුදල් තිබූ බැව්ද කීය. ඔහු අනාවරණය කළ තොරතුරු අනුව පෙර භවයේදී තරුණ ජීවිතයක් ගත කළ බැව් හෙළිවිය. පෙරභවයේ මරණය සිදුවූ අන්දම අනාවරණය කරමින් ඔහු පැවසුවේ දිනක් උදේ ආහාර ගැනීමෙන් පසු නිවෙසට ගිය බැව්ද අනතුරුව මරණයට පත්වූ බවය. උදේ පලතුරු වර්ගයක් ආහාරයට ගත් බවත් පසුව බත් අනුභව කිරීමෙන් පසු මරණයට පත්වූ බැව්ද කීය. පෙරභයේ මවගේ හැඩරුව ඔහු අනාවරණය කළේය.

sinhalaebooks.com

'ඒ අම්ම මේ අම්මට වැඩිය මහතයි, සුදුයි' යනුවෙනි. නිවෙස ඉදිරිපිට තිබූ පේර ගසක් ගැනද වර්ණසිරිට මතක තිබිණි. පෙරභව නිවසේදී තිබූ බැව් හෙළිකළ භාණ්ඩ අතර කාර් රථයක් තිබූ බැව්ද හෙළි කළ මෙම දරුවා,

"එහෙදී මට කාර් එළවන්නත් පුළුවන්. මට බයිසිකලයකුත් තිබුණා. මට කතා කරන්නෙ සුදු මහත්තය කියලා. පුංචි මහත්තය කියලත් කිව්වා" යයිද අනාවරණය කළේය. මරණය සිදුවීමෙන් පසු නැවත දෙවරක් උපන් බවත් ඔහු අනාවරණය කළේ අතිශය පුදුම අයුරිනි.
"මම එක පාරක් මැරුණට පස්සෙ මේ අම්මා ළඟ දෙපාරක් ඉපදුණා. එක පාරක් ඉපදුණ ගමන්ම ආයෙත් මැරුණා. ඒ වෙලාවෙ පෙට්ටියක දාලා ඉස්පිරිතාලෙම වැළලුවා" යයිද ඔහු ඉතා හොඳ මතකයෙන් හෙළි කළේය.


වර්ණසිරිගේ මව

sinhalaebooks.com

වර්ණසිරි හෙළි කරන පෙරභව තොරතුරු අතර තවත් අතිවිශේෂ ප්‍රකාශයක් ඇතුළත්ව තිබිණි. එනම් ඔහු උපත ලැබූ ප්‍රදේශයේ නිවසට ආසන්නයේ හාවෙකු ලෙස දුව පැන ඇවිදිමින් කොළ වර්ග ආහාරයට ගනිමින් සිටියදී වෙඩි තැබූ බවය. එය සිදුවූයේ වැලිවේරියේ මවගේ කුසයෙන් ඉපදීමට ප්‍රථම බැව් වර්ණසිරි හෙළිකළේය.

පෙරභව තොරතුරු විමර්ශනය කිරීමට මාපියෝ උනන්දු නොවූහ. ඒ අතර වර්ණසිරිගේ පෙරභව තොරතුරු කිඹුල්ගොඩ ප්‍රදේශයටද ආරංචි පැතිර ගියේය. එය සිදුවූයේ වර්ණසිරිගේ මාපියන්ගේ ඥාතිවරියක් මගිනි. ආහාර ගැනීමකින් පසුව හදිසියේ මරණයට පත්වූ කිඹුල්ගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි මහීපාල නම් තරුණයකුගේ ජීවිත තොරතුරුවලට සමාන තොරතුරු වර්ණසිරි හෙළි කරන බැව් දක්නට ලැබිණි. එය ශ්‍රවණය වීමෙන් පසු පෙරභවයේ මව වැලිවේරිය නිවෙස සොයා පැමිණියාය. එහෙත් ඒ අවස්ථාවේ වර්ණසිරි හමුවීමට ඇයට නොලැබිණි. අනතුරුව වර්ණසිරිට පෙරභව නිවසෙට යෑමට අවස්ථාව උදාවිය. වර්ණසිරි එදා කිඹුල්ගොඩ නිවෙසට ගිය අවස්ථාවේ එහි සිටි කාන්තාවන් අතරින් පෙර භවයේ මව නිවැරදිව හඳුනාගැනීමට ඔහුට හැකිවිය.

sinhalaebooks.com

වර්ණසිරිගේ පුනර්භව පුවත පැතිර යාමෙන් පසු පුනර්භව පර්යේෂකයන් වූ මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් සහ ප්‍රැන්සිස් ස්ටෝරි යන පර්යේෂකයෝ මේ පිළිබඳව පර්යේෂණ ආරම්භ කළහ.

මෙම පර්යේෂණයේදී වර්ණසිරිගේ පෙරභවය හඳුනාගැනීම් පිළිබඳව අවධානය යොමු කැරිණි. එ ෙවලේ ඥාතීන් මෙන්ම ඔහු ඉගෙන ගත් පාසල පෙන්වාදීමට එදා ඔහුට හැකිවිය. පෙරභව නිවසට ගිය වර්ණසිරි ඔහුගේ බයිසිකලය පිළිබඳ විමසීය. එහෙත් ඒ වනවිට එය විකුණා දමා තිබිණි. මෙහිදී සනාථ වූ තවත් කරුණක් වූයේ පෙර භවයේදී ඔහුට මෝටර් රථයක් තිබූ බවත් එය පැදවීම ඔහු විසින් කෙරුණු බවත්ය.

පෙර භවයේ පුද්ගල ඡායාරූපයක් එදා වර්ණසිරි පෙර නිවසට ගිය අවස්ථාවේ දුටු විගස ඒ මගේ පින්තූරය යයි මහීපාලගේ ඡායාරූපයක් හඳුනාගැනීම ද විශේෂ සිදුවීමක් විය. පර්යේෂණ මෙෙහයවූ ප්‍රැන්සිස් ස්ටෝරි විසින් තවත් ඡායාරූප කීපයක් ඉදිරිපත් කරන ලද අතර ඉන් එක් ඡායාරූපයක්ද ඔහු විසින් හඳුනාගනු ලැබිණි.

වර්ණසිරිගේ පුනර්භව සිදුවීම පිළිබඳව විමර්ශනය කිරීමට අපට අවස්ථාව ලැබුණේ මහාචාර්ය ස්ටීවන්සන් සමග හැත්තෑවේ දශකයේදීය. ඒ වනවිට වර්ණසිරි පැවිදිවීමට ආසාවෙන් සිටියේය.

sinhalaebooks.com




වර්ණසිරිගේ පෙරභව තොරතුරු පර්යේෂණ කිරීමට ඔහුගේ මාපියන් හමුවීමටද එදා අපට හැකිවිය. වර්ණසිරි හෙළිකළ පරිදි පෙරභවයේ මරණය සිදුවීමෙන් පසු එම මවගේම කුස තුළින් යළිත් උපත ලැබීමට ප්‍රකාශ කිරීම මෙම පුනර්භව සාධකයේ අතිශය වැදගත් කරුණක් විය. වර්ණසිරිගේ මව ප්‍රකාශ කළ පරිදි ඔහුගේ උපත සිදුවීමට වසරකට උඩදී ඇයට දරු උපතක් සිදුවී තිබිණි. එහෙත් එය මළ දරු උපතකි. එම දරුවාගේ උපත සිදුවී තිබුණේ දොම්පේ රෝහලේදීය. එදිනම එය භූමිදානය සිදුකෙරිණි. තම මළ සිරුර කුඩා පෙට්ටියක බහාලූ බැව්

sinhalaebooks.com

වර්ණසිරි අනාවරණය කළේය. එය රෝහල් භූමියේ භූමිදාන කළ බැව්ද හෙළිවිය.

ඒ අතර ඔහු ප්‍රකාශ කළ සත්ත්ව ජීවිතයද මෙම පුනර්භව කතා පුවතේ අතිශය වැදගත් තවත් කරුණකි. සත්ත්ව ජීවිතය පිළිබඳව අනාවරණය කරමින් එම දරුවා පැවසුවේ හාවෙකු ලෙස සිටියදී මරණයට පත්වූයේ නිවෙස අසල දී බවය. එම ස්ථානයේ ගල්තලාවක් තිබූ බැව්ද එම දරුවාට මතක තිබිණි. වර්ණසිරිගේ ෙමම පුනර්භව පර්යේෂණ සඳහා ලංකාව පැමිණ මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලියන ලද වාර්තාවකටද ඒ බැව් ඇතුළත් කර ඇත්තේ මෙසේය.

**'WARNASIRI ALSO CLAIMED TO RECALL A PREVIOUS LIFE AS A HERE WHICH ATE LEAVES AND HAD BEEN SHOT HE SAID HE HAD LIVED THIS LIFE NEAR THE HOUSE IN KIRILITA' යනුවෙනි**.

වර්ණසිරි අනාවරණය කළ එම සත්ත්ව ජීවිතය ඔහු ප්‍රකාශ කළේ කෙසේදැයි වරක් වර්ණසිරිගේ මව හමුවූ විටෙක අපි ඇගෙන් විමසුෙවමු.

sinhalaebooks.com

**ඔබේ පුතා භාවෙකුගේ ජීවිත තොරතුරු කීවේ කෙසේද?**

ඒක නම් හරිම පුදුම සිදුවීමක්. මා ළඟ දෙවරක් ඉපදුන බැව් කිව්වා. එක පාරක් ඉපදුන හැටියෙම මැරුණ බව කීවා. ඒ සමගම එයා භාවෙක් වෙලා ගේ අසල සිටි බවත් එහිදී වෙඩි තබා මරණය සිදු කළ බවත් කීවා.

**දෙවරක් ඔබේ කුසෙන් බිහිවූ පුවත සත්‍ය වුණේ කෙසේද?**

මගේ කුලුඳුල් දරු උපත සිදුවුණේ මළ දරු උපතක් ලෙසයි. ඒ ඉපදුණ දරුවා අපි රෝහල් භූමියේදී භූමිදාන කළා. ඊට පස්සෙ නැවත දරුවකු පිළිසිඳගෙන ඉපදුන දරුවා තමයි වර්ණසිරි. භාවෙකු වෙලා සිටියදී වෙඩි තැබීම සිදුවූ ස්ථානය එයා කීවා. එයා කිව්ව තැනදී වසර කීපයකට උඩදී භාවෙකු වෙඩි තැබීමක් සිදුවී තිබූ බැව් තහවුරු වුණා යැයි ඇය අප සමග කීවාය. වර්ණසිරි අනාවරණය කළ භාවෙකු ලෙස සිටියදී වෙඩි තැබීම සිදුවූ ස්ථානය නිරීක්ෂණය කිරීමටද අපට අවස්ථාව ලැබිණි. ඒ වනවිට එම ස්ථානය නිවැරදිව හඳුනාගෙන තිබූ අතර එම ස්ථානයේදී වසර කීපයකට උඩදී වර්ණසිරි අනාවරණය කළ පරිදි භාවෙකු වෙඩි තැබීම පුවත සනාථවී එය ප්‍රබල සාක්කියක් බවටද පත්විය. එම ස්ථානය ඒ අයුරින්ම ගල්පොත්තක් සහිත රුස්ස ගස් පිහිටා තිබූ බැව් අපටද දක්නට ලැබිණි. එය පිහිටා ඇත්තේ වර්ණසිරි උපත ලැබූ නිවෙසට ඉතා අසන්නව කිරිකිත්ත නම් ප්‍රදේශයේය.

sinhalaebooks.com

මිනිස් ජීවිත දෙකක් සහ සත්ත්ව ජීවිතයක් අනාවරණය කළ වර්ණසිරි වයස අවුරුදු දහසයේදී පැවිදි බිමට ඇතුළත් විය. ඔහු පැවිදි බව ලැබුවේ කිරිකිත්තේ ජිනසීහ හිමි යනුවෙනි. ඒ අවස්ථාවේ ඔහු ප්‍රකාශ කළේ මැරි මැරී ඉපදීම ඔහු අත්දුටු බැවින් පැවිදි බිමට ඇතුළත්වීමට ආශාවක් ඇති බවය. ටික කලක් පැවිදිවී සිටි ඔහු යළිත් ගිහි ජීවිතයට ඇතුළත් විය. අධ්‍යාපන කටයුතු ද උසස් අයුරින් නිම කළ වර්ණසිරි උපාධිධාරී ගුරුවරයකු ලෙස අද සේවය කරයි. පෙර භව මතක සටහන් පිළිබඳව ඔහුගෙන් විමසීමට පසුගිය දිනෙක නැවතත් අපට අවස්ථාව ලැබිණි.

"ඉස්සර වගේම සමාජසේවා කටයුතුවලට මගේ සිත තදින්ම ඇදී ගොස් තියෙනවා. පෙර භවයෙන් ගෙනා දෙයක් ලෙස මා එය සිතනවා" යයි ඔහු පවසයි. පෙර භවයේ භාවෙකුගේ ජීවිතයේදී වෙඩි තබා මරණය සිදුවීම පිළිබඳව කිසියම් මතකයක් තවමත් තිබේ දැයි අප විමසූවිට එයට පිළිතුරු දුන් වර්ණසිරි මහතා ප්‍රකාශ කළේ වෙඩි හඬ වැනි ශබ්දවලදී මට අදත් මහත් තැතිගැන්මක් ඇති වෙනවා යනුවෙනි.

sinhalaebooks.com

වර්ණසිරි අනාවරණය කළ පරිදි සත්ත්ව ජීවිත හෙළිකළ දරුවන් කීප දෙනකුගේ තොරතුරු වාර්තාවක් මනෝ විද්‍යාත්මක ග්‍රන්ථයක් වූ ADVANCES IN PARA PSYCHOLOGICAL RESEARCH නම් පර්යේෂණ ග්‍රන්ථයේ සඳහන්වී ඇත්තේ CLAIMED LIVES AS NON HUMAN ANIMALS RECALL OF MORE THAN ONE LIFE යනුවෙනි. ශ්‍රී ලංකාවෙන් හෙළිවූ සත්ත්ව ජීවිත අනාවරණය කළ අනෙකුත් දරුවන් අතර පක්ෂියකුගේ සහ උරගයෙකුගේ ජීවිත ගැන හෙළි කළ පුනර්භව සාධක ඇතුළත්වී තිබේ.

sinhalaebooks.com

# පුනර්භව රහස් සොයන වර්ජීනියා සරසවිය

බැලුවෝ - 1419 අදහස් - 0

## පෙර භවයේ ප්‍රබල සාක්කි




පෙර භවය හෙළි කිරීම හෙවත් යළි ඉපදීම සිහි කිරීම ලොව රටවල් රැසක මනෝ විද්‍යාත්මක පර්යේෂණ දැන් අරඹා තිබේ. ඒ පිළිබඳව ප්‍රථම වරට විශ්ව විද්‍යාල මට්ටමෙන් පර්යේෂණ අංශයක් ආරම්භ කරනු ලැබුවේ. ඇමරිකාවේ වර්ජීනියා විශ්ව විද්‍යාලය මගිනි.

sinhalaebooks.com

ලෝ පතළ මනෝ විද්‍යාඥයකු වූ මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් එම සරසවිය මගින් ආරම්භ කරන ලද Department Of Psychiatry And Neurology යටතේ මෙම පර්යේෂණ සිදු කෙරිණි. එහි ප්‍රධානියා ලෙස 1957 වසරේ සිට ක්‍රියා කළ මහාචාර්ය ස්ටීවන්සන් 1961 වසරේ සිට පුනර්භව පර්යේෂණ සඳහාම වෙනමම අංශයක් ද එහි ආරම්භ කළේය.

මරණින් පසු සිදු වන දේ පිළිබඳව සෙවීමට උනන්දුවක් දැක් වූ මහාචාර්ය ස්ටීවන්සන් ප්‍රථම වරට ඉන්දීය පුනර්භව සාධක කීපයක් අධ්‍යයනය කළේය. අනතුරුව ශ්‍රී ලංකාවේ පුනර්භව සාධක නිරීක්ෂණය කිරීමට ඔහු ශ්‍රී ලංකාව පැමිණියේය.

වර්ජිනියා විශ්ව විද්‍යාලය මගින් ශ්‍රී ලංකාවේ පර්යේෂණයට ලක් කළ ප්‍රථම පුනර්භව සාධකය වූයේ තලවාකැලේ ප්‍රදේශයේ දී මරණයට පත් වූ තිලකරත්න නම් දරුවෙකු පිළිබඳව හෙළි වූ කතා පුවතකි. එම පුනර්භවය අනාවරණය කළේ ඥාණතිලකා නම් දැරියකි. ඒ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමට 1961 වසරේදී ශ්‍රී ලංකාවට පැමිණි මහාචාර්ය ස්ටීවන්සන් ඉන් අනතුරුව වසරකට හෝ දෙකට වරක් නිතර නිතර ශ්‍රී ලංකාවට පැමිණියේය. වර්ජිනියා විශ්වවිද්‍යාලයේ අනුග්‍රහය ඇතිව පුනර්භවය පිළිබඳ රටවල් රැසක එ් මහතා පර්යේෂණවල නිරත වීය.

sinhalaebooks.com

Research On Reincarnation යනුවෙන් මෙම පර්යේෂණ මෙහෙයවන ඇමෙරිකාව ඉන්දියාව බුරුමය තායිලන්තය තුර්කිය ලෙබනනය එංගලන්තය ජර්මනිය යන රටවලින් අතිශය වැදගත් පුනර්භව සාක්කි රැසක් ඉදිරිපත් වී තිබේ.




මේ වන විට වර්ජිනියා විශ්ව විද්‍යාලයට වාර්තා වී ඇති පුනර්භව සාධක සංඛ්‍යාව 3000 ක් පමණ වී ඇත.

දෙදාහ වසර වන විට වර්ජිනියා විශ්ව විද්‍යාලය මගින් ඉටු කරන ලද පුනර්භව සිදුවීම් වැඩිම ගණනක් වාර්තා වූයේ ඉන්දියාවෙනි. දෙවන ස්ථානය බුරුමයටත් තෙවන ස්ථානය ලෙබනනයටත් හිමි වී තිබේ. ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයට පත් වී ඇත. ඉන්දියාවෙන් සිදුවීම් 450 ක් පමණ පර්යේෂණ වලට යොමු වී ඇති අතර ශ්‍රී

sinhalaebooks.com

ලංකාවෙන් මේ වන විට පෙර භවය හෙළි කළ දරුවන් තුන්සිය පනහකගේ පමණ සිදුවීම් වාර්තා වී තිබේ. මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලියන ලද පුනර්භවය පිළිබඳ ප්‍රථම පර්යේෂණ වාර්තාව වූයේ The Evidence For Survival From Claimed Memories Of Former Incarnations යනුවෙනි. එය ප්‍රකාශයට පත් කරන ලද්දේ 1960 වසරේදී Journal Of The American Society For Psychical Research නම් සංවිධානය මගිනි. ඒ වන විට පුනර්භව සාධක හතළිහක් පමණ ලොව රටවල් කීපයකින් අනාවරය වී තිබිණි.

ඉතා ශාස්ත්‍රීය අන්දමින් පුනර්භව පර්යේෂණයක් සිදු කළ පෙර භවය හෙළි කළ දැරියකගේ කතා පුවතක් 1936 වසරේදී ප්‍රකාශයට පත් කැරිණි. ඉන්දියාවේදී උපත ලද ශාන්ත දේවි නම් එම දැරිය උපත ලැබුවේ 1926 වසරේදීය. තෙවන වියට පා තැබීමත් සමග ඇය සිය පෙර භවය හෙළි කළාය. එම දැරිය හෙළි කළේ ඇය පෙර භවයේදී මවක් ලෙස ජීවත් වූ බවය. සැමියා මාත්‍රා නම් ප්‍රදේශයේ පදිංචිව සිටි බවත් ඔහු රෙදි පිළි වෙළෙඳ ව්‍යාපාරිකයකු බවත් ඇය ප්‍රකාශ කළාය. දරුවකු ලැබීමට සිටියදී ඇගේ මරණය සිදු වූ බවද ඇගේ මතකයේ තිබිණ. පෙර භවයේදී පිළියෙළ කළ ආහාර වර්ග පවා මෙම දැරිය ප්‍රකාශ කළ අතර සැමියා බැලීමට පෙර නිවසට යා යුතු බැව් ඇය නිතර දෙමාපියන්ට කියා සිටියාය. එහෙත් දෙමාපියෝ එයට ඉඩක් දීමට අකමැති වූහ. පෙර භවයේ සැමියාගේ නමත් නිවසට යන ගමන් මාර්ගයත් ඇයට මතක තිබිණි.

sinhalaebooks.com

අවසානයේ ඥාතිවරයෙක් ඉදිරිපත් වී ඇගේ පෙරභව තොරතුරු විමර්ශනයක් සිදු කළේය. එහිදී සනාථ වූ කරුණු අනුව පෙර භවයේදි රෙදි වෙළෙඳ ව්‍යාපාරයක් සිදු කළ අයෙකුගේ මියගිය බිරිය ශාන්ති ලෙස උපත ලබා ඇතැයි සනාථ විය. මෙම දැරියගේ පුනර්භව සාධකය ඉන්දියාව පුරා මහත් ආන්දෝලයක් ඇති කළේය. මේ නිසා මහත්මා ගාන්ධි මෙම පුනර්භව සාධකය පිළිබඳව පර්යේෂණයක් පැවැත්වීමට කමිටුවක් ද පත් කළේය. ඒ අනුව දැරියව පෙර නිවසට රැගෙන යාමටත් හඳුනාගැනීම්ේ සිදුවීම් විමර්ශනය කිරීමත් ශාස්ත්‍රීය අයුරින් සිදු කැරිණි.


මහාචාර්ය ස්ටීවන්සන් පසු කලෙක ඇගේ පුනර්භව සාධකය පිළිබඳව විමර්ශනයක් සිදු කළේය. පුනර්භව සිදුවීම් දැඩි ලෙස පර්යේෂණයට ලක් කිරීමේ උනන්දුව ඇති වීමෙන් පසු මහාචාර්ය ස්ටීවන්සන්ට ඒ සඳහා වර්ජීනියා විශ්ව විද්‍යාලයේ පූර්ණ අනුග්‍රහය ලබා දී තිබිණි. පෙර භවය හෙළි කළ දරුවන් පිළිබඳ මනෝ විද්‍යා පර්යේෂණ වලට ප්‍රමුඛස්ථානය හිමිවීමද මහාචාර්ය ස්ටීවන්සන්ට මහත් රුකුලක් වීය.

sinhalaebooks.com

මේ අයුරින් පුනර්භව පර්යේෂණ ඇරඹූ වර්ජීනියා විශ්ව විද්‍යාලය පිහිටා ඇත්තේ වොෂින්ටන් නගරයේ සිට කිලෝ මීටර් සියයක පමණ දුරින් පිහිටි වර්ජිනියා ප්‍රාන්තයේ චාලට්ස්විල්හිය. සිසුන් විසි දහසක් පමණ අද අධ්‍යාපනය ලබන මෙම සරසවිය ලොව විශාලතම විශ්ව විද්‍යාල අතරින් එකකි. එහි අනෙකුත් දෙපාර්තමේන්තු අතරට පුනර්භව පර්යේෂණ සඳහා වෙන් වුණු Division Of Parapsychology යනුවෙන් හැඳින් වූ වෙනමම අංශයක් ද පවත්වාගෙන යනු ලැබේ.

Research On Reincarnation යනුවෙන් මෙම අංශය ආරම්භ කරනු ලැබුවේ මනෝ විද්‍යා පර්යේෂණ අංශයේ අධිපතිවරයා ලෙස මහාචාර්ය ස්ටීවන්සන් සේවය කළ අවදියේදීය. ලොව රටවල් රැසක සිදු කරන ලද පුනර්භව පර්යේෂණ ග්‍රන්ථ ඇතුළත් දැවැන්ත පුනර්භව පර්යේෂණ පුස්තකාලයක් ද මෙහි පවත්වාගෙන යනු ලැබේ.

sinhalaebooks.com




ෙපර භවය හෙළි කළ දරුවන්ගේ ගති සිරිත් ඔවුන්ගේ සිරුරුවල දක්නට ලැබෙන උපන් ලප පිළිබඳව සියුම් ලෙස විමර්ශනය කිරීම සඳහා සිදු කරන ඇතැම් පර්යේෂණවලට එක්ස් කිරණ (X RAY) පවා යොදා ගත් අවස්ථා ඇත. එම පර්යේෂණයට ද ශ්‍රී ලංකාවේ දරුවෙක් ඇතුළත් විය.

දරුවන්ගේ හැසිරීම් රටා පෙර භවයට සම්බන්ධ වී ඇති අයුරු සෙවීමේ පර්යේෂණ Unusual Play In Young Children Who Claim To Remember Previous Lives යනුවෙන් හඳුන්වනු ලැබේ. එමගින් දරුවන් කුඩා කල සිට සිදු කළ ඇතැම් ක්‍රීඩාවන් පවා පෙර භවයට සම්බන්ධතා ඇති බැව් තහවුරු වී ඇත. දරුවන් තුළ තිබෙන සංස්කෘතික චර්යාවන් පිළිබඳව විමර්ශනය කිරීමද මෙම

sinhalaebooks.com

පර්යේෂණ මගින් සිදු කෙරේ. Cultural Patterns In Cases Suggestive of Reincarnation යනුවෙන් හැඳින්වෙන එවැනි සාධක සියුම් ලෙස විමර්ශනය කිරීමේදී අතිශය පුදුම සාක්කි රැසක් ඉදිරිපත් වී තිබේ.

උපතින් සිරුරේ ඇති වන ලප කැළැල් සහ උපතින් ඇති වන වැරදි පිහිටීම් සහ සිරුරේ උපතින් ඇති වන අඩු පාඩු ද පෙර භවයට සම්බන්ධ වී ඇති බවට ද සාක්කි ලැබී ඇත. එවැනි සනාථ වූ සිදුවීම් රැසක් ප්‍රබල සාක්කි ලෙස වර්ජිනියා විශ්ව විද්‍යාලයේ පුනර්භව පර්යේෂණ පුස්තකාලයේදී දැක ගත හැකි වේ.

ෙමම සරසවියේ මෙනෝ විද්‍යාඥයින් විසින් සිදු කළ පර්යේෂණ රාශියක් ග්‍රන්ථ රැසකට ඇතුළත් වී ඇත.

වර්ජිනියා විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යා පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත් කළ ප්‍රථම ග්‍රන්ථය වූයේ මහාචාර්ය ස්වීටන්සන්ගේ Twenty Casses suggestive of Reincarnation නම් ග්‍රන්ථය විය. පෙර භවය හෙළි කළ දරුවන් විසි දෙනෙකුගේ ෙතාරතුරු එහි ඇතුළත් වේ. එම ග්‍රන්ථයේ ඇතුළත් සිදුවීම් වලින් ශ්‍රී ලංකාවේ දරුවන් තිදෙනකු පිළිබඳව සිදු කළ පර්යේෂණ ද සඳහන් වේ.

sinhalaebooks.com


එහි එන අනෙකුත් සිදුවීම් අතර බ්‍රසීලයේ දරුවන් දෙදෙනකු ගේ පෙර බව කතා ද ඇලස්කාවේ සිදුවීම් හතක් ද ඉන්දියාවේ සිදුවීම් හතක් සහ ලෙබනනයේ එක් දරුවකුගේ සාධකයක් ද ඇතුළත් කර තිබේ. එම ග්‍රන්ථයේ සඳහන් ශ්‍රී ලංකාවේ දරුවන් වූයේ 1956 දී උපත ලද ඥාණතිලකා 1947 දී උපත ලද විජේරත්න දරුවා සහ 1942දී උපත ලද රංජිත් යන දරුවාය.

එම සරසවියේ අනුග්‍රහයෙන් ප්‍රකාශ වී ඇති මහාචාර්ය ස්ටීවන්සන්ගේ තවත් ග්‍රන්ථ රැසක්ම ඇත. එම ග්‍රන්ථ අතර Ten Cases In India, ten Cases In Sri Lanka, Twelve Cases In Thailand And Burma, Twelve Cases In Lebanon And Turky ආදී වශයෙන් ඇති පර්යේෂණ කෘති මහත් ප්‍රසිද්ධියට පත් වී තිබේ.

මේ අතර සිරුරේ උපතින් ඇති වන ශාරීරික අඩුපාඩු (Birth Defects) පිළිබඳව පෙර භවයෙන් අනාවරණය වන සාධක ඇතුළත් දැවැන්ත ග්‍රන්ථයක් ද මහාචාර්ය ස්ටීවන්සන්ගේ පර්යේෂණ අතරට එක් වී තිබේ. පිටු දෙදහසකින් පමණ නිර්මාණය වී ඇති එම ග්‍රන්ථය Reincarnation And Biology ලෙස නම් කර ඇත. පෙර භවය හෙළි කළ දරුවන් පිළිබඳව සිදු කළ දැවැන්තම පර්යේෂණ ග්‍රන්ථය ලෙස එය ලොව මහත් කීර්තියට පත් වී ඇත.

sinhalaebooks.com






පර්යේෂණ වශයෙන් වර්ජීනියා සරසවිය අනුග්‍රහයෙන් සිදු කළ තවත් අංශයක් වූයේ මරණාසන්න අත්දැකීම් Near/death Experiences හෙවත් මරණය සිදුවන අවස්ථාවලදී ලබන අත්දැකීම් විමර්ශනය කිරීමය. මරණින් පසු සිදු වන දේ පිළිබඳව සෙවීමේ පර්යේෂණ ලෙස මෙම අත්දැකීම් අධීක්ෂණය කෙරේ.

sinhalaebooks.com

ඇතැම් පුද්ගලයන් මරණාසන්න අවස්ථා වලදී කරනු ලබන ප්‍රකාශ සහ ඔවුන් දුටු බැව් හෙළි කරන තොරතුරු මෙම මරණාසන්න අත්දැකීම්වලට ඇතුළත්ය. මරණාසන්න අවස්ථාවලදී තමන් දුටු බැව් හෙළි කරන දර්ශන අනුව සිරුරෙන් ඉවත් වී ගිය බැව්ද අත්දැකීම් ද ලැබූ ඇතැම් අය කියා සිටිති.

ඒ යටතේදී මහාචාර්ය ස්ටීවන්සන් විසින් සිදු කළ පර්යේෂණ වාර්තා රැසක් ද වර්ජිනියා විශ්වවිද්‍යාලය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. ඇතැම් විට රෝගීන් සැත්කම් සිදුවන අවස්ථාවලදී සිහිසුන්ව සිටියදී දක්නට ලැබුණු අත්දැකීම් මෙම පර්යේෂණවලින් හෙළි වේ. ශ්‍රී ලංකාවේදී එවැනි සිදුවීම් රැසක් පිළිබඳව සිදුකළ පර්යේෂණයක් ප්‍රකාශයට පත් කර ඇත.

වර්ජිනියා විශ්ව විද්‍යාලය ආරම්භ කළ මනෝ විද්‍යා පර්යේෂණ අංශය අද හැඳින්වෙන්නේ Department Of Psychiatry and Newrobehavioral Science යටතේ Division Of Perceptual Studies යනුවෙනි. එහි අධිපතිවරයා ලෙස සිටි මහාචාර්ය ස්ටීවන්සන්ගේ අභාවය 2007 වසරේදී සිදු වීමෙන් පසු නව අධිපතිවරයා ලෙස කටයුතු කරනුයේ මහාචාර්ය ජිම් ටකර්. මහාචාර්ය ජිම් ටකර් විසින්ද පෙර භවය හෙළි කළ දරුවන් රැසක් පිළිබඳව පර්යේෂණ පවත්වනු ලැබීය.

sinhalaebooks.com

ශ්‍රී ලංකාවේ සිදුවීම් කීපයක් ද නිරීක්ෂණ කිරීම සඳහා ඔහු ශ්‍රී ලංකාවට ද පැමිණියේය. අනතුරුව ඔහු විසින් ලියන ලද ග්‍රන්ථ අතර Life Before Life A Scientific Investigation Of Children's Memories Of Previous Lives සහ Return To Life Extraordinary Cases Of Children Who Remember Past Lives නම් ග්‍රන්ථද වේ.


ඇමරිකාව එංගලන්තය තායිලන්තය බුරුමය ඉන්දියාව සහ තුර්කිය වැනි රටවල් රැසක පුනර්භව සාධක මගින් ලද ප්‍රබල සාක්කි රැසක් එයට ඇතුළත් කර ඇත.

sinhalaebooks.com

# පෙර භව පරිසරය නිවැරදිව කියූ දරුවෝ

බැලුවෝ - 683 අදහස් - 0

## පෙර භවයේ ප්‍රබල සාක්ෂි




මම මැරෙන කොට හිටියෙ වහළට ටකරන් දාපු ගෙදරක. ඒ ගෙදරට යන පාරේ ලොකු ගල් තිබුණා. අපිට තිබුණේ පුංචි ගෙයක්. පෙර භවය හෙළි කළ දැරියක් පැවසුවාය. එම දැරිය උපත ලබා තිබුණේ උළු සෙවිලි නිවසකය.

මම ඉස්සර හිටපු ගෙදර ලොකු ගෙයක්. ගේ ඉස්සරහ කොළ පාට ලොකු ගේට්ටුවක් තිබුණා. ඒ ගෙදර කාමර පහයි යනුවෙන් තවත් දරුවෙක් ප්‍රකාශ කළේය.

sinhalaebooks.com

අපි හිටිය ගෙදර තට්ටු දෙකයි. මට උඩ තට්ටුවෙ වෙනම කාමරයක් තිබුණා. මේ ගෙදරට වැඩිය ඒ ගෙදර හරි ලොකුයි යනුවෙන් පෙර භවය හෙළි කළ තවත් දරුවෙක් පැවසීය.

අපි හිටපු පොල් අතුගෙදර වැහිදාට බිම තෙමෙනවා. තාත්ත පුටුවකට නැගල වහළ හදනවා. ඒ ගෙදරට ගියේ වෙල්යායක් මැද්දෙන්. පෙර භවය හෙළි කළ තවත් දැරියක් පැවසුවාය.

මම හිටපු ගෙදර වත්තෙ කොස් ගස් තිබුණා. අපි හිටියෙ උළු දාපු ලොකු ගෙදරක. ගම්පහ ප්‍රදේශයේදී උපත ලද දරුවෙක් පැවසීය.

මේ අයුරින් පෙර භවයේ ජීවත්ව සිටි නිවස අවට පරිසරය සහ නිවසේ තොරතුරු ඉතා හොඳ මතකයෙන් හෙළි කළ දරුවන් රැසක්ද පුනර්භව පර්ියේෂණ අතර සිටිති. මේ දරුවන් සියලුදෙනාම බහතෝරන වියේ සිට නිවෙස්වලට යන ගමන් මාර්ග ඉතා පැහැදිලිව අනාවරණය කළහ.

ඔවුන් උපත ලැබ සිටි නිවෙස්වල අවට පරිසරය පිළිබඳව හෝ අවබෝධයක් නොමැතිව සිටි එම දරුවෝ පෙර භවයේ වෙනත් ප්‍රදේශවල පරිසරය හෙළි කළේ දෙමාපියන් පුදුමයට පත්කරවමිනි.

sinhalaebooks.com

ඔවුන් පෙරභව නිවෙස්වලට යන ගමන් මාර්ගය නිවැරදිව අනාවරණය කිරීම විශේෂත්වයක් විය.

තහඩු නිවසක පදිංචිව සිටි බැව් අනාවරණය කළ දැරියක් උපත ලැබුවේ අවිස්සාවේල්ල ප්‍රදේශයේදීය. ඇය උපත ලබා සිටි නිවස උළු සෙවිලි කළ නිවසක් වූ අතර බහතෝරන වියට පත්ව පෙරභවය හෙළි කළාය. පෙර භවයේදී තරුණියක ලෙස ජීවත්ව සිටි බවත් පිහි ඇණුමකින් මරණයට පත්වූ බවත් ඇයට මතක තිබිණී. පෙර භවයේ දෙමාපියන් සහ සොහොයුරියන් පිළිබඳවත් හෙළි කළ එම දැරියගේ පුනර්භව පර්◌ෙයේෂණ සිදුවූයේ අසූවේ දශකයේදීය. 1987 වසරේදී උපත ලද අ◌ැය හෙළිකළ පෙරභවයේ තරුණිය මරණයට පත්ව තිබුණේ 1985 වසරේදීය.

ඇය හෙළි කළ පෙර භවයේ නිවස පිහිටා තිබූ පරිසරය පිළිබඳවද ඉතා හොඳ මතකයක් ඇයට තිබිණ. නිවසට යන ගමන් මාර්ගයේ විශාල ගල් පර්වත තිබූ බැව් අනාවරණය කළ ඇයට පෙර භව නිවස සොයා යෑමටද අවස්ථාව ලැබිණී. එම දැරියගේ පෙර භව නිවස පිහිටා තිබුණේ ඇය අනාවරණය කළ පරිදි ගල් පර්වතවලින් යුත් පරිසරයකය.

sinhalaebooks.com

පෙර භවයේ ජීවත්වූ නිවස පොල් අතු සෙවිලි නිවසක් බැව් ප්‍රකාශ කළ තවත් දැරියක උපත ලැබුවේ කුලියාපිටිය ප්‍රදේශයේදීය. 1972 වසරේදී උපත ලද ඇය පෙර භවය හෙළි කරමින් එම නිවසට රැගෙන යන ලෙස ඉල්ලා සිටියාය. ශ්‍යාමි නම් එම දැරිය පැවසුවේ පෙර භවයේදී ඇය මවක ලෙස සිටි බවකි. පොල්අතු සෙවිලි නිවසේ සිටියදී පොළොවට මැටි යොදා තිබූ බැව්ද ඇයට මතක තිබිණි. උදරාබාධයක් ඇතිවීමෙන් ඇගේ මරණය සිදුවූ බැව් පැවසූ ඇය ප්‍රකාශ කළ තොරතුරු අනුව ඇගේ මග පෙන්වීමෙන් පෙර භව නිවසට යෑමටද ඇයට හැකිවූයේ වයස අවුරුදු හතරේදීය.




නිවස සහ පිහිටි පරිසරය ඉතා හොඳ මතකයකින් හෙළි කළ තවත් දරුවෙකු උපත ලැබුවේ ගම්පහ ප්‍රදේශයේදීය. පෙර නිවස විශාල ගෙවත්තකින් යුත් බවත් එහි කොස්ගස් රැසක් තිබූ බැව්ද ඔහු කීය.

sinhalaebooks.com

මම ඉස්සර හිටපු ගෙදර කොස් ගස් ගොඩක් තිබුණා. කොස් ඇට බිම වැටිල පැළවෙලත් තිබුණා යැයි එම දරුවා ප්‍රකාශ කළේ වයස අවුරුදු තුනහමාරේදී සිටය.

පෙර භවයේ සිටි එම නිවසේදී ඔහුට වෙනමම කාමරයක් තිබූ බවත් මුහුණ බැලීම සඳහා තිබූ මේසයේ විශාල කණ්ණාඩියක් තිබූ බවත් කීය. නිවසට යන ගමන් මාර්ගයේ වෙල්යායක් පසුකර ගිය බවක්ද එම දරුවා පැහැදිලිව කීය.

එම දරුවා හෙළි කළ පරිසරය අනුව පෙරාභව නිවස සොයා ගිය දරුවාට නිවස පෙන්වාදීමට හැකිවූයේ දෙමාපියන් පුදුමයට පත් කරවමිනි. බහතෝරන වියේ සිට පෙරභව නිවස ගැන ප්‍රකාශ කළ එම දරුවා,

අපේ ගෙදර ලොකු ගෙයක්. අපි එහෙ යමු යයි මවට පැවසූ ඔහු ඒවන විට පදිංචිව සිටියේ කුඩා නිවසකය. එම දරුවා අනාවරණය කළ පෙර භවයේදී ජලභීතිකා රෝගයෙන් මරණයට පත්වූ පාසල් දරුවෙකුගේ ජීවිත තොරතුරු ප්‍රකාශ කැරිණි.

sinhalaebooks.com

පොල් අතු සෙවිලි නිවසක ජීවත්ව සිටි තවත් දරුවෙක් ඔහුද පෙර භවයේදී උළු සෙවිලි නිවසක සිටි බැව් පැවසීය. දොම්පේ ප්‍රදේශයේදී උපත ලද එම දරුවාට පෙරභව නිවස පිළිබඳව ඉතා හොඳ මතකයක් තිබිණි. පෙර නිවස පිහිටි පරිසරය හෙළි කළ ඔහුගේ පෙරභවයේදී ඉතා කුඩා වයසේදී මරණය සිදුවී තිබීම විශේෂත්වයක් විය. යන්තම් දෙපයින් ඇවිද යාමට හැකිව සිටි වයසේදී එම දරුවා මිය ගොස් ඇත්තේ ළිඳේ වැටීමක් නිසාය. සම්පත් නම් එම දරුවා ප්‍රකාශ කළේ ඔහුද පෙර සිටි නිවසේ ගෙවත්ත අසල රඹුටන් ගස් තිබූ බවය. ගෙමිදුලේ බයිසිකල් පැදගිය බවද කුඩා බයිසිකලයක් පියා විසින් ඔහුට ගෙනවිත් දී තිබූ බැව්ද අනාවරණය කළේය. පියාට හිමි වඩු මඩුවක් නිවසේ එක් කොටසක පවත්වාගෙන ගිය බැව්ද සම්පත් දරුවාට ඉතා හොඳින් මතක තිබිණි.

මෙම දරුවා අනාවරණය කළේ ඔහු ළිඳේ වැටීම නිසා මරණයට පත්වනවිට ලොකු නිවසක සිටි බවය. ඔහු හෙළි කළ තොරතුරු අනුව එම දරුවාටද පෙරභව නිවස සොයා යෑමට අවස්ථාව ලැබිණි. පෙර භවය හෙළි කළ එම දරුවා පෙරභව නිවස නිවැරදිව හඳුනා ගන්නා විට ඔහුගේ වයස අවුරුදු තුනහ මාරකි. එදා පෙරභව නිවසට ගිය එම දරුවා ලී වැඩ කිරීම සඳහා නිවසට යාබද පියාගේ ලී මඩුව තිබූ ස්ථානයද පෙන්වා දුන්නේ පෙර භවයේ දෙමාපියන් පුදුමයට පත් කරවමිනි.

sinhalaebooks.com




පෙර භවයේ පදිංචිව සිටි නිවස නිවැරදිව සොයාගත් දරුවෙකු පිළිබඳව මීට වසර කීපයකට උඩදී ගිරිඋල්ල ප්‍රදේශයෙන් වාර්තා විණි. පෙරභවය හෙළි කළ දරුවා ප්‍රකාශ කළේ කෘමිනාශක පානය කිරීමක් නිසා සිය මරණය සිදුවූ බවකි. ඔවුන් සතුව තිබූ මෝටර් රථයක් පිළිබඳවද එම දරුවාට මතක තිබිණි. විවාහක අයෙකු ලෙස සිටි බැව්ද හෙළි කළ එම දරුවා පෙරභව නිවස හඳුනා ගැනීමත් පෙර භවයේ ඥාතීන් ඇතුළු භාණ්ඩ හඳුනාගැනීමත් සිදුවූයේ එහි රැස්වූ පිරිස පුදුමයට පත්කරවමිනි.

කුඩා කල සිට එම දරුවා ප්‍රකාශ කළේ ඔහු පෙර භවයේදී ජීවත්වූ පෙරභවයේ නිවස පෙන්වා දීමට ඔහුට හැකි බවය. ඒ අනුව පෙරභව නිවසට යෑමට එම දරුවාටද එදා අවස්ථාව ලැබිණි.

sinhalaebooks.com

මහමග ගමන් කරමින් සිටියදී අතිශය පුදුම අයුරින් පෙරභවය හෙළි කළ දරුවකු පිළිබඳව මීට වසර ගණනකට උඩදී කැනඩාවෙන් අනාවරණය විය. ජිම් නම් එම දරුවාගේ පුනර්භව සාධකය පිළිබඳ එංගලන්තයේ බීබීසී ආයතනයද පර් ේයෂණ චිත්‍රපටයක්ද නිපදවීය.

කැනඩාවේදී උපත ලද එම දරුවා වයස අවුරුදු පහක් පමණ වනතුරුත් පෙරභවය පිළිබඳව කිසිදු අනාවරණයක් සිදුකර නොතිබිණි. දිනක් සිඟිති දරුවා සමග ඔහුගේ මිත්තනිය ආගමික දේවස්ථානයක් අසලින් ගමන් කරමින් සිටියාය. එම දේවස්ථානයේ පවත්වනු ලැබූ දේව මෙහෙයක් සඳහා එහි සීනුව නාද වෙමින් තිබිණි. එම හඬ ශ්‍රවනය වූ දරුවා ඒ හඬ කුමක්දැයි මිත්තනියගෙන් විමසීමක් කළේය.

මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් පැවැත්වෙන දේවමෙහෙයක් ඒ අයුරින් එහි සිදුකරන බැව් මිත්තනිය විසින් දරුවාට පැහැදිලි කළාය. එවිට දරුවාගේ ප්‍රශ්නය වූ ේය් මියගොස් ඇත්තේ කව්ද යන්නය. දේවමෙහෙය පවත්වනු ලබන මියගිය අයගේ නම දැනගෙන සිටි මිත්තනිය මියගොස් සිටි පුද්ගලයාගේ නම පැවසුවාය.

sinhalaebooks.com

වහා නතර වූ දරුවා මිත්තනිය පැවසූ නම ඔහුද ප්‍රකාශ කළේය. අනතුරුව මිත්තනිය දෙසට හැරුණු දරුවා එයා තමයි මාව මැරෙව්වේ යැයි පැවසීය. එම වදනින් තැතිගැන්මට පත්වූ මිත්තනිය දරුවාගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කළාය. සිව්දෙනෙකු එකතුවී පෙර භවයේදී ඔහු ඝාතනය කළ අයුරු දරුවා සිය මතකයෙන් හෙළි කළේය.

දරුවා හෙළි කළ තොරතුරු අනුව පෙර භවයේදී මරණයට පත්වූ පුද්ගලයා පිළිබඳව විමර්ශනයක් කිරීමට දරුවාගේ දෙමාපියන්ට අවස්ථාව ලැබිණ. මෙම දරුවා පිළිබඳව සිදුකළ පුනර්භව පර්ෙය්ෂණය 1992 වසරේදී බීබීසී ආයතනය මගින් ලොව රටවල් රැසක් ඇතුළත් කළ නිපදවූ පර්ෙය්ෂණ චිත්‍රපටයකටද ඇතුළත් කළේය.

කැනඩාවේ පුනර්භව පර්ෙය්ෂණ සිදුකළ මනෝ විද්‍යාඥවරියක වූ ඇන්ටෝනියා විසින්ද මේ පිළිබඳව පූර්ණ පර්ෙය්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව පර්ෙය්ෂණ වාර්තාවක්ද ප්‍රකාශයට පත් කළාය.

මෙම දරුවාගේ පුනර්භව සාධකය ඇතුළත්ව නිපදවන ලද පර්ෙය්ෂණ චිත්‍රපටය (IN SEARCH OF THE DEAD) යනුවෙන් නම් කර 1993 වසරේදී ලොව පුරා විකාශනය කළේය. මහමගදී දේවස්ථානයක් අසලදී පෙර භවය සිහිවූ පුනර්භව සාධකයක් ලෙස මෙම දරුවාගේ කතා පුවත පර්ෙය්ෂණ අතරට එක්වී තිබේ.

sinhalaebooks.com

පෙර භවයේ පාරිසරික ලක්ෂණ නිවැරදිව හෙළි කළ දරුවකුගේ තවත් පුනර්භව සාධකයක් මීට වසර කීපයකට උඩදී ස්කොට්ලන්තයෙන්ද හෙළි විය. එම දරුවා විසින් හෙළි කළ පෙර භවයේ ජීවත්වූ ප්‍රදේශයත් උපත ලැබූ ප්‍රදේශයත් අතර දුර සැතපුම් දෙසීයකටත් වඩා වැඩිවිය.

2000 වසරේදී උපත ලද කැමරන් නම් එම දරුවා බහ තෝරන වියට පත්වී දෙමාපියන් සමග ප්‍රකාශ කළේ ඔහු වෙනත් ප්‍රදේශයක සිට පැමිණි බවය. ඔහු ප්‍රකාශ කළ ප්‍රදේශය පිළිබඳව කිසිවිටෙකත් ඒ වන විට එම දරුවාට ශ්‍රවනය වීමක් හෝ සිදුවී නොතිබිණි. එම ප්‍රදේශය දරුවා විසින් හෙළි කරන්නේ කෙසේද යන්න ඔවුන්ට බලවත් ගැටලුවක්ද වීය.

මගේ අම්මලාට මාව නැතිවුණා යැයි පෙර භවය පිළිබඳව තොරතුරු හෙළි කරමින් එම දරුවා කියා සිටියේ පෙර සිටි නිවසේදී ගුවන්යානා පහත් කරනු දක්නට ලැබුණු බවත්ය. අනතුරුව පෙර භවයේ නිවස පිළිබඳ හෙළි කළ ඔහු එය සොයාදෙන ලෙස දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටියේය. දෙමාපියන් ඒ පිළිබඳව උනන්දු නොවීම පිළිබඳව එම දරුවා මහත් දුකට පත්ව සිටියේය.

sinhalaebooks.com

අවසානයේ එම දරුවාගේ බලකිරීම නිසාම එම තොරතුරු විමර්ශනය කිරීමට දෙමාපියෝද උනන්දු වූහ. මනෝවිද්‍යා පර්යේෂකයෝද මෙම පුනර්භව සාධකය විමර්ශනය කිරීමට ඉදිරිපත් වූහ. ඒ අනුව මෙම දරුවා හෙළිකළ ප්‍රදේශයට ඔහු කැඳවාගෙන යනු ලැබීය. දරුවා හෙළි කළ පරිසරයට ගියවිටදී ඔහු ජීවත්ව සිටි බැව් හෙළි කළ නිවස සොයාගැනීමට ඔහුට අවස්ථාව ලැබිණි.

එම නිවස දුටු විගස එම දරුවා විසින් තමා පෙර භවයේ ජීවත්ව සිටි නිවස ලෙස හඳුනාගනු ලැබීය. මෙම දරුවාගේ පුනර්භව සිදුවීම පිළිබඳව ලන්ඩනයේ සන් පත්‍රය මගින්ද පර්යේෂණ වාර්තාවක් ප්‍රසිද්ධියට පත්කළ අතර තවත් මාධ්‍ය අංශ කීපයක් මගින් මෙම කතා පුවත ප්‍රසිද්ධියට පත් කළේය.



sinhalaebooks.com

ෙහාරණ ප්‍රදේශයේදී උපත ලද දැරියක් සිය පෙරභව නිවස පිළිබඳ හෙළි කිරීමේ සිදුවීම වෙනස් මුහුණුවරක් ගෙන තිබිණි. එම දැරිය කුඩා වියේ සිට පියා අමතමින් තාත්තේ අපි ගෙයක් හදමු යැයි කියන්නට වූවාය. කුඩා දරුවන් සෙල්ලම් ගෙවල් හැදීම සිරිතක් ලෙස සිතූ පියා ඒ පිළිබඳව එතරම් උනන්දුවක් නොදැක්වීය. එහෙත් එම දැරිය දිගින් දිගටම කළ ප්‍රකාශය වූයේ ඇයට ගෙයක් සාදා දෙන ලෙසය.

ගේ හදන හැටි මම කියල දෙන්නම් තාත්තා හදන්නකෝ යිය ඇය සිය පියාට පවසන්නට වූවාය.

“ගේ හදන්නෙ කොහොමද?” යැයි පියා දියණියගෙන් පුංචි විමසීමක් කළේය.

“කෝටු අරගෙන ඒ අතර මැටි ගුළි තියල හදන්න පුළුවන්” යැයි දියණිය පැවසුවාය. කුඩා දියණියගේ ප්‍රකාශයෙන් පියා පුදුමයට පත්විය.

දියණියගේ දැනුම පරීක්ෂා කිරීමට සිතූ පියා කුඩා සෙල්ලම් ගෙයක් සෑදීමට උනන්දු විය. ඒ වනවිට සිව් වැනි වියේ පසුවූ දැරිය පියා ලවා මැටි බෝල යොදවා කෝටු කැබලි එකට බැඳි නිවසක් ඉදිකරවීය.

sinhalaebooks.com

“වහළට ටකරන්, පොළොව මැටි ගාන්න ඕනෑ” යයිද පැවසූ දැරිය ඇගේ පෙර භවය පිළිබඳ හෙළි කිරීම ආරම්භ කළාය.

“අපේ ඉස්සර ගෙදර තිබුණේ එහෙම තමයි. අපේ ගෙදර හැදුවෙත් මැටි බෝල ගහල” යයි ප්‍රකාශ කළාය. ඒ අයුරින් පෙර භවය පිළිබඳ තොරතුරු හෙළිකළ දැරිය නිවසේ පිහිටීම පවසන්නට වූයේ දෙමාපියන් පුදුමයට පත්කරවමිනි.

දියණිය ඒ වන විට මැටිවලින් නිවෙස් සාදන අයුරු කිසිදිනෙක නොදැන තිබීම මෙම පුනර්භව සාධකයේ අතිශය වැදගත් කරුණක් වීය.

දුව කවදාවත් ඒවගේ ගෙවල් හදන බවක් දැකල තිබුණේ නෑ. එදා ඒ ගේ හදන හැටි දුව උපදෙස් දුන්නේ එවැනි නිවාස හැදීම පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ඇතිවයි යනුවෙන් පියා අප සමග හෙළි කළේය.

sinhalaebooks.com

# භාවනාවෙන් පෙර භවය දුටු දෙවරක් මියගිය දැරිය

බැලුවෝ - 2325 අදහස් - 0

## පෙර භවයේ ප්‍රබල සාක්ෂි

විවාහයෙන් පසු සුදිරිංග මහතා සහ ඔහුගේ බිරිය පදිංචිව සිටියේ කුලියාපිටිය මහබද්දේගම නිවසකය. ඔවුන්ගේ වැඩිමහල් දියණිය උපත ලැබුවේ 1970 අප්‍රේල් 25 වැනිදාය. නයනා දර්ශනී යනුවෙන් ඇයට නම් තැබිණි. දුව පැන ඇවිදින වයසේ සිටිය දී ඇය මහාමාර්ගයට ගිය විට දී අධික බියක් දක්වන බැව් මවට දක්නට ලැබිණි. විශේෂයෙන්ම ඇය අධික ලෙස බියපත්වීම සිදුවූයේ මහා මාර්ගයක් හරහා ගමන් කිරීමේදීය. මව සමග පාර හරහා යාමට සිදුවූ විටෙක ඇය මවගේ ඇඟේ එල්ලී මව බදාගෙන සිටීම සිරිත වූවාය. මේ අතර ඇය තුළින් දක්නට ලැබුණු තවත් විශේෂත්වයක් විය. එනම් නිදි යහනේ දී භාවනානුයෝගීව සිටින අයුරින් ඇඳ මත හිඳ ගැනීමය. ඇය වැඩි වශයෙන්ම උදේ කාලයේදීත් රාත්‍රී කාලයේදීත් ඒ අයුරින් සිටින බැව් දෙමාපියන්ට දක්නට ලැබිණ.

sinhalaebooks.com

වයස අවුරුදු තුනක් පමණ වන විට නයනාගේ එම හැසිරීම් රටාව දිනෙන් දින වැඩිවිය. දිනක් ඒ අයුරින් ඇඳමත වාඩි වී සිටි දැරිය ඇය අසලට පැමිණි මව ඇමතුවාය. "අම්මේ මම මෙහෙම ඉන්නකොට මට ඉස්සර හිටපු දිහාව පේනවා" යයි කීවාය. සිය දියණිය පවසන්නේ කුමක්ද? මවට ප්‍රශ්නයක් මතුවිය.

"ඉස්සර හිටපු දිහාවෙ මොනවද ඔයාට පේන්ෙන්? යයි මව සිඟිති දියණියගෙන් විමසීමක් කළාය. නිහඬව කල්පනාකාරී වූ දැරිය "කතරගම හිටපු හැටි" යැයි කීවාය. ඒ වන විට කිසි දිනෙක කතරගම ප්‍රදේශය පිළිබඳව ශ්‍රවණය වීමක් හෝ කතරගම ප්‍රදේශයට හෝ ගොස් නොමැති දැරිය එසේ පවසන්නේ ඇයි ද? යන්න නැවත විමසීමට මවට සිතුනි.

"කතරගම හිටපු හැටි මොනවද පේන්නෙ?" ඒ පිළිබඳව වැඩි තොරතුරක් දැන ගැනීමට මව නැවතත් ප්‍රශ්න කළාය.
"මට තව අම්මෙකුයි තාත්තෙකුයි ඉන්නවා. තාත්තට කඩයක් තියෙනවා. ඒගොල්ලො ඉන්නෙ කතරගම දේවාලෙ ළඟ. දේවාලෙ ඝන්ඨාරෙ ගහනව ඇහෙනවා" දියණියගේ මෙම පිළිතුරෙන් පුදුමයට පත්වූ මව කතරගම ප්‍රදේශය ගැන කිසිදු අවබෝධයක් නොමැති දියණිය හෙළි කරන තොරතුරු පිළිබඳව සැමියාට ද පැවසුවාය. තවත් දින කීපයක් ගතවිය. ඇගේ කතරගම ජීවිතය ගැන නැවත නැවත අනාවරණය කරන්නට වූවාය.

sinhalaebooks.com



“කතරගම මාමා කෙනෙක් ඉන්නවා. ඒ මාමට කියන්නෙ ඩ්‍රයිවර් මාමා. ඒ මාමට ඉන්නෙ කොල්ලොම විතරයි. අපේ ගේ තිබුණොත් මාමලගෙ ගේ ළඟමයි. දවසක් මම පාර හරහා පැන්නා. එතකොට මාව කාර් එකක හැපුණා” යනුවෙන් ඇගේ මතකයට නැගෙන පෙර භව තොරතුරු කියන්නට වූවාය. එසේ පැවසූ ඇයගේ එකම ඉල්ලීම වූයේ කතරගම යෑමට අවශ්‍ය බවය. ඒ වන විට නයනා සිව්වැනි වියේ පසුවූවාය. දියණියගේ බලවත් ඉල්ලීම නිසා ඇය කතරගමට රැගෙන යාමට දෙමාපියෝ තීරණය කළහ. මේ වන විට ඇයට නිතර නිතර හිසරදයක් ඇතිවන බව ද කියා සිටියාය. ඒ සඳහා ප්‍රතිකාර කැරිණි.

**දියණිය හෙළි කළ තොරතුරු සටහනක් ද මව විසින් සකසා ගනු ලැබීය. එම සටහන වූයේ**

sinhalaebooks.com

* කතරගම හිටියා
* අම්මා ඉන්නවා
* තාත්තා ඉන්නවා
* ඒ තාත්තා මහතයි
* ගෙදරට කතරගම දේවාලෙ පේනවා
* කතරගම ඩ්‍රයිවර් මාමා ඉන්නවා
* ඩ්‍රයිවර් මාමාගෙ ගෙදර පිරිමි ළමයි ඉන්නවා
* දේවාලෙ විශාල පොල්තෙල් පහනක් තියෙනවා
* ඝාන්ඨාර හඬ ගෙදරට ඇහෙනවා
* ඩ්‍රයිවර් මාමාට කාර් එකක් තියෙනවා
* පාර හරහා පැන්නා
* එතකොට කාර් එකක හැපුනා

මේ අයුරින් දියණිය හෙළි කළ තොරතුරු අනුව පෙර නිවස සොයා ගැනීමට හැකි ද යන්න බැලීමට දෙමාපියන්ට අවශ්‍ය විය. ඒ සඳහා ඔවුහු දියණිය ද කැටුව 1974 අප්‍රේල් අටවැනිදා කතරගමට ගියහ.

එහිදී ඔවුන් විමසා සිටියේ දැරියක් මෝටර් රථයක හැපී මියගිය කඩයක් හිමි පවුලක් පිළිබඳවය. ඔවුන්ගේ විමසීම් අනුව කතරගම පදිංචිව සිටි කඩ හිමියෙකුව සිටි සුගතදාස නම් යුවළකගේ මියගිය දියණියක් පිළිබඳව ආරංචි ලැබිණි. ඒ අනුව ඔවුහු වෙළෙඳසල වෙත ගියහ. නයනා හෙළි කළ පරිදි එම වෙළෙඳසල පිහිටා තිබුණේ දේවාලයට නුදුරුවය. අනතුරුව පෙර භව නිවසට යෑමට ද ඇයට අවස්ථාව ලැබිණි.

sinhalaebooks.com

පෙර භවයේ නිවසට ගිය දැරිය මව හඳුනා ගැනීමෙන් පසු එහි තිබූ පෙර භව ඡායාරූපයක්ද හඳුනා ගත්තාය. නිවස හඳුනා ගැනීමෙන් අනතුරුව ඩ්‍රයිවර් මාමා හමුවීමත් ඇගේ පුනර්භව සාධකයේ ප්‍රබල සාක්කි බවට පත්විය. නයනා ප්‍රකාශ කළ පරිදි පෙර භවයේදී මරණයට පත්වී තිබුණේ ඇය නිවස අසල දී පාර හරහා යන විට දී කාරයක හැපීම නිසාය.

එම දැරියගේ මරණය සිදුවූ අන්දම පිළිබඳව විමර්ශනය කිරීමට අපටද අවස්ථාව ලැබිණි. එහිදී පෙර භවයේ මව ඒ පිළිබඳව අනාවරණය කළේ මෙසේය.

“එදා මට මතකයි. එදා 1963 මැයි පළමු වැනිදා දවල් දෙකට විතර ඇති. දරුවා අපේ ගේ ඉස්සරහා ඉඳල පාරෙන් අනෙක් පැත්තට ගියා. අපි ගෙදර ඉඳන් බලාගෙන හිටියා. පාරෙන් එහා පැත්තෙ කාර් එකක් නවත්තල තිබුණා. ඒ ඩ්‍රයිවර් මාමගෙ කාර් එක. ළමයා පාර හරහා ආවා. ඩ්‍රයිවර් මාමාගෙ කාර් එක නිසා පාරේ ආපු කාර් එක දකින්න නැතිව ඇති. එක පාරටම වේගෙන් ආපු කාර් එකක දරුවා හැපුණා. අපි ඉක්මනට දරුවව අරගෙන රෝහලට ගෙන ගියා. එවිට ළමයා මියගියා. ඒ දරුවව නැවත දකින්න ලැබෙන්න කියල අපි දඹදිව වන්දනාවෙත් ගිහින් ප්‍රාර්ථනා කළා” යයි පෙර භවයේ මව අප සමග ද හෙළි කළාය.

sinhalaebooks.com

ඒ අයුරින් මියගිය දැරිය නයනා ලෙස යළි ඉපදී පෙර භව දෙමාපියන් හමුවුවද ඇයට මේ භවයේ තවදුරටත් ජීවත් වීමට ලැබුණේ අවුරුදු දහ අටක් වැනි සුළු කාලයකි. දිගින් දිගටම ඇගේ හිසරදය ද පැවතිණි. ඒ වන විට නයනා උසස් පෙළ විභාගය සඳහා සූදානමින් සිටියාය.

ඇය අධ්‍යාපනය ලැබුවේ හලාවත මහා විද්‍යාලයේය. අපොස සාමාන්‍ය පෙළ විෂයයන් අටකින්ම ඇය සාමාර්ථ ලබා තිබිණි. වරින් වර ඇති වන හිසරදයට ප්‍රතිකාර ගනු ලැබුව ද රෝග නිධානයක් පිළිබඳව වෛද්‍ය මතයක් ඉදිරිපත් නොවිණි. එදා 1989 නොවැම්බර් 9 වැනිදාය. සිය නැගණිය සමග නිදි යහනේ සිටි නයනා හදිසියේම ඇදෙන් බිමට වැටුණි. අසල සිටි නැගණිය තම සොහොයුරිය නිදිබරව බිම වැටුණේ යයි සිතුවාය. මහ හඬින් සිනාසුණු නැගණිය තම සොයුරිය දැන් නැගිට එනු ඇතැයි සිතුවාය. මහ හඬින් සිනාසෙනු බාල දියණියගේ හඬ ඇසී මව කාමරයට පිවිසියාය. නයනා ඒ වන විටත් බිම වැතිර සිටියාය. වහා ඇය වෙත ගිය මව නයනා නැගිටවීමට උත්සාහ කළාය. එහෙත් ඇය නිහඬවම සිටියාය.

sinhalaebooks.com

දියණියට කිසියම් රෝගී බවක් දක්නට ලැබිණි. ඇය වහා රෝහල්ගත කැරිණි. වරින් වර සිහි ලබමින් කොළඹ මහ රෝහලේදී ඇයව ප්‍රතිකාර කිරීම ආරම්භ කැරිණි. සිහිසුන් වන තත්ත්වය මැද සති තුනක පමණ කාලයක් ඇය රෝහල්ගතව සිටියාය. අනතුරුව නිවසට පැමිණිය ද නැවතත් ඇය රෝගී විය. හරියටම දින විසි හයක් පිරෙන දිනයේදී එනම් 1989 දෙසැම්බර් 4 වැනිදා ඇය අවසන් හුස්ම හෙළීය. දෙමාපියන් සහ සොහොයුරිය බලවත් කම්පනයට පත් කරවමින් ඇය මෙලොවින් සමුගන්නා විට දහනව වැනි වියට පා තබා සිටියාය. මරණ පරීක්ෂණයේදී අනාවරණය වූයේ ඇගේ මොළයේ හටගෙන තිබූ ගෙඩියක් මරණයට හේතු වී තිබූ බවය.

නයනාගේ මළගමට සහභාගි වූ පිරිස අතර ඇගේ පෙර භවයේ දෙමාපියෝ ද පැමිණ සිටියහ. තම මියගිය දියණිය යළි ඉපදී දෙවැනි වරටත් අකාලයේ මරණයට පත්වීමේ අතිශය දුක්මුසු සිදුවීම එම දෙමාපියන්ට ද බලවත් කම්පාවට හේතු විය. පුනර්භව පර්යේෂණ ඉතිහාසයේ එවැන්නක් සිදුවූ ප්‍රථම අවස්ථාව නයනාගේ පුනර්භව සාධකය විය.

භවයන් දෙකේදීම දියණියගේ අවමංගල්‍යයට සහභාගි වීමට නයනාගේ පෙර භවයේ දෙමාපියන්ට සිදුවීම ගැන ඔවුහු දැඩි කම්පාවට පත්ව සිටියහ. මේ අතර ඔවුන්ගෙන් අනාවරණය වූ අතිශය වැදගත් ප්‍රබල සාක්ෂියක්ද විය. එනම් පෙර භවයේ දැරිය රිය අනතුරට පත්වූ අවස්ථාවේ ඇගේ හිස වැදීම නිසා මොළයට ලේ ගැලීමක් සිදුවී තිබූ බැව් අනාවරණය වීමය.



නයනාට කුඩා කල සිට වැළඳී තිබූ හිසරදය ඇතිවීමට හේතුවක් ඉදිරිපත් කිරීමට ඇය රෝහල් ගත කළ විටදී වෛද්‍ය අංශවලට දුෂ්කර වී තිබිණි. නයනාගේ හිසරදයත් ඇය අනාවරණය කළ පෙර භවයේ දැරියගේ හිසට සිදුවී තිබූ අනතුරත් අතර සබඳතාවක් දක්නට ලැබීම ද මෙම පුනර්භව සාධකයේ වැදගත් කරුණක් ලෙස නයනාගේ පුනර්භව සිදුවීම පර්යේෂණ අතරට එක්විය.

sinhalaebooks.com

නයනා ප්‍රකාශ කළ පරිදි පෙර භවයේ ඩ්‍රැයිවර් මාමා ලෙස හැඳින්වූ නිවසේ පිරිමි දරුවන් පමණක් සිටීම ද නිවැරදි විය. එදා පෙර භවයේදී අනතුරට පත්ව ඇත්තේ ද නයනාම හෙළි කළ අන්දමට නිවස අසලදී පාර හරහා ගමන් කරමින් සිටියදීම බව ද නිවැරදිය. පෙර භවයේ පියාට වෙළෙඳ සලක් තිබූ බැව් අනාවරණය කිරීම ද සනාථ විය. පෙර භවයේ පියාගේ ශාරීරික හැඩ රුව ද ඇය නිවැරදිව හෙළි කර තිබිණි. පෙර භවයේ නිවසට ගිය අවස්ථාවේ ඇගේ බයිසිකලය ගැන විමසීමත් පෙර භවයේ දැරියට බයිසිකලයක් තිබීමත් සනාථ වූ තවත් කරුණක් ලෙස දක්නට ලැබිණි. මව හඳුනාගැනීමෙන් පසු පෙර භවයේ මව සමග ඡායාරූපයකට පෙනී සිටීමට ද ඉදිරිපත් වූයේ මෙම පුනර්භව සිදුවීම පිළිබඳව ඔවුනොවුන් තුළ ඇතිවූ ප්‍රබල විශ්වාසය තහවරු කරමිනි.

sinhalaebooks.com

පෙර භවයේදී හිස තුළට ලේ ගැලීමක් සිදුවී ඇති බැව් අනාවරණය වීමත් පෙර භවය හෙළි කළ නයනාට මොළයේ ගෙඩියක් තිබූ බැව් සනාථ වීමත් මෙම පර්යේෂණයේදී දැඩි ලෙස අවධානය යොමුවූ කරුණක් ද විය. පුනර්භව පර්යේෂණවල දී මෙවැනි සාධක ඇතුළත් පර්යේෂණ වාර්තා හඳුන්වා ඇත්තේ (Interanal Dise Ases Related To Previous Lives) යනුවෙනි. මේ අතර නයනා දැරිය පෙර භවය හෙළි කිරීම සිදු කර ඇත්තේ භාවනානුයෝගී ලෙස සිටීමෙන් බැව් අනාවරණය වීම ද මෙහි තවත් වැදගත් අංශයක් විය. නයනා දැරිය භාවනානුයෝගීව සිට පෙර භවය හෙළි කළ පරිදි සිදුවීම් රැසක් පුනර්භව පර්යේෂණවලට ඇතුළත් වී තිබේ. එවැනි සිදුවීම් (Some Persons Have Seemed To Rcover Memories of Previous Lives During Meditation) යනුවෙන් සඳහන්ව ඇත. විශේෂයෙන් එවැනි සාධක කීපයක් බුරුමයේ පුනර්භව සාධක අතර ද දක්නට ලැබේ. බුරුමයේදී උපත ලද ඉන්තානු නම් දරුවෙකු පෙර භව තොරතුරු අනාවරණය කරනු ලැබුවේ භාවනානුයෝගීව සිටියදී දක්නට ලැබුණු දර්ශන මගින් බැව් සනාථ විය.

sinhalaebooks.com

Feb 26

# "එහෙදි මට උණ හැදුණා, එතකොට මම පුංචියි.." - නැටුමකින් පෙර භවය හෙළි කළ පුංචි දැරිය - Photos

7,609 Views



**මිය යාමට ප්‍රථම නැටුම් සංදර්ශනයක් නරඹලා**

**මියගොස් ඇත්තේ සරම්ප රෝගය වැළඳීමෙන්**

දඟකාර පුංචි දැරියක වූ ගිටා වයස අවුරුදු දෙකහමාරක් වන තුරු නිරෝගීව සිටියාය. ඇය උපත ලැබුවේ 1957 වසරේ දීය. ඒ වන විට ඔවුන් පදිංචිව සිටියේ ඉන්දියාවේ ගුජරාටි ප්‍රදේශයට අයත් ගමකය. ඔවුන්ගේ නිවස පිහිටියේ බැතිමතුන් යන ගිරිනර් කඳුවැටියට ආසන්නවය. එහි වාර්ෂිකව පැවැත්වෙන උත්සවය නම්කර තිබුණේ ගිර්බි උත්සවය යනුවෙනි. එම උත්සවයේ විශේෂත්වයක් වූයේ නැටුම් සංදර්ශනයක් පැවැත්වීමය. ගිටා පුංචි දැරියක් වුවද එම නැටුම් සංදර්ශනය නැරඹීමට මහත් ආශාවක් දැක්වූවාය.

මාපියන් සමඟ එය නැරඹීමට යෑම ද ඇගේ සිරිත වූවාය. අවසන් වරට ඇය එම නැටුම් දර්ශනය නැරඹුවේ වයස අවුරුදු දෙකහමාරේදී. නැටුම් දර්ශනය නරඹා මාසයක් ගතවීමෙන් පසු දිනක් ඇය රෝගී වූවාය. ඇයට තදබල ලෙස උණ රෝගය වැලඳී තිබිණි. දින කීපයක් පැවැති රෝගී තත්ත්වය සරම්ප රෝගය ලෙස හඳුනා ගැනිනි. ඇයට වෛද්‍ය ප්‍රතිකාර සිදුකළ නමුත් දින පහක් ගත වන විට අසාධ්‍ය තත්ත්වයට පත් විය. පස් වැනි දිනයේ ඇගේ මාපියන් බලාපොරොත්තු නොවූ පරිදි ඇය ජීවිතයෙන් සමුගෙන ගියාය. ඇගේ මරණය සිදුවූයේ 1959 ඔක්තෝබර් 10 වැනිදාය.

sinhalaebooks.com

ඇගේ හදිසි වියෝවීමෙන් මාපියෝ බලවත් කම්පනයට පත්ව සිටියහ. ඇගේ මරණය සිදුවී මාස දහයකුත් දින හයක් ගත විණි. ඇය ජීවත්ව සිටි ගම් ප්‍රදේශයට තරමක් දුරින් පිහිටි වෙනත් ගමක මවක් දියණියක බිහි කළාය. 1960 අගෝස්තු 14 වැනිදා උපත ලැබූ එම දැරියට රාජුල් යනුවෙන් නම් තැබිණි. මාස දොළහක් ගතවෙන විට ඇයට කතා කිරීමේ හැකියාව ලැබීම එම දැරිය තුළින් දුටු විශේෂත්වය විය. ඒ අතර ඇය යන්තම් දෙපයින් නැගිට යෑමට හැකි වීමත් සමග ඇගේ ගමන් විලාසය නර්ථන ස්වරූපයක් ගෙන තිබිණි.

ඇතැම්විට ඇය නිවස තුළ නැටුම් විලාශයෙන් ගමන් කිරීමට ද පුරුදුව සිටියාය. දිනක් ඒ අයුරින් නිවස තුළ සිටි දැරිය ඇමතූ මව "ඔයා මොකද කරන්නේ?" යැයි ප්‍රශ්න කළාය. ක්ෂණිකව පිළිතුරු දුන් දැරිය "මම නටනවා" යැයි කීවාය. ඒ සමගම ඇගෙන් තවත් වදනක් පිටවිය. "ගිරිනාර් ගිර්බි" යන එම වදන් විය. ඉන් අනතුරුව ඇය සිටි ප්‍රදේශය ගැනත් ඇගේ පෙර භවයේ නමත් අනාවරණය කළාය.

ෙදියණියගේ මෙම ප්‍රකාශ කුඩා දරුවන්ගේ සුරංගනා කතාවක් ලෙස ද මාපියෝ සිතූහ. එහෙත් ඇය නැටුම් විලාසයෙන් ඉදිරිපත් කරමින් කිසියම් ගීත කාණ්ඩයක් මුමුණන බවක් ද මවට දක්නට ලැබිණි. ඒ පිළිබඳව මව විමසූ විට ඇය දුන් පිළිතුර වූයේ ගිර්බි නැටුම් යනුවෙනි. එම නැටුම් ඉදිරිපත් කළේ නිවස අසල පිහිටි ස්ථානයක දී බැවින් ඇගේ මතකයේ තිබිණි.

ඔවුන් පදිංචිව සිටි නිවස පිළිබඳව ඉතා හොඳ මතකයක් තිබූ දැරිය ඔවුන්ගේ නිවසේ මිත්තණියක් සිටි බව ද හෙළි කළාය. ඔවුන්ට වෙළෙඳ සලක් තිබූ බවත් එහි කිරි විකිණීමට තුබූ බව ද කී දැරිය කිරි ගෙනයනු ලැබුවේ මිත්තනිය විසින් බව ද හෙළි කළාය.

ආගමික වැඳුම් පිදුම් ගැන ද ඇය අනාවරණය කරමින් කියා සිටියේ මාපියන් සමග විවිධ පූජාවන් සඳහා පූජනීය ස්ථාන වෙත ගිය බවය. ආගමික පූජාවන් පැවැත්වීම පිළිබඳවත් ඒවායේ වත්පිළිවෙත් ගැනත් එම දැරියට ඉතා හොඳ අවබෝධයක් ඇති බැව් දක්නට ලැබිණි. පෙර භවයේ දී උණ රෝගය තිබූ බවක් ද ඇය හෙළි කළාය.

sinhalaebooks.com

විශේෂයෙන් නිවසට ආසන්නව මහජනතාව පැමිණෙන පූජනීය ස්ථානයක් ඇති බැව් ද ඇය හෙළි කළාය. එය පිහිටා තිබුණේ කන්දක් මත බැව් ද ඇය නිතර කියා සිටියාය. එහිදී නැටුම් ඉදිරිපත් කළ පිරිස් බැලීමට ඇය ගිය බවත් එම නැටුම් විලාසයන් පිළිබඳවත් මේ කුඩා දැරිය අනාවරණය කළේ මාපියන් පුදුමයට පත් කරවමිනි.

මේ අයුරින් ඇය විසින් දිනෙන් දින අනාවරණය කරනු ලබන කරුණු පිළිබඳව මාපියන්ගේ අවධානය යොමු විය. ඇය කිසියම් පෙර භවයක තොරතුරු හෙළි කරන්නේ ද යන්න මාපියන්ට සිතුණි. ඇය හෙළි කළේ පෙර භවයේ දී ගීතා යනුවෙන් හැඳින් වූ බවය. ඒ සමගම ඇගේ මිතුරියකගේ නමක් ද මතකයෙන් අනාවරණය කළ දැරිය පෙරභව නිවස පිහිටා ඇති අන්දම ද හෙළි කළාය.

ඇයගේ දින චාර්යාවන් ද පවුලේ අන් දරුවන්ට වඩා වෙනස් බවක් ගෙන තිබිණි. විශේෂයෙන් ඇය හැම විටම නැටුම් විලාසයක් ඉදිරිපත් කරන්නට උත්සාහ ගන්නා බැව්ද මාපියන්ට දක්නට ලැබිණි. ඇගේ පෙරභව තොරතුරු හෙළි කිරීම පිළිබඳව පුනර්භව පර්යේෂකයෝ පිරිසක් දැඩි අවධානයක් යොමු කළහ. එහිදී අනාවරණය වූයේ ඇය හෙළි කරන පෙරභව තොරතුරු සරම්ප රෝගයෙන් මියගිය දැරියකගේ ජීවිත තොරතුරුවලට සමාන බවය.

එහිදී දැරිය ප්‍රකාශ කළ තොරතුරු අතර පෙර භවයේ දී ඇය කුඩා වියේ පසුවූ බැව් අනාවරණය කිරීම ද වැදගත් කරුණක් විය. පෙරභවයේ දී ඇගේ වයස ප්‍රමාණය පෙන්වා දෙනු ලැබුවේ දෑතින් උස ප්‍රමාණය පෙන්වමිනි.

**"එහෙදි මට උණ හැදුණා."** යනුවෙන් පැවසූ දැරිය **"එතකොට මම පුංචියි"** යනුවෙන්ද ප්‍රකාශ කළාය. නිවසේ හැඩරුවත් එය පිහිටා තිබූ පරිසරය සහ එම ප්‍රදේශයත් දැරියට ඉතා හොඳින් මතක තිබිණි. එහිදී මව විසින් පිළියෙළ කරනු ලබන ආහාර වර්ග පිළිබඳව ද ඇය හෙළි කළාය. ඒ අතර නිතර කිරි පානය කළ බැව් ද ඇගේ මතකයේ තිබිණි. පෙර භවයේ සිටිය දී නිතර නිතර පූජාවන් පැවැත්වීම සිරිත වූ බැව් ද අනාවරණය කළේ මාපියන් පුදුමයට පත් කරවමිනි.

sinhalaebooks.com

ඇයට වයස අවුරුදු පහක් වන තුරුත් මාපියෝ ඇගේ තොරතුරු විමර්ශන කිරීමට අවධානය යොමු නොකළහ. දැරිය පෙර භවය ගැන තොරතුරු හෙළි කිරීම දිනෙන් දින වැඩි විය. විශේෂයෙන්ම ඇය වැඩි වශයෙන්ම ප්‍රකාශ කළේ නැටුම් ඉදිරිපත් කරමින් වීම මාපියන්ගේ මවිතයට හේතු වී තිබිණි.

පෙර භවයේ පුද්ගල නම් කීපයක් සහ ගම් ප්‍රදේශවල නම් ද හෙළි කිරීම නිසා ඇය එම ගම් ප්‍රදේශයට කැඳවාගෙන යා යුතු යයි මාපියෝ තීරණය කළහ. ඒ අනුව ඇය හෙළි කළ ප්‍රදේශයට ඇය කැඳවාගෙන ගියහ. පවුලේ ඥාතීන්ද සමග එහි ගිය අවස්ථාවේ පෙරභව මාපියන් සහ ඥාතීන් කීප දෙනෙකුව නිවැරදිව හඳුනා ගැනීමට ඇයට අවස්ථාව ලැබිණි. ඇය අනාවරණය කළ පරිදි පෙර භවයේ දැරිය මරණයට පත්ව තිබුණේ සරම්ප රෝගය වැලඳීමෙනි.

පෙර භව නිවසට ගිය ගමන පිළිබඳවත් එහිදී සිදුවූ හඳුනා ගැනීම් ගැනත් ඉන්දීය පුවත්පත් කීපයක් ද වාර්තා පළ කළේය. 1965 නොවැම්බර් මාසයේ දී ඇගේ පුනර්භව සාධකය පිළිබඳව මහත් ප්‍රසිද්ධියක් ලැබිණි. අනතුරුව ඉන්දීය පුනර්භව පර්‍යේෂකයෙකු වූ ආචාර්ය බැනර්ජි ද ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කළේය. එම විමර්ශන තොරතුරු ඔහු විසින් පර්යේෂණ වාර්තාවකට ද ඇතුළත් කළේය. ඉන් අනතුරුව තවත් පුනර්භව පර්යේෂකයන් පිරිසක් මෙම පුනර්භව සාධකය දැඩි විමර්ශනයකට ලක්කළහ.

පෙරභවය හෙළි කළ දරුවන් අතරින් නැටුම් විලාශයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පෙරභවය හෙළි කළ ප්‍රථම දැරිය වූයේ ද ඇයය. හැසිරීම් රටාව පෙරභවය හා සම්බන්ධ බවට ඇගේ පුනර්භව සාධකය ප්‍රබල සාක්කියක් විය. මහාචාර්ය ස්ටීවන්සන් ද මෙම දැරිය පිළිබඳව සියුම් පර්යේෂණයක් පැවැත්වීය. ඉන්පසුව ඇගේ පුනර්භව සාධකය ඔහුගේ පර්යේෂණ වාර්තාවකට සහ ග්‍රන්ථයකට ද ඇතුළත් කර ඇත.

දැරිය නැටුමක් ඉදිරිපත් කරමින් පෙරභවයේ තොරතුරු හෙළි කිරීම පිළිබඳව මෙහිදී සියුම් ලෙස අවධානය යොමු කැරිණි. එහිදී සනාථ වූයේ මියගිය දැරිය මියයාමට මසකට පෙර එම නැටුම් සදර්ශනය නරඹා ඇති බවය. ඒ සමගම ඇ ගේ සොහොයුරියක් සමග ඇය නිතර නිතර ඉතා කුඩා කල සිටම එම නැටුම් සංදර්ශන නැරඹීම සිදුකළ බවය.

sinhalaebooks.com

ගිරිනර් හි පැවැති නැටුම් සංදර්ශන මියගිය දැරියට නිතර දැක ගැනීමට අවස්ථාව උදාවීමට තවත් හේතුවක් වී ඇත්තේ ඇගේ පෙරභව නිවස ඒ අසල පිහිටා තිබීම නිසාය. පෙරභවයේ දුටු දර්ශන මතකයේ තැන්පත් වී තිබීම මගින් පෙරභවය හෙළි වූ සිදුවීමක් ලෙස මෙම දැරියගේ පුනර්භව සාධකය පර්යේෂණ අතරට එක් වී ඇත.

***-තිස්ස ජයවර්ධන-***
***ලංකාදීප***



sinhalaebooks.com





sinhalaebooks.com

# ගුවන් යානා හඬට බිය වී පෙර භවය සිහිපත් කළ දැරියකගේ කතාව

මෑත පුනරුත්පත්තිය පිළිබඳ පුරෝගාමී පර්යේෂකයා වන්නේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාලයේ සේවය කළ කැනේඩියානු - ඇමෙරිකානු මනෝචිකිත්සකයකු වන ඉයන් ස්ටීවන්සනය. දශක හතරකට වැඩි කාලයක් තුළ, ස්ටීවන්සන් බටහිර හා නැගෙනහිර යන රටවල දරුවන් දහස් ගණනකගේ පුනරුත්පත්තිය පිළිබඳ අත්දැකීම් විමර්ශනය කළේය. ළමයින් විසින් සිහිපත් කරන ලද අතීත ජීවිත මතකයන් සමහරක් කලින් ජීවත් වූ පුද්ගලයකුගේ අත්දැකීමක් ලෙස සනාථ කර ඇති අතර, ඔහුගේ මරණය දරුවා විසින් වාර්තා කරන ලද හැඟීම් සමඟ සැසඳේ. සමහර විට දරුවා ඔහු හෝ ඇය හඳුනාගත් පුද්ගලයාගේ මරණය හා සම්බන්ධ උපත් ශරීරයේ කොටසක් ඇතුළු කිරීම හෝ පැහැර හැරීම හෝ මිය ගිය තැනැත්තාගේ අතේ හෝ පාදයේ අක්‍රමිකතාවක් ප්‍රබල සාක්ෂි විය.1958දී ප්‍රකාශයට පත් කරන ලද, "හිටපු අවතාරවල හිමිකම් කියන මතකයන්ගෙන් දිවි ගලවා ගැනීම සඳහා වූ සාක්ෂි" යන මාතෘකාව යටතේ, ස්ටීවන්සන් දරුවන්ගේ පුනරුත්පත්තිය පිළිබඳ කතාවලින් සාක්ෂි විශ්ලේෂණය කළ අතර, සිද්ධීන් හතක් පිළිබඳ විස්තර ඉදිරිපත් කළේය.

sinhalaebooks.com

බොහෝ විට අපැහැදිලි දේශීය සඟරා සහ ලිපිවල ළමයින් විසින් වාර්තා කරන ලද සිදුවීම් සමඟ මෙම අතීත ජීවිත සිද්ධීන් සත්‍යාපනය විය.ස්ටීවන්සන් විසින් වාර්තා කරන ලද පරීක්ෂණයකට මාටින් අවුන් මයෝ නම් බුරුම තරුණියක් සම්බන්ධ විය. දෙවැනි ලෝක යුද්ධයේදී මිය ගිය ජපන් සොල්දාදුවකුගේ පුනරුත්පත්තිය යැයි ඇය කියා සිටියාය.1942දී බුරුමය ජපන් වාඩිලා ගැනීම යටතේ පැවැතිණි. මිත්‍ර පාක්ෂිකයන් නිතරම ජපාන සැපයුම් මාර්ගවලට, විශේෂයෙන් දුම්රිය මාර්ගයට බෝම්බ හෙළීය. “නා-තුල්” ගම්මානය පුවාන් හි වැදගත් දුම්රිය ස්ථානයට ආසන්නව තිබීමද ඊට වෙනස් නොවේ. නිතිපතා පහර දීමෙන් දිවි ගලවා ගැනීමට උපරිම උත්සාහයක් දැරූ ගම්වැසියන්ගේ ජීවිතය ඉතා දුෂ්කර විය. ඇත්ත වශයෙන්ම, පැවැත්ම යනු ජපන් වාඩිලාගෙන සිටින අය සමඟ සම්බන්ධ වීමයි.යුද්ධය අවසන් වූ අතර ජීවිත යථා තත්ත්වයට පත්විය. 1953 මුල් භාගයේදී ඩෝ සිය සිවුවැනි දරුවා සමඟ ගැබ්ගෙන ඇති බව දැනගත්තාය.1953 දෙසැම්බර් 26 වැනි දින ඩෝ දියණියක බිහි කළ අතර ඇය ‘මා ටින් අවුන් මයෝ’ ලෙස හැඳින්විය. කුඩා දරුවා පරිපූර්ණ විය. ඇගේ ඉඟටිය මත මාපටැඟිලි ප්‍රමාණයේ උපත් සලකුණක් විය. දරුවා වැඩෙන විට ඇයට ගුවන් යානා ගැන විශාල බියක් ඇති බව සටහන් විය.

sinhalaebooks.com

යමෙක් උඩින් පියාසර කරන සෑම අවස්ථාවකම ඈය කලබල වී දුවන්නීය. යුද්ධය වසර ගණනාවක් තිස්සේ පැවතුණු නිසාත්, ගුවන් යානා දැන් යුද අවිවලටට වඩා හුදෙක් ප්‍රවාහන යන්ත්‍ර බවට පත්වී ඇති නිසාත් ඇගේ පියා වන යූ අයුන් මේ ගැන කුතුහලයට පත්විය. එම නිසා යානය තමාට වෙඩි තබනු ඇතැයි බිය වීම පුදුමයකි. "ඉක්මනින් ගෙදර යන්න" ඇයට අවශ්‍ය බව පවසමින් දරුවා වඩාත් ව්‍යාකූල විය. ඇයට නැවත ජපානයට යෑමට අවශ්‍ය විය. මෙය එසේ වූයේ මන්දැයි ඇසූ විට ඇය කියා සිටියේ 'නා-තුල්හි' ජපන් සොල්දාදුවකු වීම පිළිබඳ මතකයන් තමාට ඇති බවයි. ගුවන් යානයකින් මැෂින් තුවක්කු ප්‍රහාරයකින් ඇය මිය ගොස් ඇති බවත් ඇය දැන සිටි අතර ඇය ගුවන් යානාවලට මෙතරම් බිය වූයේ මේ නිසාය.මාටින් අවුන් මයෝ වයසින් වැඩෙත්ම ඇයගේ පෙර පෞරුෂත්වයේ ජීවිතයේ අතීත ජීවිත මතකයන් වෙත ප්‍රවේශ විය. ඇය පසුව ඉයන් ස්ටීවන්සන්ට පැවැසුවේ ඇයට එය මතක ඇති බවය.කලින් මතකය උතුරු ජපානයෙන් පැමිණි බවත් ඔහුට දරුවන් පස්දෙනකු සිටින බවත් වැඩිමහල් පිරිමි ළමයකු ද වන බවත්ය. ඔහු හමුදා කෝකියකු බවත් එතැන් සිට අතීත ජීවිත මතකයන් වඩාත් නිවැරදි විය. ඇය (ජපන් සොල්දාදුවා ලෙස) ෂිටිම් ගසක් අසල දර ගොඩවල් අසල සිටි බව ඇයට මතකය. කෙටි කලිසම් සහ කමිසයක් ඇඳීම ගැන ඇය විස්තර කළාය. මිත්‍ර පාක්ෂික ගුවන් යානයක් ඔහු දුටු අතර ඔහු ආවරණය සඳහා දිව ගියේය.

sinhalaebooks.com

ඔහු එසේ කරද්දී, ඉඟටියට වෙඩි උණ්ඩයක් වැදුණු අතර එය ක්ෂණිකව ඔහු මරා දැමීය. ඇය විස්තර කළේ යානයෙහි වලිග දෙකක් තිබුණු බවයි. එය පසුකාලීනව සැලකිය යුතු පුනරුත්පත්තියක් ලෙස හඳුනා ගන්නා ලදී. එය ලොක්හීඩ් පී-38 අකුණු, බුරුම ව්‍යාපාරයේ මිත්‍ර පාක්ෂිකයන් විසින් භාවිත කරන ලද ගුවන් යානයකි. ඇගේ යෞවන වයසේදී මාටින් අවුන් මයෝ සුවිශේෂී පුරුෂ ලක්ෂණ පෙන්නුම් කළාය.ඇය තම කොණ්ඩය කෙටි කොට ගැහැනු ඇඳුම් ඇඳීම ප්‍රතික්ෂේප කළාය.1972 සිට 1975 දක්වා කාලය තුළ මාටින් අවුන් මයෝ ඇගේ පුනරුත්පත්තිය පිළිබඳ මතකයන් ගැන තුන් වතාවක් සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්නේ ඉයන් ස්ටීවන්සන්ටය. තමාට කාන්තාවක් සමඟ විවාහ වීමට අවශ්‍ය බවත් ස්ථාවර පෙම්වතියක් ඇති බවත් ඇය පැහැදිලි කළාය. බුරුමයේ උණුසුම් දේශගුණයට හෝ එහි කුළුබඩු සහිත ආහාරවලට තමා කැමැති නැති බවත් ඇය පැවැසුවාය. වැඩි කැමැත්තක් දැක්වූයේ ව්‍යංජන කෑම සඳහාය. ඇය තරුණ වියේදී අර්ධ අමු මාළු අනුභව කිරීමට ප්‍රිය කළාය. මෙම මනාපය අහිමි වූයේ මාළු කටුවක් ඇගේ උගුරේ සිරවී ඇති විට පමණි.

sinhalaebooks.com

# පෙර භවයේ තාත්තා සොයන දැරියක්


බැලුවෝ - 5284 අදහස් - 0




බුදුදහමෙහි සහ හින්දු දර්ශනයෙහි පමණක් ගැබ්වී ඇති පුනර්භවය නොහොත් පුනරුත්පත්තිය ලොව පුරා පඬිවරුන් හා විද්වතුන් විසින් පිළිගැනුණු සත්‍යයකි. ඇතැම් බටහිර රටවල විශ්වවිද්‍යාලයන්හි අභ්‍යාසලාභීහු මෙය අද්විතීය විෂයයක් වශයෙන් හදාරති.

sinhalaebooks.com

# එමෙන්ම විවිධ පරීක්ෂණ මගින්ද, කුඩා දරුවන් පවසන පෙරආත්ම සිද්ධීන්ගෙන්ද, මෝහනය කිරීමෙන්ද මේ පිළිබඳව හේතු සාධක ඔප්පු කර තිබේ.



**මේ ආත්මයේ මව්පියන් දෙදෙනා සමග.**

අප රටේද මෙය ගිහි-පැවිදි විද්වතුන් අතර මහත් ආන්දෝලනයකට හා විවාදයකට ලක්වූ මාතෘකාවකි.

sinhalaebooks.com

මේ එවන් පෙරභවය පවසන වයස අවුරුදු පහ හමාරක කුඩා දැරියකගේ කතාවයි.

හතරදිලියද්ද පොලිස් බල ප්‍රදේශයේ පොල්වත්ත ග්‍රාමනිලධාරී වසමේ ඇලෝටුව ශ්‍රී විජයාරාම විහාරස්ථානය අසල නිවසක වෙසෙන විශ්‍රාමික හමුදා සැරයන් ඩබ්ලිව්.එම්.වීරකෝන් මහතාගේ සහ සේපාලිකා ආරියවසම් යන මව්පියන්ගේ තෙවන දරුවා, දර්ශනී නවන්ද්නා වීරකෝන්ය.

ඇය පූර්වාත්මය පිළිබඳ තොරතුරු පවසන්නේ යැයි අප වෙත ලත් තොරතුරක් මත වෙසක් දිනයේදී අපි ඔවුන් වෙසෙන නිවහන සොයා ගියෙමු.

ඇය සුදෝ සුදුවතින් මනාලෙස සැරසී පන්සල් ගොස් පැමිණී සිටි ඇය අප දුටු ගමන් අපවෙත පැමිණ දණ නමස්කාරකර වැඳ 'අනේ පත්තර මාමේ මාගේ තාත්තා සොයාදෙන්නැ'යි ඇවිටිලි කළාය.

කවුද තාත්තා? කොහේද ඉන්නේ? මොනවද කරන්නේ? යැයි අප ඇසූ ප්‍රශ්නයන්ට ඇගේ දඟකාර මෙන්ම සුරතල් කඩහඬ අවදි කළේ මෙසේය.

sinhalaebooks.com

'මගේ තාත්තා වික්‍රමනායක හමුදාවේ ඉඳන් ඇවිත් පේරාදෙණි



දර්ශනී නවන්දනා වීරකෝන් දැරිය.

ය විශ්වවිද්‍යාලයේ ඉගැන්නුවා. තාත්තට කළුපාට කාර් එකක් තිබුණා. පේරාදෙණිය මල්වත්ත අසල තට්ටු දෙකේ ගෙදර අපි හිටියේ. ගේ වටේටම බැම් බැඳලා, කළුපාට ගේට්ටුවක් දමා තිබුණා. පොලිස් බල්ලෙකුත් සිටියා.

sinhalaebooks.com

අපේ ගෙදර උයන්න, දර පලන්න, පොල් කඩන්නත්, කාර් එළවන ඩ්‍රයිවරුත් හිටියා. තාත්තාගේ කළුපාට කාර් එකෙන් මම නුවර හේමමාලි බාලිකාවට ගියා. එයින් පසු කොළඹ ගොස් ඉගෙන ගත්තා. මම දොස්තර කෙනෙක් කරන්න තාත්තා මහන්සි වුණා.

මම දොස්තර කෙනෙක් වෙලා මහනුවර රෝහලේ වැඩකළා. මම වැඩට යනවිට සාරි, සායවල්, කලිසම් ඇඳගෙන මගේ රතුපාට කැබ් එකෙන් ගියා. ඩ්‍රයිවර් එළවාගෙන යනවා.

පස්සේ මම අමෙරිකාවේ සුදු මහත්තයෙක් බැන්දා. ඔහුත් එක්ක අමෙරිකාවේත් ගියා. එහෙ හරි ලස්සනයි. දවස් 7 - 8 අපි එහෙ ඉඳලා එනවා. මට අංජු කියලා චූටි පුතෙකුත් හිටියා.

2003 දී මම පුතා එක්ක එන්න කැබ්එකේ යනවිට පේරාදෙණිය හංදියේදී ඉදිරියෙන් ආ බවුසරයක හැපී මම මැරුණා. මට මතක එච්චරයි.

අනේ මාමේ මට මේ දුප්පත් ගෙදර ඉන්න බැහැ. මේ අප්පච්චියි අම්මයි හොඳයි, මට ආදරෙයි. ඒත් මට තාත්තා සොයාගන්න ඕනෑ. නැත්තම් මම තාත්තා ළඟට එක්ක යන්න" යැයි කියමන් ඇය හඬන්නට වූවාය. ඇයගේ වත්මන් පියාවන විශ්‍රාමික හමුදා සැරයන් වීරකෝන් මහතා මේ ගැන කීවේ මෙබඳු කතාවකි.

sinhalaebooks.com

“මේ දුව බහතෝරන වියේ සිටම විවිධ දේවල් කියන්න පටන්ගත්තා. ඇතැම් දිනවල රාත්‍රී 12.00ට පමණ නින්දෙන් අවදි වී මගේ තාත්තා සොයාදෙන්න මගේ අංජු සොයා දෙන්න කියා අඬනවා. ඒ වෙලාවට ලොකු වෑයමක් දරලා නළවා නිදිකරනවා. ඇගේ හැසිරීම් රටාව කතාබහ අමුතුයි.

මට සරොම්, ටී ෂර්ට්, අත්කොට කමිසයක්වත් අඳින්න දෙන්නේ නැහැ. “මගේ තාත්තා අත්දිග කමිස, දිග කලිසම්, කළු සපත්තු පලඳින්නේ කියනවා.

එයාට කෑමබීම දෙන්නත් ඒ වගේමයි. නිතරම ඉල්ලන්නේ මස් - මාළු, ෆ්‍රයිඩ්රයිස්, බුරියානි වගේ දේවල් කෑම ගන්නා විට පවුලේ සියලුම දෙනා කෑම මේසයේ වාඩිවී කෑමගන්න කෑමෙන් පසු පලතුරු, යෝගට්, අයිස්ක්‍රීම්, ෆ්‍රූට්සැලට් දෙන්න ඕනෑ. ඒ වගේම එයා නිසාම වැසිකිළියත් ‘කොමඩ්’ යොදා නවීකරණය කරගන්න සිදුවුණා. කිසියම් අඩුපාඩුවක් වුණොත් මට මේ දුප්පත් ගෙදර ඉන්න බැහැ. තාත්තා ළඟට කැඳවාගෙන යන්න කියනවා.

එක් දිනක් මම බෝංචි, කැරට්, බිත්තර ෂොපින් බෑගයක දමාගෙන එනවිට බෑගය අරන් බලා ‘චී මේවා කන්න පුළුවන්ද? මෙහෙම ගෙන එන්න ලැජ්ජ නැද්ද’ කියා බෑගය පිටින්ම වත්තපහළට වීසිකළා. අපේ ගෙදර ෆ්‍රිජ් දෙකක් තිබුණා. ඒවාගේ කෑම බීම පුරවා තිබුණා යැයි කියනවා.

sinhalaebooks.com

ඇගෙන් බේරුමක් නැතිනිසාම දවසක් ඇගේ තොරතුරු අනුව පේරාදෙණියට ගොස් සොයා බැලුවා. නමුත් පලක්වුණේ නැහැ. අපි ඇයගේ ඉල්ලීම් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන්නේ නැහැ. ඇතැම් විට ඒ අය හමුවී ඒ අය සමග යාවි යන බියට.

පසුගිය ජනවාරි මස හතරලියද්ද ප්‍රාථමික පාසලට ඇතුළත් කිරීමට අයදුම්පත පුරවද්දී මට දුප්පත් පාසල්වලට යන්න බැහැ. හේමමාලී එකට යන්න ඕනෑයි කියමින් ඉල්ලුම් පත්‍රය විනාශකර දැම්මා" යැයි ඔහු පැවසීය.

# මෙම දැරියගේ මෑණියන් වන සේපාලිකා මහත්මිය මෙසේ පැවසුවාය.

"දුවගේ හැසිරීම් රටාව කතාබහ වෙනස් නිසා අපි ඇය කෙරෙහි විශේෂ අවධානයකින් සිටිනවා. පාරේ කවුරුහරි යනවා දුටුවොත් නුවරද යන්නේ? මමත් එන්නද කියා අහනවා. පාසලට, විහාරස්ථානයට යන්නේ ලොකු ආසාවකින්.

sinhalaebooks.com

එයාට සියලුම දේ ඉස්තරම්ම විදියට ඕනෑ. කනබොන දේවල් පවා එහෙමයි. පසුගිය සිංහල අවුරුද්දට ගවොම් තුනක්ම අරන් දුන්නා. ඒත් සෑහීමට පත්වුණේ නැහැ. මට මේ දුප්පත් අය සමග ඉන්න බැහැ. මට නුවර යන්න ඕනෑ' කියලාමයි නිතරම කියන්නේ.

"නෑදෑ ගෙදරක කැඳවාගෙන යන්න බැහැ. බඩු භාණ්ඩ අදිනවා. පෙරළනවා, විසිකරනවා, "ඔයා දුප්පත් ඔයා කැතයි, දුප්පතුන් ළඟ ගඳයි අපි වගේ පිරිසිදුව ඉන්න ලෙඩ හැදෙන්න් නැහැ"යි කියනවා.

අසනීපයකට ප්‍රතිකාර ගැනීමට රෝහලට ගියවිට වෛද්‍යවරයාගේ පුටුවේ වාඩිවී දොස්තර නලාව කරේ දා ගෙන කොලකෑලිවල ලියනවා. මම බෙහෙත් තුණ්ඩු ලියනවා කියමින් කොළ ඉරාදමනවා.

විවේක වෙලාවට හුදෙකලාවී පොත්වල කොළ ගණන් ලියා එයාම හරියක් දානවා. හිස් පොතක් හෝ කොළයක් හෝ අසුවුණොත් ලියනවා. ඒවා අකුරුත් නෙමෙයි. එයාගේ පියා ගත්තු පඩියෙන් වැඩි කොටසක්ම වියදම් වන්නේ මේ දුවටයි. ඉල්ලන දේ අරන් දෙන්න ඕනෑ. කෑමට ගියත්, ඇඳුම් පැළඳුම් වුණත් ඉස්තරම් විදියට දෙන්න ඕනෑ. කෑමෙන් පසු අතුරුපස ඉල්ලනවා.

sinhalaebooks.com

ගුවන්යානයක් යන හඬ ඇසුණු විට මිදුලට පැමිණ මමත් ඇමෙරිකාවට එක්ක යන්න කියමින් කෑගහනවා. මිදුලට කුරුල්ලන් පැමිණිවිට 'අනේ කුරුල්ලෝ මම දුප්පත් තැනක ඉන්නවා කියා තාත්තට කියන්න. නැතිනම් මම තටුඅස්සේ සඟවාගෙන තාත්තා ඉන්න තැනට ගෙනියන්න බැරිද? කියා අහනවා. ඇතැම් අවස්ථාවලදී අහස දෙස බලාගෙන 'අනේ මගේ තාත්තා ලැබේවා' කියමින් අඬනවා.

ඒ වගේම මගේ මහත්මයා (සුදු මහත්මයා) මගේ තාත්තා සමගින් බොක්සින් ගැහුවේ මෙහෙමයි කියමින් අයියලා අක්කලාගේ බඩට ගහනවා. මේ ආදී ඇයගේ ගතිපැවතුම්, කතාබහ, ජීවන රටාව වෙනස් කිරීමට අපි විශාල වෙහෙසක් දැරුවා. ඇයගේ තාත්තා පැමිණියහොත් ඔහු සමග යනවා කියන නිසා අපි දැඩි අවධානයකින් සිටින්නේ" යැයි ඇය පවසුවාය.

මේ දැරිය මේ වනවිට හතරලියද්ද ප්‍රාථමික විදුහලේ පළමු ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. එහි විදුහල්පති ටී. එම්. එම්. තෙන්නකෝන් මහතාගේ අවසරය මත පළමු ශ්‍රේණිය භාර ගුරුතුමිය වන දමයන්තී කටුගම්පල මහත්මිය හමුවී මේ දැරිය පිළිබඳව විමසූ විට ඒ මහත්මිය මෙසේ පැවසුවාය.

sinhalaebooks.com

'මේ දැරිය පාසලට ඇතුළත් වූ මුල් දිනවලදී නොකඩවාම හැඬුවා. අනෙකුත් සිසු සිසුවියන්ට පහර දෙන්න, හිරිහැර කරන්න පටන් ගත්තා. තදින් අවවාද කළ පසු අනෙක් පංතියේ සිටින ඇගේ සහෝදරිය ළඟට ගොස් වාඩිවෙනවා.

ඇයගේ මෑණියන් පාසලට පැමිණි අවස්ථාවක මේ දැරිය පිළිබඳව විස්තර විමසූ විට මම ඇය සමග වඩාත් හිතවත්ව කතා කරනවා. ඉන්පසු ඇය පූර්වාත්මය පිළිබඳව කියමින් තාත්තා සොයාදෙන ලෙස ඉල්ලා සිටියා.

2003 වසරේ පේරාදෙණියේ සිදුවූ හදිසි අනතුරකින් මියගිය බවත්, සැමියා සුදු මහතෙකු බවත් දරුවකු සිටිය බවත් කියන්න ගත්තා. ඇයගේ සිත දිනාගැනීමට මමත් පේරාදෙණියේ සිට එනබව කිව් පසුව මා සමග වඩාත් කුළුපගව සිටිනවා.

ඇය ඉගෙනීමටත් දක්ෂයි. නමුත් කිසිම අවස්ථාවක බලකරන්න, අවවාද කරන්න බැහැ. පංතියේ සිටියදී කොළ කැබලි කුරුටු ගා ඉරා දමමින් බෙහෙත් තුණ්ඩු ලියන බව පවසනවා. පංතියේ සිටින ළමුන් 42 අතරින් සුභාෂි දැරිය සමග පමණයි ඇසුර. මෙයා යන්නේ එන්නේ වාඩිවෙන්නෙත් එයා ළඟමයි.
තව වසරක් පමණ යනවිට ඇයගේ සිතෙන් මේවා ඈත්වී යනබවත්, මෝහනය කිරීම වැනි ක්‍රියාවන්ට පෙළැඹී ළමා මනස විකෘති නොකරන ලෙසටත් මව්පියන් දැනුම්වත් කළ බවත්" ඒ මහත්මිය අප සමග පැවසූවාය.


sinhalaebooks.com

# මව් කුසට පැමිණි හැටි යළි ඉපදී හෙළි කරති

බැලුවෝ - 1444 අදහස් - 0

## පෙරභවයේ ප්‍රබල සාක්ෂි


කතරගම හෙළිකළ දරුවා


ට්‍රැක්ටරය හෙළිකළ දරුවා

මරණින් පසු යළි ඉපදීම දක්වා සිදුවූයේ කුමක්ද? යන්න අනාවරණය වූ පුනර්භව සාධක ඉතා දුර්ලභය. ලොව පර්යේෂණවලට ලක්වූ පෙරභවය හෙළි කළ දරුවන් තුන්දහස් පන්සියයක පමණ ප්‍රමාණයකින් මව් කුසට පැමිණි අයුරු හෙළිකළ සිදුවීම් ඇත්තේ සියයකටත් වඩා අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේද එවැනි සිදුවීම් ඇත්තේ විස්සකටත් වඩා අඩුවෙනි.

sinhalaebooks.com

ඇතැම්විට පෙර භවය හෙළි කළ දරුවාගේ උපතත් පෙරභවයේ පුද්ගලයාගේ මරණයත් අතර කාලය වසර ගණනාවක් බවට ද පත් වී ඇත. එවැනි කාල පරිච්ඡේද අනුව ඔවුන් වෙනත් ජීවිතයක් හෝ කිසියම් බලවේගයක් ලෙස සිට ඇති බැව් හෙළිවේ. එවැනි පුනර්භව සිදුවීම්වලදී මරණය සහ උපත අතර ජීවිතය (INTERMEDIATE LIFE) ලෙස හැඳින්වේ. එවැනි සිදුවීම් පුනර්භව පර් ෙය්ෂණවලට ඇතුළත්වී ඇත්තේ (MISCELLANEOUS CASES OF REINCARNATION MEMORIES) යනුවෙනි.

ඒ යටතේ මරණින් පසු මව් කුස දක්වා පැමිණි අයුරු හෙළි කළ දරුවන් කීප දෙනෙක් අතිශය පුදුම තොරතුරු හෙළි කළහ. ශ්‍රී ලංකාවේ දරුවන් මහින්ද මරණින් පසු යළි උපත සිදුවීම දක්වා ගමන් මග හෙළි වූ අවස්ථා ඇත. පෙර භවයේ ජීවිතය අවසන් වීමෙන් පසු යළි මව් කුසට එන තුරු ගත කළ ජීවිතයක් හෙළි කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම දරුවා උපත ලැබුවේ බලංගොඩ ප්‍රදේශයේදීය.

මිනීමැරුමක තොරතුරු හෙළි වූ එම පුනර්භව සාධකයේ පෙර භවයේ තැනැත්තා එල්ලා මරණ ලද අයෙකු වීම විශේෂත්වයක් විය. හැ ෙට් දශකයේදී සියුම් පර් ෙය්ෂණයකට ලක්වූ එම දරුවාගේ උපත සිදුවීම ශාරීරික අඩු පාඩු සහිතව වීම ද විශේෂත්වයක් විය. 1947 වසරේදී උපත ලද එම දරුවා වයස අවුරුදු තුනේදී පෙර භවය හෙළි කළේය.

sinhalaebooks.com

පෙර භවයේදී බිරියට පිහිපහර එල්ල කර මරණය සිදු කිරීම නිසා ඔහුට මරණීය දණ්ඩනය නියම වූ බැව් එම දරුවා පැවසීය. එම මිනී මැරුම සිදු කිරීම නිසා පෙර භවයේදී ඔහුට එල්ලුම් ගස නියමව මරණය සිදුවූයේ 1928 වසරේදීය.

එහිදී පෙරභවයේ මරණයත් යළි උපත සිදුවූ දිනත් අතර කාලය වසර දහ අටක් පමණ විය. එම දරුවා පෙරභවය පිළිබඳව තොරතුරු අනාවරණය වීම ද සිදු වූයේ පුදුම උපදවන අයුරිනි. යන්තම් කතා කිරීම ආරම්භ කළ ඔහු තනිවම කතා කරමින් තම අතේ සහ පපුව ප්‍රදේශයේ පැවැති ආබාධිත තත්ත්වය ඇති වීමට හේතුව ප්‍රකාශ කිරීමය.

තම පුත්‍රයාගේ කතාවෙන් පැහැදිලි වූෙය් පෙර භවයේ බිරියගේ මරණය සිදුකර ඇති බවකි. අනතුරුව එම දරුවා පෙරභවයේ පදිංචිව සිටි ගම් ප්‍රදේශය සහ ඔහු බන්ධනාගාර ගත වූ අත්දමත් අනාවරණය කළේය. මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේදී සිදු කරනු ලබන ක්‍රියාවලියද ඔහු නිවැරදිව ප්‍රකාශ කිරීම ද විශේෂත්වයක් විය.

sinhalaebooks.com

> මරණය සිදුවීමෙන් පසු විවිධ ස්ථානවල රැඳී සිට යළි ඉපදීමට මවක් හමුවන තුරු මඟ බලමින් සිටි බැව්ද ඇතැම් දරුවන්ගේ මතකයේ තිබේ. එවැනි දරුවන් කීප දෙනෙක් ද පර්යේෂණ අතර සිටිති. පෙර භවයේ මරණින් පසු යළි උපත ලැබීමට මව් කුසක් තුළට එන තුරු ගසක අත්තක රැඳී සිටි බවක් හෙළි කළ දරුවෙක් බුරුමයේදී උපත ලැබීය. බොන්කච් නම් එම දරුවා පෙර භවය ගැන හෙළි කරමින් කියා සිටියේ ඔහු රැඳී සිටියේ උණ පඳුරක් මත බවය. පෙර භවය හෙළි කළ ඇතැම් දරුවන්ට තම මළ සිරුර ගෙන ගිය ගමන් මාර්ගයත් ඒ වන විට ඔවුන් රැඳී සිටි ස්ථානත් මතකයෙන් හෙළි කිරීමට හැකියාව තිබිණි.

මේ පිළිබඳව පර්යේෂණයක යෙදුන මහාචාර්ය ස්ටීවන්සන් සහ ෆ්‍රැන්සිස් ස්ටෝරි යන මහත්වරුන් විසින් ඔවුන්ගේ පර්යේෂණ වාර්තාවලට ද එම කතා පුවත ඇතුළත් කර තිබේ. මෙම පුනර්භව සාධකයේ උපත සහ මරණය අතර ඇති කාලයට විසඳුමක් ලෙස එම දරුවාගේ ප්‍රකාශය ප්‍රබල සාක්කියක් බවට පත්විය. මරණය සිදුවීමෙන් පසු පියාසර කිරීමේ හැකියාවක් තිබූ බැව් ඔහුගෙන් ප්‍රකාශ කෙරිණි.

sinhalaebooks.com

මරණින් පසු ගිනිගොඩකට වැටුණු ලෙස දැනුණු බවද ඔහු කීය. අනතුරුව ගසක අත්තක් මත සිටි බවක්ද ඔහුගේ මතකයේ තිබිණි. ඒ බැව් මහාචාර්ය ස්ටීවන්සන්ගේ වාර්තාවකද සඳහන් වන්නේ (HE HAD FLITTED THROUGH THE AIR AND PERCHED ON TREE TOPS AND INTERMEDIATED LIFE AS A BIRD) යනුවෙනි. යළි මිනිස් භවය ලැබීමට පළමු ඔහු කිසියම් පක්ෂියෙකු ලෙස සිටි බවට එය ප්‍රබල සාක්කියක් විය.

මේ අතර පෙර භවයේ මරණය සිදුවීමෙන් පසු එක් වරම මව් කුසට පැමිණි අයුරු හෙළි කළ දරුවෝද සිටිති. ඇතැම් දරුවන් ප්‍රකාශ කළේ මව හමුවී ඇය මඟින් උපත ලැබූ බැව්ය. තවත් දරුවෙක් පියාව හමුවී පියා සමඟින් පැමිණි බැව් අනාවරණය කළේය. රථ වාහනවල නැගී නිවසට පැමිණි අයුරු හෙළි කළ දරුවෝද සිටිති.

මරණය සිදුවීමෙන් පසු විවිධ ස්ථානවල රැඳී සිට යළි ඉපදීමට මවක් හමුවනතුරු මඟ බලමින් සිටි බැව්ද ඇතැම් දරුවන්ගේ මතකයේ තිබේ. එවැනි දරුවන් කීප දෙනෙක් ද පර්‍යේෂණ අතර සිටිති.

sinhalaebooks.com

පෙර භවයේ මරණින් පසු යළි උපත ලැබීමට මව් කුසක් තුළට එනතුරු ගසක අත්තක රැඳී සිටි බවත් හෙළි කළ දරුවෙක් බුරුමයේදී උපත ලැබීය. බොන්කච් නම් එම දරුවා පෙර භවය ගැන හෙළි කරමින් කියා සිටියේ ඔහු රැඳී සිටියේ උණ පඳුරක් මත බවය. පෙර භවය හෙළි කළ ඇතැම් දරුවන්ට තම මළ සිරුර ගෙන ගිය ගමන් මාර්ගයත් ඒ වන විට ඔවුන් රැඳී සිටි ස්ථානත් මතකයෙන් හෙළි කිරීමට හැකියාව තිබිණි.

බදුල්ල ප්‍රදේශයේදී උපත ලද දරුවකු පිළිබඳව මීට වසර ගණනකට උඩදී පර්ෙයේෂණයක් පැවැත්වීමට අවස්ථාව ලැබිණි.

ඒ වන විට තෙහැවිරිදි වියේ පසුවූ එම දරුවා පෙරභවය අනාවරණය කරමින් ට්‍රැක්ටර් රථයක් පෙරළීමෙන් මරණය සිදුවූ බැව් කියා සිටියේය. එදා අප එම දරුවාගෙන් ඒ පිළිබඳව විමසූ විට ඔහුට ඉදිරිපත් කළ ප්‍රශ්නත් ඔහු දුන් පිළිතුරුත් ඒ අයුරින්ම මෙසේය.

sinhalaebooks.com

ප්‍රශ්නය - ඔයා ඉස්සර හිටියදී මොක ද වුණේ?

පිළිතුර - ට්‍රැක්ටරය පෙරළුණා.

ප්‍රශ්නය - කොහේදීද?

පිළිතුර - වැලිමඩ දී.

ප්‍රශ්නය -කොහේ යන විටද?

පිළිතුර - මතක නෑ.

ප්‍රශ්නය - ට්‍රැක්ටරයෙ මොනවද තිබුණේ?

පිළිතුර - අල.

ප්‍රශ්නය - ට්‍රැක්ටරය එළෙව්වෙ කව්ද?

පිළිතුර - මම.

ප්‍රශ්නය - ට්‍රැක්ටරය කාගෙද?

පිළිතුර - අපේ.

ප්‍රශ්නය - ඔයාට තුවාල වුණාද?

පිළිතුර - මැරුණා.

ප්‍රශ්නය - ඊට පස්සෙ මොකද වුණේ?

පිළිතුර - මගේ මිනිය පෙරහරේ අරගෙන ගියා.

ප්‍රශ්නය - පෙරහරේ අරන් ගියේ කොහොමද?

පිළිතුර - බෙර ගගහ. පෙට්ටියක දාගෙන.

ප්‍රශ්නය - ඔයා එතකොට කොහේද හිටියෙ?

පිළිතුර - සොල්දරේ උඩ.

ප්‍රශ්නය - සොල්දරේට ආවේ කොහොමද?

පිළිතුර - ඉස්පිරිතාලෙ ඉඳලා.

ප්‍රශ්නය - ආවේ කා එක්කද?

පිළිතුර - තනියම.

ප්‍රශ්නය - උඩ තට්ටුවෙ සිටිද්දී ඔයා මොකද කළේ?

sinhalaebooks.com

පිළිතුර - මිනිය දිහා බලා හිටියා.

ප්‍රශ්නය - ඔයාව අරන් ගියේ කොහේටද?

පිළිතුර - සොහොනකට.

ප්‍රශ්නය - එතන කව්ද හිටියෙ?

පිළිතුර - මතක නෑ.

ප්‍රශ්නය - එතන සිටියදී මොකද කළේ?

පිළිතුර - ඇවිද්දා.

ප්‍රශ්නය - ඊට පස්සෙ මොකද වුණේ?

පිළිතුර - මේ අම්ම ළඟට ආවා.

ප්‍රශ්නය - අම්මා කොහේද හිටියෙ?

පිළිතුර - ගෙදර.

මේ අයුරින් පෙරභව තොරතුරු හෙළි කළ දරුවාගේ ප්‍රකාශ තුළ තිබූ ප්‍රබලතම සාක්කිය බවට පත්වූයේ ඔහු ඒ වන විට කිසිදු අවමංගල උත්සවයක් නොදැක තිබීමය. තම දරුවා මළ සිරුරක් පෙට්ටියක බහා තැබූ දර්ශනයක් ඔහු නොදැක සිටියදී මළ සිරුර පෙට්ටියක දමා තිබූ අයුරු ඔහු හෙළි කළ බැව්ද දෙමාපියෝ පැවසූහ.

බුරුමයේ පුනර්භව සිදුවීමක් හෙළි කළ දැරියකගේ ප්‍රකාශයක් මගින්ද මරණය සිදුවීමෙන් පසු මව වෙත පැමිණි අයුරු අනාවරණය විය. පුනර්භව පර්යේෂකයෙකු වූ ෆ්‍රැන්සිස් ස්ටෝරි විසින් සිදුකළ එම පර්යේෂණයේ දී දැරියගේ පෙරභව තොරතුරු සිහිවීම සිදුවී ඇත්තේද පුදුමාකාර අයුරිනි. වයස අවුරුදු හයක්ව සිටි සම්රුන් නම් එම දැරියට දිනක් මව විසින් නිවස පිරිසිදු කරන ලෙස පැවසුවාය. ඉන් කෝපයට පත් වූ ඇය,

sinhalaebooks.com

"මට මගේ ගෙදර යන්න ඕනෑ. ඒ අම්ම නම් කවදාටත් මට වැඩ කියන්නෙ නෑ" යැයි කීවාය.


මවිතයට පත් වූ මව "ඒ අම්මා කොහේද ඉන්නේ?" යැයි විමසීමක් කළාය. ඒ

එමගින් පෙර භව මතකය අවදි වූ දැරිය ඇය සිටි ගම් ප්‍රදේශය හෙළිකළාය. එහෙත් දෙමාපියෝ ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකළහ. මාස කීපයක් ගතවිණි. දිනක් දොඩම් වෙළෙළඳාමේ නියුතු කාන්තාවක් නිවසට පැමිණියාය.

ඇය දොඩම් රැගෙන පැමිණි ගම් ප්‍රදේශය හෙළි කරමින් ඒවා අලෙවි කිරීම සඳහා නිවැසියන් සමඟ කතා කළාය. එම ගම් ප්‍රදේශය ගැන ශ්‍රවණය වූ විගස අසල සිටි දැරිය ඉදිරිපත් වූවාය. වෙළෙළඳාමේ යෙදී සිටි කාන්තාව වෙත පැමිණ ඇය මා එම ගම් ප්‍රදේශයට රැගෙන යන ලෙස ඉල්ලා සිටියාය. එම කාන්තාව මඟින් දැරියගේ පෙරභව නිවස සොයා ගැනීමට අවස්ථාව ලැබිණි. පෙරභවය සනාථ වීමෙන් පසු දියණිය ඇමතූ මව,

"එහෙ ඉඳල මෙහෙ ආවේ කොහොමද?" යැයි ප්‍රශ්න කළාය. එයට පිළිතුරු දුන් දැරිය "මම ආවේ අම්මත් එක්ක බස් එකෙන්. ඔයාගෙ ඇඳුමෙ එල්ලිලා' යැයි පිළිතුරු දෙනු ලැබුවේ මව මවිතයට පත් කරමිනි. එම දැරියගේ ප්‍රකාශය පර්යේෂණ වාර්තාවකට ඇතුළත් කර ඇත්තේ.

sinhalaebooks.com




(YOU DON'T KNOW ANYTHING ABOUT IT OF COURSE I CAME WITH YOU. YOU TOOK THE BUS I HUNG ONTO YOUR CLOTH' යනුවෙනි.

හලාවත ප්‍රදේශයේදී උපත ලද දැරියක්ද පෙර භවයේ මරණින් පසු දැන් මව වෙත පැමිණි අයුරු හෙළි කළාය. ඇය පැවසුවේ පෙරභවයේදී සිය ජීවිතය අවසන් වූයේ කතරගම ප්‍රදේශයේදී සිදුවූ රිය අනතුරක් නිසා බවය. ඒ පිළිබඳව සිදු කළ පර් ෙයේෂණයේදී පෙරභව නිවෙස් සහ ඥාතීන්ද සොයා ගැනීමට ඇයට හැකි විය.

sinhalaebooks.com

යළි ඉපදීම සඳහා මව හමුවීම සිදුවූයේ කතරගම දී බැව් මෙම දැරිය ප්‍රකාශ කළාය. ඇගේ ප්‍රකාශය පිළිබඳව දෙමාපියෝ දැඩි විමර්ශනයක යෙදුණහ. එහිදී සනාථ වූ සිදුවීමක් ද අතිශය වැදගත් විය. පෙර භවය හෙළි කළ දැරියගේ උපත සිදුවීමට ප්‍රථම මව කතරගම ගියාය. එහිදී ආහාර ගැනීමට සැමියා සමඟ වෙළෙඳ සලකට ගියහ. එම වෙ ෙළඳසලේ ටික වේලාවක් නතර වී සිටි බැව් ඔවුන්ගේ මතකයේ තිබිණි. දියණිය විසින් හෙළි කළ පෙර භවයේ මියගිය දැරියගේ දෙමාපියන් වූයේ එම වෙළෙඳසල හිමිව සිටි යුවලය. මියගිය දැරිය සිටියේද එම වෙළෙඳසල පිහිටි නිවසේය. ඇගේ ජීවිත තොරතුරු නිවැරදිව සනාථ කිරීමට එදා මෙම පුනර්භව සාධකයේදී අවස්ථාව ලැබිණ.

යළි ඉපදීමට මව හමුවූයේ කෙසේදැයි එදා ඇගෙන් විමසූ විට ඇය ප්‍රකාශ කළේ ‘කතරගමදී’ යනුවෙනි. ඇගේ එම අනාවරණය කිරීම අතිශය පුදුම උපදවන්නක් බැව් දෙමාපියෝ පැවසූහ.

යළි ඉපදීම සඳහා මව වෙත පැමිණි අයුරු ඉතා හොඳ මතකයකින් හෙළි කළ දරුවකු තායිලන්තයේ සිදුකළ පර් ෙය්ෂණයක දී හමුවී ඇත. බොන්කඩ් කිච් නම් එම දරුවා විසින් හෙළි කරනු ලැබූවේ වයස අවුරුදු විස්සක් වූ තරුණයෙකුගේ ජීවිත තොරතුරුය. එම තරුණයාගේ මරණයට හේතු වූයේ කොලරාව

sinhalaebooks.com

රෝගය වැලදීමය. තම මරණය සිදුවීමෙන් පසු නිවස තුළ සිටීමට උත්සාහ ගත් බවත් එහෙත් නිවසේ පැවති දානමය පින්කමක් සිදු කිරීමට භික්ෂූන් වහන්සේ පැමිණීම නිසා නිවසින් පිටතට පැමිණි බවත් කීය. අනතුරුව තම මව නිවසින් පිටතට එනතුරු බලාසිටි බැව්ද එම දරුවා හෙළි කළේය. බොහෝ වේලාවක් ගෙමිදුලේ රැඳී සිටියදී බාල්දියක් රැගෙන කාන්තාවක් යනු දුටු විගස එම බාල්දිය තුළට පැනගත් බැව්ද පැවසීය.

අනතුරුව එම කාන්තාව සමඟ ගමන් කරන විටදී සුනඛයින් රැසක් ඇයට බිරීම නිසා ඔහු බියපත් වී බාල්දියෙන් ඉවතට පැන පාලමක් වැනි ස්ථානයක රැඳී සිට තිබේ. එම පාලම යට තිබූ ජලයෙන් කාන්තාව ස්නානය කරන තුරු ඔහු පාලම උඩ රැඳී සිට ඇය සමඟ පැමිණි බැව් කීය.

පැමිණි අයුරු එම දරුවා හෙළි කරනු ලැබුවේ. ඇගේ ගෙලේ එල්ලී බවය. ඊට පසු ඔහු මෙලොවට බිහිවීමට මව බවට පත්වූයේ එම කාන්තාව බැව් එම දරුවා අනාවරණය කළේය.

මෙම පුනර්භව පර්යේෂණයේදී පෙර භවය හෙළි කළ දරුවාගේ මවගෙන් විමසීමේදී අනාවරණය වූ ඇගේ මතකය ද එම කරුණු සනාථ කළේය.

sinhalaebooks.com

# මාරක රිය අනතුරු හෙළි කළ යළි උපන් දරුවෝ

බැලුවෝ - 1183 අදහස් - 0

## පෙර භවයේ ප්‍රබල සාක්කි




රිය අනතුරු නිසා සිදු වෙන මරණ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යන බැව් දිනපතා අසන්නට ලැබේ. රියදුන්ගේ වැරදි නිසා මෙම අනතුරු සිදු වෙන බැව් පොලිස් වාර්තාවලින් හෙළි වේ. බොහෝවිට රියදුරන්ට නින්ද යෑම නිසා අනතුරු බහුලව සිදු වෙන බැව් ද පොලිස් නිවේදනවලින් කියැවේ. දිනක සිදුවෙන රිය අනතුරු සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බවත් මේ වසර තුළ පමණක් අනතුරු දෙදහසක් පමණ සිදු වී ඇති බවත් වාර්තා වී තිබේ.

sinhalaebooks.com

පෙර භවය හෙළි කළ දරුවන් මගින්ද වැඩි වශයෙන් අනාවරණය වී ඇත්තේ රිය අනතුරු බැව් පුනර්භව පර් යේෂණාවලින් ද දක්නට ලැබේ. ශ්‍රී ලංකාව ඇතුළු රටවල් රැසක සිදු කර ඇති පුනර්භව පර් යේෂණාවලින් සියයට අසූවක් පමණ පෙර භවයේ මරණයට හේතු වී ඇත්තේ රිය අනතුරු වීම විශේෂත්වයකි. රිය අනතුරු අනාවරණය වූ රටවල් අතර වැඩි අනතුරු සංඛ්‍යාවක් පුනර්භවය සාධක අතර එක් වී ඇත්තේ ඉන්දියාවෙනි. බුරුමය සහ ලෙබනනයේ දරුවන් රැසක් ද පෙර භව මරණයට හේතුව රිය අනතුරු බැව් ප්‍රකාශ කළහ. මෙම පර් යේෂණාවල දී මරණයට හේතුව රිය අනතුර (Vehicle Accident) යනුවෙන් හඳුන්වා ඇති සිදුවීම් අනාවරණය කළ ඇතැම් දරුවන් ගේ සිරුරුවල අනතුරු සිදු වූ සිරුරේ ස්ථානවල උපතින්ම වැරදි පිහිටීම් ද දක්නට ලැබේ.

රිය අනතුරුවලින් මරණය සිදු වූ බැව් හෙළි කළ දරුවන් පිළිබඳව සිදු කළ පුනර්භව පර් යේෂණාවල දී වෛද්‍ය වාර්තා සහ මරණ පරීක්ෂණ වාර්තා ද අධ්‍යයනය කළ අවස්ථා රැසක් ඇත. ඒ අනුව ඇතැම් දරුවන්ගේ සිරුරවල දක්නට ලැබුණු ලප, කැළල් සහ ආබාධිත තත්ත්වයන් පෙර භවයේ අනතුර හා සම්බන්ධ බැව් ද දක්නට ඇත. මේ පිළිබඳව වර්ජිනියා විශ්වවිද්‍යාලයේ මනෝවිද්‍යා පර් යේෂණ අංශය මගින් සිදුකළ වර්ගීකරණයන් අනුව පෙර භවයේ මරණ සිදුවී ඇති අන්දම සමීක්ෂණය කරනු ලැබීය. පෙර භවය අනතුරුවලින් සිදු වූ බැව් හෙළි වූ දරුවන්ගේ උපන් ලප සහ සිරුරේ ආබාධිත තත්ත්වයන්

sinhalaebooks.com

පිළිබඳව සිදු කළ විමර්ශනයේ දී මෙම කරුණු අනාවරණය වී තිබේ. මහාචාර්ය ස්ටීවන්සන් විසින් සිදු කරන ලද එම පර් යේෂණ පෙර භවයේ උපන් ලප (Birthmarks Related To Previous Lifes) යනුවෙන් හඳුන්වනු ලබති.

ඒ අනුව පෙර භවය හෙළි කළ දරුවන් මගින් අනාවරණය වූ අනතුරු වෛද්‍ය වාර්තා මගින් ද තහවුරු කර ඇත. වෛද්‍ය වාර්තා අනුව පෙර භවයේ රිය අනතුරු නිසා පුද්ගලයන්ට සිදු වූ ශාරීරික තුවාල යළි උපන් දරුවන්ගේ සිරුරවල සලකුණුවලට සමාන බැව් ද තහවුරු වී ඇත. එවැනි පුනර්භව වෛද්‍ය වාර්තා මගින් සනාථ කළ තුවාල කැළල් සහ පෙර භවයේ උපන් ලප සැසඳීම (Birthmarks Corresponding To Wounds Verified BY Medical Records) යටතේ තොරතුරු පර්යේෂණ වාර්තාවලට ද ඇතුළත් කර තිබේ.

ෙපර භවයේ සිදු වූ අනතුරකින් මරණයට පත් වූ බැව් හෙළි කළ ශ්‍රී ලංකාවේ දරුවෙක් 1978 වසරේ දී උපත ලැබීය. තුසිත නම් එම දරුවා ප්‍රකාශ කළේ කඩුවෙල ප්‍රදේශයේ දී ලොරි රථයකට යටවීම නිසා මරණයට පත් වූ රාජා නම් දරුවෙකුගේ ජීවිත තොරතුරුය. මහා මාර්ගය අසල පිහිටා තිබූ එම නිවසේ ආලින්දයේ සිටි එම දරුවා නිවස තුළට ධාවනය වූ ලොරි රථයකට යට වී මිය ගියේ අතිශය කණගාටුදායක ලෙසය. එම අනතුර සිදු වූයේ 1977 ජුනි මාසයේදීය.

sinhalaebooks.com

පෙර භවයේ මරණය සිදු වී හරියටම මාස අටකට පසුව පෙර භවය හෙළි කළ දරුවා උපත ලැබීය. බහ තෝරන වියට පත් වීමෙන් පසු ඔහු සිය පෙර භව තොරතුරු ප්‍රථම වරට අනාවරණය කරනු ලැබුවේ ඔහුගේ සොහොයුරියක් සමගය. සොහොයුරිය තම මල්ලීට සැරෙන් කතා කළ අවස්ථාවක දී ඔහු ප්‍රකාශ කළේ පෙර නිවසේ සිට පැමිණි බවත් නැවත එහි යන බවත්ය.

අනතුරුව පෙර භව ජීවිත මතක සටහන අනාවරණය කරමින් කළ ප්‍රකාශ පිළිබඳව පර්යේෂණයක් පැවැත්වීමට හැකි විය. පෙර නිවසේ සිටි සොයුරු සොයුරියන් ගැනත් නිවසට යන ගමන් මාර්ගයත් නිවැරදිව ඔහු ප්‍රකාශ කළේය. ඔයාට එහෙදී මොකද වුණේ? යයි එදා එම දරුවාගෙන් විමසූ විටදී,

එහෙදි මාව ලොරියට යට වුණා යැයි නිවැරදිව එම දරුවා අනාවරණය කළේය. පෙර භවයේ දී පාසල් ශිෂ්‍යයෙකුව සිටි බව ද හෙළි කළ එම දරුවා නිවසේ තිබූ භාණ්ඩ ගැන ද ඉතා පැහැදිලිව ප්‍රකාශ කළේ. මෙම දරුවා පිළිබඳව සිදු කළ විමර්ශනයේ දී ඔහුට පෙර භව නිවසට යාමට ද අවස්ථාව ලැබිණි. නිවසට ගිය දරුවා පෙර ඥාතීන් කීපදෙනෙක් සහ නිවසේ තිබූ භාණ්ඩ කීපයකුත් නිවැරදිව හඳුනා ගත්තේය.

sinhalaebooks.com

පෙර භව ඥාතීන් හඳුනා ගැනීමෙන් පසු මරණය සිදු වී ඇති අයුරු ඥාතීහු පැහැදිලි කළහ. ලොරි රථය නිවස දෙසට ධාවනය වෙන විට මිය ගිය දරුවා ආලින්දයේ රැඳී සිටියේය. නිවසට කඩා වැඳුණු ලොරි රථයේ රෝදයකට ඔහු යට වී තිබිණි. මෙම පුනර්භව පර් යේෂණයේ දී මියගිය දරුවාගේ සොහොයුරියක් දුටු සිහිනයක් පිළිබඳව ද අනාවරණය විය. එනම් ඇය නගරයට ගිය විට දී මිය ගිය මල්ලි හමු වී ඇය සමග නිවසට එන අයුරු ඇය සිහිනෙන් දැක තිබීමය.

පෙර භවයේ දී කාරයක හැපීම නිසා මරණය සිදු වූ බැව් හෙළි කළ දැරියක් ද මීට වසර ගණනකට උඩ දී මාදම්පේ දී උපත ලැබීය. ඇය පැවසුවේ කතරගම මාර්ගයක දී පාර හරහා ගමන් කිරීමේ දී මෝටර් රථයක ගැටුන බවය. ඒ වන විට කුඩා දැරියක් ලෙස සිටි බැව් ද ඇයට මතක තිබිණි.

එදා මම ගෙදර පැත්තේ ඉඳලා පාර හරහා ගියා. එතකොට මාව කාර් එකේ හැපුණා යි ඇය අනාවරණය කළේ වයස අවුරුදු තුනේදීය. පෙරභවයේ දෙමාපියන් සහ ඥාතීන් කීප දෙනෙක් පිළිබඳව ද ඇයට මතක තිබිණි. මෙම දැරියගේ පෙර භව ජීවිතය විමර්ශනය කිරීමේදී ඇය හෙළි කළ පරිදි පෙර භවයේ දී ජීවිතය අවසන් වී ඇත්තේ කාරයක හැපීම නිසා බැව් සනාථ විය.

sinhalaebooks.com

අධිවේගී මාර්ගයක දී පෙර භවයේ රිය අනතුරක් සිහි වූ දරුවෙක් තුර්කියේ දී උපත ලැබීය. එම දරුවා පෙර භවය හෙළි කිරීමේ සිදු වීම පිළිබඳව දරුවාගේ මව පුදුමයට පත් වූවාය. සේලන් නමැති එම දරුවා ඒ වෙන විට වයස අවුරුදු දෙකහමාරක පසු විය. ඔහු උපත ලැබුවේ 1963 පෙබරවාරි මාසයේදීය.

දිනක් මව සමග අධිවේගී මාර්ගයක පාලමක් මතින් ගමන් කරමින් සිටි දරුවා එක් වරම මහ හඬින් හඬන්නට විය. ඒ පිළිබඳව මව විමසූ විට ඔහු කියා සිටියේ එම අධිවේගී මාර්ගයේ මෝටර් රථය පදවා ගෙන යන විට දී ඔහු මරණයට පත් වූ බවය. එම අනතුර සිදු වූ අන්දම ද ඔහුගේ මතකයට නැගී තිබිණි. අධිවේගී මාර්ගයේ කෙටි තාප්පයක් පෙන් වූ ඔහු තම මෝටර් රථය එම කෙටි තාප්පයේ වැදීම නිසා එදා සිදු වූ මාරක අනතුරෙන් රථයේ සිටි අනෙක් අය ද දරුණු ලෙස තුවාල ලැබූ බැව් ප්‍රකාශ කළේය.

එතැන් සිට වරින් වර තම පෙර භව තොරතුරු හෙළි කළ දරුවා ඔහුට බිරියක් සිටි බවත් දරුවන් බැලීමට යාමට අවශ්‍ය බවත් පෙර සිටි නිවෙස සහ එම ප්‍රදේශය ද හඳුන්වන නම් හෙළි කරමින් කියා සිටියේය. දරුවා ඉපදීමට සුළු කලකට උඩ දී එම ස්ථානයේ සිදු වූ රිය අනතුරක් මව දැන සිටිය ද එහිදී මිය ගිය පුද්ගලයෙක් පිළිබඳව නොදැන සිටියාය. තම පුත්‍රයා එම අනතුර පිළිබඳ හෙළි කරන බැව් ඇයට වැටහුණු නමුත් ඇය ඒ ගැන එතරම් අවධානයක් යොමු නොකළාය.

sinhalaebooks.com

මාස කීපයක් ගත විණි. දරුවාගේ පෙර භව ප්‍රකාශ වැඩි වෙන්නට විය. ඔහු තම පෙර භවයේ නම ද හෙළි කළේය. වරින් වර ඔහු හෙළි කරන තොරතුරු ප්‍රදේශයේ ද පතළ විය. අධිවේගී මාර්ගයේ දී රිය අනතුරකින් මිය ගිය අබ්දුල් නම් අයෙකුගේ බිරියට ද එම කතාව අසන්නට ලැබිණි. ඒ අනුව ඇය පෙර භවය හෙළි කළ දරුවා සොයා පැමිණියාය. එහිදී බිරිය සමග පැමිණි ඥාතීන් කීප දෙනෙකු හඳුනා ගැනීමට ද එම දරුවාට එදා හැකි විය. අබ්දුල් මරණයට පත් වූ අනතුර සිදුව තිබුණේ රාත්‍රී කාලයක දී ඉදිරියෙන් පැමිණි මෝටර් රථයක අධි විදුලි ආලෝකයක් නිසා බැව් ද මේ පිළිබඳව සිදුකළ පර් යේෂණයේ දී හෙළිවිය. පෙර භවයේ මරණය සිදුව ඇත්තේ දරුවා ඉපදීමට මාස තුනකට පමණ උඩදීය. මෙම පුනර්භව පර්යේෂණය සිදු කළ මහාචාර්ය ස්ටීවන්සන් ඔහුගේ පර්යේෂණ ග්‍රන්ථයකට ද එය ඇතුළත් කළේය.

රිය අනතුරක් නිසා මරණයට පත්වූ තරුණයෙකු ඔහුගේ පෙම්වතිය ලෙස සිටි කාන්තාවකගේ කුසයෙන් යළි ඉපදීමේ සිදුවීමක් වසර ගණනකට උඩදී ඇමරිකාවෙන් හෙළිවිය. වෝල්ටර් නම් දහ අට හැවිරිදි තරුණයෙක් දැන හඳුනගෙන සිටි තරුණියක හා පෙම් සබඳතාවක් පවත්වාගෙන ගියේය. ඔවුන්ගේ පෙම් පුවත පවුල් දෙකේම දෙමාපියන්ට ද රහසක් නොවීය. විවාහ ගිවිස ගැනීමට දෙමාපිය ආශිර්වාදය ද ලැබ සිටි ඔවුන්ට විවාහයට කිසිදු බාධාවක් නොතිබිණි. ඉක්මනින් විවාහ වීමට මෙම පෙම්වතුන් තීරණය කර සිටියහ.

sinhalaebooks.com

පෙම්වතා විනෝදකාමී පුද්ගලයෙක් විය. නිතර නිතර මිතුරන්ගේ ප්‍රීති උත්සවවලට යන ඔහු බොහෝ විට තම පෙම්වතිය ද ඒවාට රැගෙන යාම ද සිරිත විය. ඇතැම්විට එවැනි ප්‍රීති උත්සවවලදී ඔහු මත්පැන් පානයට ද හුරුවී සිටියේය. මත්පැන් පානය නොකරන ලෙස පෙම්වතිය ඔහුට අවවාද කිරීමද සිරිතය. ඇතැම් විට පෙම්වතිය නොමැතිව යන විටදී මිතුරෙකු සමග ඔහු ප්‍රීති උත්සවවලට සහභාගි වන්නේය.



ලොරි අනතුර

එදා 1967 මාර්තු 7 වැනිදාය. තම පෙම්වතිය සමග විවාහ වීමට තිබුණේ සති කීපයකි. එදිනද ඔහු මිතුරෙකු සමග තවත් මිතුරෙකුගේ ප්‍රීති උත්සවයකට සහභාගිවීමට ගියේය. මධ්‍යම රාත්‍රිය දක්වා විනෝද වූ ඔවුන් මත්පැන් ද පානය කර තිබිණි. සිය පෙම්වතිය හමුවීමට යාමට ද තීරණය කළ පෙම්වතා සිය මිතුරා ද සමගින් මෝටර් රථයෙන් පිටත් විය. එහෙත් ඔවුන්ට යාමට හැකිවූයේ කෙටිදුරකි. දැඩි නිදිමත බවකින් සිටි ඔහුට සුක්කානම මතදී නින්ද ගියේය. පදවාගෙන ගිය රථය පාරෙන් ඉවතට විසිවී ගොස් ඔහුගේ ගෙලට ද දැඩි හානි සිදුවී එයින් මරණයට පත්විය.

sinhalaebooks.com

එහෙත් රථයේ සිටි මිතුරාගේ ජීවිතය බේරුණේය.

සිය පෙම්වතාගේ හදිසි වියෝවීම නිසා පෙම්වතිය දැඩි කම්පාවට පත්ව සිටියාය. කාලය ගෙවී ගියේය. පෙම්වතිය වෙනත් තරුණයකු සමග විවාහ ජීවිතයට ඇතුළත් වූවාය. විවාහයෙන් පසු ඔවුන්ට දියණියක් ලැබිණ. දෙවසරක් පමණ ගතවිය. දිනක් එම මව සිහිනයක් දුටුවාය. ඇය දුටුවේ මිය ගිය පෙම්වතා ඇය වෙත පැමිණ ඇය අමතන අයුරුය. මම ආයෙත් එනවා යයි එම ප්‍රකාශය විය. නැවත ඉපදීමක් පිළිබඳව කිසිදු අවබෝධයක් නොමැතිව සිටි මවට නැවතත් දරුවෙකු පිළිසිඳ ගැනීමක් සිදුවිය. ඇය එවර බිහි කළේ පිරිමි දරුවෙකි. එම දරුවා බහ තෝරන වියට පත්වී මව සමග සිය පෙර භවය අනාවරණය කළේය.

මිතුරෙකු සමග මෝටර් රථයකින් යන විට දී සිදුවූ රිය අනතුර ඔහු අනාවරණය කළේය. රථයේ සිටි මිතුරාගේ නමත් අනතුර සිදුවූ ස්ථානයත් ඔහු නිවැරදිව අනාවරණය කළේය. දරුවාගේ හැසිරීම් රටාවත් මියගිය පෙම්වතාගේ හැසිරීම් රටාවත් අතර දැඩි සබඳතාවක් පවතින බැව් ද මවට දක්නට ලැබිණි. මිය ගිය පෙම්වතා ඇගේ කුස තුළින් යළි උපත ලබා ඇතැයි පිළිගැනීමට ඇයට සිදුවිය. මෙම පුනර්භව සාධකය ද මහාචාර්ය ස්ටීවන්සන් විසින් ලියන ලද (CHILDREN WHO REMEMBER PREVIOUS LIVES) නම් පර් යේෂණ වාර්තාවකට ඇතුළත් කර තිබේ.

sinhalaebooks.com

එක්දහස් නමසිය හැත්තෑ හයේදී උපත ලද දරුවෙක් ද රිය අනතුරකින් මරණයට පත්වූ බැව් ප්‍රකාශ කළේය. කුමාර නම් එම දරුවා ප්‍රකාශ කළේ ඔහු පදවාගෙන ගිය ට්‍රැක්ටර් රථය අනතුරකට පත්ව මරණය සිදුවූ බවකි. මෙම දරුවාගේ දෙමාපියන් හෙළි කළ පරිදි ඔහු පෙර භවය පිළිබඳ කරුණු අනාවරණ කර ඇත්තේ වයස අවුරුදු තුනේ පමණ සිටය.

ඔහුට වෙනත් මවක් සිටින බැව් පෙර භවය පිළිබඳව කරුණු අනාවරණය කළ ඔහුගේ ප්‍රථම වදන වී තිබිණි. ඔවුන් දෙමහල් නිවසක පදිංචිව සිටි බවත් එළවළු රැගෙන ට්‍රැක්ටරයේ ගිය බවත් ඔහු හෙළි කළේය. පෙර භවයේ දී සිටි ගම් ප්‍රදේශය වැලිමඩ ලෙස පැවසූ බැව් ද මව අප සමග හෙළි කළාය.

ට්‍රැක්ටර් රථය අනතුරට පත්වීම සිදුවූ අවස්ථාවේ ඔහුගේ පපුව ප්‍රදේශය දරුණු ලෙස තුවාල සිදුවීම නිසා ඔහු රෝහල්ගත කළ බවත් එහිදී මරණය සිදුවූ බවත් ඔහුට මතක තිබිණි.

මෙම දරුවාගේ පුනර්භව පර් යේෂණයේ දී ඔහු හෙළි කළ අතිශය පුදුම කරුණක් ද වැදගත් ප්‍රකාශයක් විය. එනම් මරණය සිදුවීමෙන් පසු ඔහු බස් රථයක නැගී දැන් නිවසට පැමිණි බවකි. එහි පැමිණ සිටිය දී ඔහුගේ මළ සිරුර ගෙන යෑම සඳහා සූදානම් කරන විටදී බෙර හඬ ද ඔහුට ශ්‍රවණය වූ බව එම දරුවා ප්‍රකාශ කළේය.

sinhalaebooks.com

පෙර භවයේ දී වෑන් රථයක ගැටීමෙන් මරණය සිදුවූ බැව් හෙළි කළ දර්ශන නම් දරුවෙක් ද මීට වසර ගණනකට උඩ දී කොළඹ දී උපත ලැබීය. එම දරුවා ප්‍රකාශ කළේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ දී රිය අනතුරකින් මිය ගිය පාසල් දරුවෙකුගේ ජීවන තොරතුරුය. පෙර භවයේ සිය මිත්තනියට ආහාර රැගෙන බයිසිකලයකින් යමින් සිටිය දී ඔහු මරණයට පත්වූයේ වෑන් රථයක ගැටීමෙනි. පැදගිය බයිසිකලය පෙරළී පාරේ සිටියදී වේගයෙන් ධාවනය වූ වෑන් රථයක් ඔහු යටකර යාම නිසා මරණය සිදුවූ බැව් සනාථ විය. මෙම දරුවා පෙරභව තොරතුරු හෙළි කිරීම ආරම්භ කරනු ලැබුවේ ද වයස අවුරුදු දෙකහමාරේ පමණ සිටය.

ට්‍රැක්ටරයක් පිළිබඳව අනාවරණය කරමින් පෙර භවයේ සිදුවූ අනතුරක් හෙළි කළ තවත් දරුවෙක් උපත ලැබුවේ 1979 වසරේදීය. කුරුණෑගල රෝහලේ දී උපත ලද උපුල් නම් එම දරුවා ප්‍රකාශ කළේ පෙර භවයේ දී අනුරාධපුරයේ ජීවත්ව සිටි බවය. කුඩා කලදී මව විසින් ඔහුට ගෙන දුන් සෙල්ලම් ට්‍රැක්ටරයකට අධික බියක් දක්වන බැව් මවට දක්නට ලැබිණි. ඒ පිළිබඳව විමසීමේදී ඔහු ප්‍රකාශ කළේ අනුරාධපුර සිටියදී ට්‍රැක්ටර් අනතුරක් සිදුවූ බවය.

sinhalaebooks.com

අනුරාධපුරයේ සිටිය දී විවාහක පුද්ගලයෙකු බව ද පැවසූ එම දරුවා අනාවරණය කළ පෙර භවයේ ඥාතීන් හමුවීමට ද එම දරුවාට හැකියාව ලැබිණි. පෙර භවයේ බිරිය හඳුනා ගැනීම ද මෙම දරුවාගේ පුනර්භව සාධකයේ ප්‍රබල සාක්කියක් විය. පෙර භවයේ දී මරණයට පත්වූයේ 1966 වසරේ දී බැව් ඒ පිළිබඳව සිදුකළ පර් යේෂණයේ දී අනාවරණය විය.

sinhalaebooks.com

# අප්‍රේල් කැරැල්ල හෙළි කළ යළි උපන් දරුවෝ

බැලුවෝ - 1310 අදහස් - 0




එක්දහස් නවසිය හැත්තෑ එකේ කරැල්ල අනාවරණය කරමින් පෙර භවයේ හෙළිකළ දරුවන් රැසක් පුනර්භව පර් යේෂණ අතරට එක්වී සිටිති. පොලිස් සහ හමුදාව සමඟ සටන් කළ බවත් වෙඩි පහරවලට ගොදුරු වී මිය ගිය බවත් එම දරුවෝ අනාවරණය කළහ. ඔවුන්ගේ ප්‍රකාශ අනුව පෙර භවයේදී ජීවත්ව සිටි බැව් හෙළිවූයේ

sinhalaebooks.com

**ඇල්පිටිය, ගාල්ල, අනුරාධපුර, කළුතර සහ කෑගල්ල යන ප්‍රදේශවලය. වෙඩි ප්‍රහාරවලින් මියගිය බැව් හෙළි කළ එම දරුවන් බොහෝ දෙනෙකුගේ සිරුරුවල දක්නට තිබූ උපන් ලප ඇති ස්ථානවලට වෙඩි වැදුණු බැව්ද ඔවුහු පැවසූහ.**

ශ්‍රී ලංකාවෙන් මේ වන විට අනාවරණය වී ඇති පුනර්භව සාධක තුන්සිය පනහක පමණ දරුවන් පිරිසකගෙන් කැරලි සමය හෙළි කළ දරුවන් විසි දෙනෙක් පමණ සිටිති. වයස අවුරුදු දෙකහමාරේ පමණ සිට එම දරුවෝ පෙර භව තොරතුරු අනාවරණය කළහ. බහ තෝරන අවදියටත් ප්‍රථම මෙම දරුවන් තුළින් දක්නට ලැබුණු හැසිරීම් රටාවන්ද දෙමාපියන්ගේ පුදුමයට හේතු වී තිබිණි.

ඇතැම් දරුවෝ පොලිස් සහ හමුදා නිල ඇඳුම් දකින විට බියට පත්වී නිවෙස් තුළ සැඟවීමට උත්සාහ කළහ. තවත් දරුවෝ එවැනි හමුදා ඇඳුමින් සැරසී සිටින අය දුටු විගස ඔවුන්ට පහර දිය යුතු යැයිද ප්‍රකාශ කළහ. 1971 කැරැල්ල අනාවරණය කළ දරුවන් රැසක් හැත්තෑවෙ දශකයේදී පර් යේෂණවලට ලක්වූහ.

එවැනි පුනර්භව සාධක ගණනාවක් වර්ජිනියා විශ්වවිද්‍යාලයේ පර් යේෂණ අංශයේද වාර්තා ගතවී තිබේ. ඉන් වැඩි කොටසක් පර් යේෂණ සඳහා මහාචාර්ය ස්ටීවන්සන් ඇතුළු විදේශීය පර් යේෂකයෝද ශ්‍රී ලංකාවට වරින් වර පැමිණියහ.

sinhalaebooks.com

අනතුරුව ඔවුන්ගේ පර් යේෂණ වාර්තා සහ ග්‍රන්ථවලටද ඇතුළත් කර තිබේ. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියාවන් හෙළි කළ දරුවන් පිළිබඳව (INSURGENTS AS PREVIOUS PERSONALITIES IN SRI LANKA) යනුවෙන් වර්ජිනියා විශ්වවිද්‍යාලයේ පර් යේෂණ පුස්තකාලයේද වාර්තා කර තිබේ.

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී කැරලි සමය හෙළි කළ දරුවන් කීප දෙනකුගේම ඔවුන් අනාවරණය කළ පෙරභව පුද්ගල ජීවිත සනාථ වූ සිදුවීම් රැසක්ම ඇත. ඉන් අතිශය පුදුම අයුරින් සනාථ වූ පුනර්භව සාධකය හෙළි කළ දරුවන් දෙදෙනෙක් ගාල්ල ප්‍රදේශයේදී උපත ලැබූහ. නිවුන් දැරියන් දෙදෙනකු ලෙස ඔවුන් උපත ලැබුවේ 1978 වසරේදී වූ අතර ඔවුන් දෙදෙනාම හෙළි කළේ කැරලි සමයේදී මරණයට එක් වූ තරුණයන් දෙදෙනකුගේ ජීවන තොරතුරුය.

එම දැරියන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ සිරුරේ දක්නට තිබූ පැහැදිලි උපන් ලපයක් පෙන්වමින් එම ස්ථානයට වෙඩි වැදුණු බැව් හෙළි කළාය. අනෙක් දැරිය අනාවරණය කළේ පිළිස්සීමට ලක් වී මරණය සිදුවූ බවය.
එම දැරියන් දෙදෙනා පිළිබඳව මහාචාර්ය ස්ටීවන්සන් දින ගණනාවක් තිස්සේ සියුම් පර් යේෂණයක් සිදු කළේය. එහිදී ඔවුන්ගේ පෙරභව දෙමාපියන් සහ ඥාතීන් කීප දෙනෙක්වද නිවැරදිව හඳුනා ගැනීමට ඔවුන්ට හැකිවිය. එම දැරියන් අනාවරණය කළ තරුණයන් දෙදෙනා මරුමුවට

sinhalaebooks.com

පත්ව තිබුණේ 1971 අප්‍රේල් 19 වැනිදාය මෙම පුනර්භව සාධකයේ දක්නට තිබූ විශේෂත්වය වූයේ පෙරභවයේදී දැඩි මිතුරන් ලෙස සිටි තරුණයන් දෙදෙනකු නිවුන් සොයුරියන් ලෙස උපත ලබා තිබීමය.

එම දැරියන්ට ඔවුන්ගේ පෙරභවයේ හැඳින් වූ නම් ඉතා පැහැදිලිව මතකයේ තිබීමද විශේෂත්වයක් විය. පෙර භවයේදී වෙඩි පහර සහිත උපන් ලපය තිබූ දැරියට ඉදිරිපත් කළ ප්‍රශ්නත් එම දැරිය දුන් පිළිතුරුත් පර් යේෂණ වාර්තාවලට ඇතුළත් වී ඇත්තේ මෙසේය.

ප්‍රශ්නය - ඔයාට එහෙදී මොකද වුණේ?

පිළිතුර - වෙඩි වැදුණා

ප්‍රශ්නය - කොහොමද වෙඩි වැදුණේ?

පිළිතුර - පොලිසියෙන්

ප්‍රශ්නය - වෙඩි වැදුණේ කොහේදීද?

පිළිතුර - තුවක්කු පෙන්වන්න කන්දට ගියාම. වෙඩි තිබ්බා

ප්‍රශ්නය - වෙඩි වැදුණේ කොහේටද?

පිළිතුර - පපුවට

එසේ හෙළි කළ දැරිය ඇගේ පපුව ප්‍රදේශයේ දක්නට තිබූ උපන් ලපයට අත දිගු කර පෙන්වනු ලැබුවාය. මේ අයුරින් සනාථ වූ එම දැරියන්ගේ පුනර්භව සාධකයේ පෙර භව ජීවිත ලෙස ජොනී

sinhalaebooks.com

සහ රොබට් නම් තරුණයින් දෙදෙනකුගේ ජීවන තොරතුරු බැව් පැහැදිලි විය. ඒ බැව් මහාචාර්ය ස්ටීවන්සන් විසින් මේ පිළිබඳව ඇතුළත් ග්‍රන්ථයේ දැක්වෙන්නේ (THE FAMILIES OF ROBERT AND JOHNNY FULLY ACCEPTED THE TWINS AS BEING THESE YOUNG MEN REBORN) යනුවෙනි.

පෙර භවයේදී කැරැල්ලට සම්බන්ධව සිටි බැව් හෙළි කළ තවත් දරුවකු උපත ලැබුවේ අනුරාධපුර ප්‍රදේශයේදීය. ලාල් නම් වූ එම දරුවා පැවසුවේ පෙර භවයේදී ජීවත්ව සිටියේ ඔත්තප්පුව නම් ප්‍රදේශයක බැව්ය.
මම එහෙදී කැලේ හැංගිල හිටියා. අම්මයි, නංගියි ගෙදර හිටියා. එහෙ කන්ද පිටුපස්සේ තුවක්කු හංගල තිබුණා යැයිද ඉතා කුඩා අවදියේදී ඔහු ප්‍රකාශ කළේය. මිතුරන් කීප දෙනෙකු සමඟ එකතු වී සිටි බවක්ද හෙළි කළ ඔහු පැවසුවේ රාජාංගණය පොලිසිය සමඟ ගැටුමක් ඇති වූ බවත් එම ගැටුමේදී වෙඩි පහරකට ලක් වූ බවත් අනතුරුව මරණ සිදු වූ බවත් එම දරුවාට මතක තිබිණි.

පොලිස් නිලධාරීන් දුටුවිට මහත් බියකින් නිවසේ සැඟවීමට උත්සාහ කිරීමද මෙම දරුවා මගින් දක්නට ලැබුණු විශේෂත්වය විය. ඔහුගේ හෝ මිතුරන් කිසිවකුගේ පුද්ගල නම් මෙම දරුවා වෙතින් අනාවරණය නොවිණි. එහෙත් පියා පිළිබඳව මතකය අවදි කළේය.

sinhalaebooks.com

එහෙදී අපේ තාත්තා ගොවිතැන් වැඩ කළා. අපිට හරක් ගාලක් තිබුණා. එදා පොලිසිය ළඟදී කලබල වෙන කොට බස් දෙකකුත් ආවා. මට වෙඩි වැදුණේ පිට පැත්තට. වෙඩි උණ්ඩය මගේ ඇඟට ඇතුළු වුණා. එතකොට මට වයස විස්සක් විතර ඇති. යනුවෙන් එම දරුවා පවසන විට ඔහුගේ වයස අවුරුදු තුනකි.

පෙර භවයේදී කැලේට ගිහින් කණ්ඩායමක් සමඟ සිටි බැව් හෙළි කළ තවත් දරුවකු උපත ලැබුවේ ගම්පහ ප්‍රදේශයේදීය. එම දරුවා පිළිබඳව පර් යේෂණයක් පැවැත්වීමට අප හමුවන විට එම දරුවා පැවිදි ජීවිතයකට ඇතුළත්ව සිටියේය. ඒ වන විට පෙරභව පිළිබඳව ඉතා හොඳ මතකයක් තිබූ පොඩි හාමුදුරුවෝ පැවසුවේ ඔහු තරුණ වයසේ කල්ලියක් සමඟ එකට සිටි බැව් මතකයේ ඇති බවය.

මම එතකොට අපොස විභාගයට ඉගෙන ගත්තා. ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ ඉගෙන ගත්ත බැව් මතකයි. ඉස්කෝලෙ ඇරිල ඇවිත් අපි කැලේට යනවා. එහෙදී අයියල අපි හමුවෙනවා. තුවක්කු ගැනත් අපිට කියා දුන්නා. මගේ තාත්තා මැරිලා. අම්මා කන්තෝරුවක වැඩ කළා යැයිද පෙර භවය හෙළි කරමින් පොඩි හාමුදුරුවෝ අප සමඟ එදා පැවසූහ.

sinhalaebooks.com

මිය යෑමට සති ගණනකට උඩදී වරක් පොලිස් කූඩුවක සිටි බවක්ද මතකයේ තිබිණි. මරණය සිදු වූ අයුරු අප විමසූ විට එයට පිළිතුරු දුන් පොඩි හාමුදුරුවෝ මෙසේ පැවසූහ.

"අම්මා එපා කියද්දී තමයි මම එදා කැලේට ගියේ. වෙඩි හඬක් ඇසුණා. ඒ සමඟම බෝම්බ පුපුරනවා වගේ හඬ ඇසුණා. අපේ යාළුවෝ බිම වැටුණා. මම නැගිටින්න හැදුවා, ඒත් නැගිටින්න බැරි වුණා"

එදා පොඩි හාමුදුරුවන් අනාවරණය කළ පරිදි කණ්ඩායමක් ලෙස සිටියදී වෙඩි ප්‍රහාරයකට හෝ බෝම්බ ප්‍රහාරයකට ලක්වී මරණ සිදුවී තිබිණි. වසර ගණනකට පෙර සිදු කළ පර්යේෂණයේදී පොඩි හාමුදුරුවන් කුඩා කල ප්‍රකාශ කළ තොරතුරු උන්වහන්සේගේ මව විසින් ලිඛිතව සටහන් කර තිබිණි.



වෙඩි පාරේ උපන් ලපය

sinhalaebooks.com

පොලිසියට බියෙන් කැලයේ සැඟවී සිටියදී කෑමට ආහාර නොමැතිවීම නිසා දිවුල් ගැට කෑ බව හෙළි කළ දරුවෙක්ද කැරැල්ල අනාවරණය කළේය. එම දරුවා උපත ලැබුවේ ඇල්පිටියේදීය. පෙර භවයේදී රිදීගම ප්‍රදේශයේ ජීවත්ව සිටි බැව් මෙම දරුවාට මතක තිබිණි.

අපි ඉස්සර හිටියේ රිදීගම. මුහුදු වෙරළක් අපේ ගේ ළඟ තිබුණා. අපේ අක්කට එහේ කඩයක් තිබුණා යැයිද හෙළි කළ එම දරුවා ඔවුන්ට මෝටර් රථයක් තිබූ බවත්, එය සුදු පැහැති වර්ණයෙන් යුක්ත බවත් කීය.
පුද්ගල නම් වශයෙන් එම දරුවාගේ මතකයේ තිබුණේ නිමල් යනුවෙන් හැඳින් වූ සොහොයුරෙකුගේ නම පමණි. ඒ වන විට ඔහු තරුණ වියේ පසු වූ බැව් ඔහු පැවසුවේ අපි කොල්ලො තුන් හතර දෙනෙක්ම එදා වෙඩි පහර වැදිල මැරුණා යනුවෙනි.

කුලියාපිටියේදී උපත ලද දරුවෙක්ද මීට වසර ගණනාවකට උඩදී පෙර භවය හෙළිකරමින් කැරැල්ල සිහිපත් කළේය. ඔහුගේ පියාට ඇඳුම් මැසීමේ ස්ථානයක් තිබූ බැව් පැවසූ එම දරුවාද ඔවුන් සැඟවී සිටියදී විශාල පිපිරීම් හඬක් ඇසුණ බැව් කීය.

sinhalaebooks.com

දින ගණනක් ආහාර නොමැතිව සැඟවී සිටි බැව්ද ඔහුගේ මතකයේ තිබිණි. ඉස්සර ගෙදර ඉන්න කොට මට වයස අවුරුදු දහයයි. තම මිතුරකුගේ පියා පොලිස් නිලධාරියකු බවත්, පිපිරීම හඬත් සමඟ තම උදර ප්‍රදේශය තුවාල සිදුවනු දුටු බවත් කීය. අවසන් දින කීපය කුසගින්නේ සිටි බැව් පැහැදිලි කළ එම දරුවා ඒ බැව් අනාවරණය කළේ මෙසේය.

අපිට ඒ දවස්වල කන්න ලැබුණේ නෑ. මගේ බඩගින්න නිවුණේ මේ අම්මගෙන් කිරි බිව්වට පස්සේ යැයිද ප්‍රකාශ කළේ දෙමාපියන් මවිතයට පත් කරවමිනි.

පොලිස් පහරදීමක් හෙළි කළ පිරිමි දරුවෙක් පෙර භවයේදී ජීවත්ව සිටි ගම් ප්‍රදේශය ලෙස කුකුළාවල යන ගමක් හෙළි කළේය. කණ්ඩායමක් ලෙස සිටියදී ඔවුන් අතර භික්ෂූන් වහන්සේ නමක්ද සිටි බැව් මෙම දරුවා හෙළි කළේය. එම දරුවා උපත ලැබුවේ 1978 වසරේදීය. පෙර භවයේ සිටි ගම් ප්‍රදේශ ලෙස ඇල්පිටිය සහ බළපිටියද ඔහු විටෙක පැවසීය.

sinhalaebooks.com

වයස අවුරුදු තුනේදී පෙරභවය හෙළි කළ මෙම දරුවාගේ ප්‍රථම ප්‍රකාශ වූයේ 'පොලිසියෙන් වෙඩි තිබ්බා' යනුවෙනි. මේ පිළිබඳව සිදු කළ පර්යේෂණයේදී මහාචාර්ය ස්ටීවන්සන්ගේ වාර්තාවකටද ඇතුළත් කර ඇත.
'ONE DAY HE SAID APPARENTLY QUITE SPONTANEOUSLY THAT HE HAD BEEN SHOT BY THE POLICE AT BALAPITIYA, HE HAD MENTIONED THAT HE WAS IN A GROUP AND THERE WAS A MONK IN THEIR GROUP THE MONK HAD ALSO BEEN KILLED AS WELL AS HIMSELF' යනුවෙන් එම දරුවාගේ ප්‍රකාශයක් සඳහන් කර තිබේ.

මොරටුව ප්‍රදේශයේදී උපත ලද දරුවෙක් කැරැල්ල සඳහන් කරමින් පොලිස් වෙඩි පහරකට ලක්ව මරණය සිදු වූ බැව් ප්‍රකාශ කළේය. එම දරුවා සිය පෙර භවය අනාවරණ කිරීමේ සිදුවීම දෙමාපියන් පුදුමයට පත් කළේය.
ඒ වන විට එම දරුවාට වයස අවුරුදු දෙකක් පමණ විය. තැපැල්කරු නිවසට එන විට ඔහු අධික බියක් දක්වන බැව් දෙමාපියන්ට දක්නට ලැබිණි. කුඩා දරුවන් ඇතැම් විට නාඳුනන පුද්ගලයින්ට දක්වන බියක් ලෙස එම දරුවාගේ බියපත් වීම සිදුවන්නේ යැයි දෙමාපියෝ සිතුහ. මාස කීපයක් ගතවිණි. ඉතා හොඳින් කතා කිරීමට හැකි වයසේ එළැඹිණි. දිනක් තැපැල්කරු පැමිණි විටදී ඔහුට දරුවා ගලකින් පහර ගැසීය.

sinhalaebooks.com

“ඇයි පුතේ එහෙම කළේ?” යැයි මව පුංචි දරුවාගෙන් විමසුවාය. ඔහුගේ ක්ෂණික පිළිතුර වූයේ,

“එයා තමයි අපිට වෙඩි තිබ්බේ” යනුවෙනි. අපිට වෙඩි තියන කොට ඔය ඇඳුම තමයි ඇඳගෙන හිටියෙ යැයි ඔහු පැවසීය.

මේ පිළිබඳව සිදු කළ පර් යේෂණයේදී පොලිස් නිල ඇඳුමක් ලෙස තැපැල්කරුගේ කබාය හඳුනාගෙන දරුවා එසේ ක්‍රියා කළ බැව් දෙමාපියෝ පැවසූහ. අනතුරුව පොලිස් නිලධාරීන් දුටු විට නිවසේ සැඟවීමේ පුරුද්දක්ද ඔහු තුළින් දක්නට ලැබුණ බැව්ද එදා දෙමාපියෝ අප සමඟ අනාවරණය කළහ.


ත්‍රස්තවාදී භීෂණ සමයේදී මේ අයුරින් මරණයට පත් වූ දරුවන් රැසකගෙන් ඔවුන්ගේ මිතුරන්ගේ හෝ ඥාතීන්ගේ පුද්ගල නම් ප්‍රකාශ නොවීමද විශේෂත්වයක් විය. එහෙත් ඔවුන් වැඩි දෙනකු හෙළි කළ පරිදි වෙඩි වැදීම් සහ බෝම්බ ප්‍රහාරවලින් සිදු වූ අනතුරු ලෙස පෙන්වා දුන් උපන් ලප කැළැල් රැසක් සිරුරුවල පිහිටා තිබීමද විශේෂත්වයක් විය.

sinhalaebooks.com

# මළ සිරුර සමග ගිය හැටි හෙළි කළ දරුවෝ

බැලුවෝ - 2063 අදහස් - 0

**පෙර භවයේ ප්‍රබල සාක්කි**





sinhalaebooks.com

**පෙර භවය හෙළිකළ ඇතැම් දරුවෝ යළි උපත ලැබූ නිවස වෙත පැමිණි අයුරු අනාවරණය කරති. ඔවුන්ගේ මළ සිරුර නිවසින් හෝ රෝහලෙන් රැගෙන යන විට ඔවුන්ද ඒ සමග ගමන් ගත් බැව් හෙළි කළ සිදුවීම්ද තිබේ. සිරුර ආදාහනය හෝ භූමදානය සඳහා ගෙන ගිය විට ඔවුන්ද ඒ සමග සිටි බැව්ද ඇතැම් දරුවෝ පවසති. කිසි දිනෙක අවමංගල්‍ය පෙරහරක් නොදුටු දරුවෙකු ඔහුගේ සිරුර බෙර වයමින් රැගෙන ගිය හැටි හෙළි කළේ වයස අවුරුදු තුනේදීය.**

මේ අයුරින් මළ සිරුර ගෙන ගිය අන්දම හෙළිකළ දරුවෙක් ඒ සමග ගොස් යළි ඉපදීම සිදුවූ නිවසට පැමිණි බැව්ද ප්‍රකාශ කළේය. මළ සිරුර අසල නෑදෑ හිතවතුන් හඬා වැලපුණ අයුරුද ඇතැම් දරුවෝ අනවාරණය කළේ ඔවුන්ගේ නම් පිළිබඳව ද හෙළි කරමිනි. එවැනි සිදුවීම් හෙළි වූ පුනර්භව සාධක කීපයක්ම ඉන්දියාව තායිලන්තය සහ ශ්‍රී ලංකාවේ පර්ෙයේෂණ අතරද දක්නට ඇත.

තම මළසිරුර බෙර වයමින් පෙරහරේ ගෙන ගිය අයුරු අනාවරණය කළ දරුවෙකු උපත ලැබුවේ බණ්ඩාරවෙල ප්‍රදේශයේදීය. යන්තම් බහ තෝරණ වියට පත් වූ එම දරුවා පැවසුවේ ඔහු රිය අනතුරකින් මරණයට පත් වූ බවකි. පසුව ඔහුගේ සිරුර පෙරහරක් මගින් සුසාන භූමිය වෙත රැගෙන ගිය බැව් පැවසීය.

sinhalaebooks.com

1980 වසරේදී පර්යේෂණයක් සිදු කළ මෙම දරුවාගේ ප්‍රකාශය අතිශය පුදුම උපදවන සුලුවිය. සිරුර පෙට්ටියක තැන්පත් කර තිබූ අයුරුද මෙම දරුවා පැහැදිලිව අනාවරණය කළේය. ඒ වන විට මළ සිරුරක් තැන්පත් කර ඇති දර්ශනයක් එම දරුවා විසින් දැක නොතිබීම පෙරභවය පිළිබඳව ප්‍රබල සාක්කියක් විය.

මීට වසර කීපයකට උඩදී තායිලන්තයේ පුනර්භව සාධකයක් මගින් හෙළි වූ දරුවෙක් ප්‍රකාශ කළේ සිරුර වෑන් රථයකින් ගෙන ගිය බවකි. එම වෑන් රථය සමඟ ගමන් කර යළි උපත සිදුවූ මවගේ නිවසට පැමිණි බැව් අනාවරණය කළේය. ගැහැනු දරුවකු වූ ඇය පිළිබඳව පූර්ණ පර්යේෂණයක් පැවැත්වූයේ වර්ජිනියා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ජිම් ටකර් විසිනි. පුනර්භව පිළිබඳව ප්‍රධාන පර්යේෂකයෙකු වූ මහාචාර්ය ජිම් ටකර් එම පර්යේෂණ අංශයේ අධිපතිවරයාද වේ.

පෙරභවය හෙළි කළ දරුවන් රැසක් පිළිබඳව පර් යේෂණ වල නිරත වී පර්යේෂණ වාර්තා සහ ග්‍රන්ථ කීපයක්ද මේ වන විට ඔහු ප්‍රකාශයට පත්කර ඇත. පුනර්භව සාධක ඇතුළත් රටවල් රැසක සිදුවීම් විමර්ශනය කර ලියා ඇති එම ග්‍රන්ථ නම් කර ඇත්තේ (Life Before Life) සහ (Return To Life) යනුවෙනි.

sinhalaebooks.com

මළසිරුර රැගෙන ගිය වෑන් රථය පිටුපස ගමන් කළ බැව් හෙළි කළ එක් දැරියක් උපත ලබා ඇත්තේ තායිලන්තයේදීය. එම දරුවා පෙරභවය අනාවරණය කරනු ලැබුවේ වයස අවුරුදු දෙකේ පමණ සිටය. දිනක් මව සමඟ සිටි දරුවා එක්වරම මව අමතා

"මට ගෙදර යන්න ඕනෑ" යැයි කීය. නිවසේ සිටි දරුවා කළ එම ප්‍රකාශය මවගේ පුදුමයට හේතු විය. නිවසේ සිටින දරුවා ගෙදර යන්නට ඕනෑ යයි කරන ප්‍රකාශය ගැන විමසීමක් කළ මව "ඔයාගේ ගෙදර තමයි මේ ඔයා කියන ගේ කොහේද තියෙන්නේ?" යයි මම විමසුවාය.

එයට පිළිතුරු දුන් දරුවා ඔවුන් පදිංචි ප්‍රදේශයෙන් කිලෝමීටර් දහයකට පමණ දුර ගමක් ගැන අනාවරණය කළේය. අනතුරුව පෙරභවයේ ජීවිත තොරතුරු හෙළි කළ ඇය පෙර භවයේදී නමද අනාවරණය කළේ මව පුදුමයට පත් කරවමිනි.

ඇයට ඩෙංගු රෝගය වැලඳීමෙන් පසු රෝහල් ගත කළ බැව් හෙළි කළ එම දැරිය එම රෝහල පිහිටි ප්‍රදේශයද හෙළි කළාය. එම රෝහලේදී මරණයට පත් වු බැව් පැවසූ දැරිය ඇගේ සිරුර වෑන් රථයකින් ගෙන ගිය බැව්ද පැවසුවාය. සිරුර වෑන් රථයේ දමා ගෙන රැගෙන යන විට ඇයද ඒ පිටුපසින් ගිය නමුත් වෑන් රථය අල්ලා ගැනීමට නොහැකි වූ බවද හෙළි කළාය.

sinhalaebooks.com

වෑන් රථය මග හැරීමෙන් පසු සැතපුම් ගණනක් ගිය අ◌ැයට මාර්ගය අසල තිබූ නිවසක් දක්නට ලැබුණු බවත් එම නිවස දැන් මව සිටි නිවස බවත් කීවාය. අනතුරුව මවගේ කුසයෙන් උපත ලැබූ බවත් හෙළි කළාය. මෙම තොරතුරු හෙළි කළ දැරිය ඇයට පෙර භවයේ නිවසට යෑමට අවශ්‍ය බැව් කියමින් දැඩි ලෙස හඬන්නට වූවාය. ඇතැම් විට මුළු දවස පුරාම ඇය හඬන්නට වූවාය.

වසර කීපයක් ගත විය. දිනක් මාපියන් සමඟ වන්දනා ගමනක් සඳහා බස් රථයකින් තවත් පිරිසක් සමඟ මාපියන් ද සමග ඇය හෙළි කළ ගම් ප්‍රදේශයට ගියාය. එහිදී නිවසක සිටි කාන්තාවක් දුටු දැරිය එම කාන්තාව ඇගේ පෙර භවයේ මව ලෙස හඳුනා ගත්තාය.

එම කාන්තාවගේ දියණියක් ඩෙංගු රෝගයෙන් මරණයට පත් වූ බැව් සනාථ විය. එහිදී සිදුවූ ප්‍රබල සාක්කියක් වූයේ දැරිය පෙර නිවසට ගිය අවස්ථාවේ ඇය භාවිතා කළ භාණ්ඩයක් ඉල්ලා සිටීමය. මියගිය දැරියගේ ආරක්ෂාවට කරේ බඳින ලද මාලය පිළිබඳව හෙළි කිරීම අතිශය පුදුම උපදවන සුලුවිය.

sinhalaebooks.com

පෙරභවයේ මළ සිරුර නිවසේ තැන්පත් කර තිබියදී තමා ඒ අසල සිටි බවත් භූමිදානයට ගෙන යන විටදී මව සහ ඥාතීන් හඬා වැලපුණු අයුරු තමා දුටු බවත් තවත් දරුවෙක් පැවසීය. මීට වසර ගණනකට උඩදී පර්යේෂණයකට ලක් වූ එම දරුවා උපත ලැබුවේ කොළඹදීය. පෙරභවයේ ලඝුලේඛකයකු ලෙස සේවය කරමින් සිටියදී රිය අනතුරකින් මරණයට පත් වූ තරුණයකුගේ ජීවන තොරතුරු එම දරුවා හෙළි කළේය. එම දරුවා උපත ලැබුවේ පෙරභවයේ සොයුරියකගේ පුත්‍රයෙකු ලෙසය.

මළ සිරුර පිළිබඳව පැහැදිලිව තොරතුරු අනාවරණය කළ සිදුවීමක් මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් විසින්ද සිදුකළේය. ඉන්දියාවේදී උපත ලද එම දරුවා පිළිබඳව1972 මැයි 7 වැනිදා කල්කටාවේ පුවත් පතක් වූ (ANAND BAZAR PATRIKA) මගින්ද ප්‍රසිද්ධියට පත් කළේය.

ඩෝලන් යනුවෙන් හැඳින් වූ එම දරුවා පැවසුවේ මළ සිරුර රෝහලෙන් ගෙන යනු තමා දුටු බවය. 1967 වසරේදී උපත ලද එම දරුවා පෙරභවය හෙළි කිරීම ආරම්භ කළේ වයස අවුරුදු දෙකහමාරේදීය.

sinhalaebooks.com

උපතින්ම පිරිමි ගති සිරිත් විදහා දැක්වූ එම දරුවා පිරිමි ඇඳුම් ඇඳීමට මහත් ආශාවක් දැක්වීම විශේෂත්වයක් විය. දිනක් සොහොයුරෙකුගේ කලිසම් සහ කමිස ඇඳීමට උත්සාහ කරනු මව දුටුවාය. එය නතර කර තමා වෙත එන ලෙස මව පැවසුවාය. එයින් කෝපයට පත් වූ දැරිය "ඔයා මට ඇඳුම් අඳින්න දුන්නේ නෑ"යැයි පැවසීය. නැවතත් මව ඇමතූ දැරිය "මම එතකොට පිරිමි ළමයෙක් අපිට ලොකු ගෙයක් තිබුණා. යනුවෙන්ද පැවසීය. මේ අයුරින් පෙරභවය හෙළි කිරීම ආරම්භ කළ දරුවා ඔහුගේ පෙර භවයේ නමද අනාවරණය කළේය

පෙර භවය පිළිබඳව ඉතා හොඳ මතකයකින් සිටි දැරිය ඇයට පෙර භවයේ සිටි සොහොයුරියක් සහ සොහොයුරෙක් පිළිබඳව ද හෙළි කළාය. පෙර සිටි ගමට ඇය රැගෙන ගියහොත් නිවස පෙන්වීමට හැකි බැව්ද ඇය නිතර ප්‍රකාශ කළහ. පෙරභව නිවසේ ඇති ඇගේ කලිසම් සහ කමිස රැගෙන ඒමට අවශ්‍ය බවත් පැවසූ දැරිය ඇය මරණයට පත් වූ අන්දමද පැහැදිලිව හෙළිකළාය.

එම නිවස පිළිබඳව ඔහු ප්‍රකාශ කළේ එය තට්ටු දෙකකින් යුත් දර්ශනීය නිවසක් බවය. ඇයට වෙනම කාමරයක් තිබූ බවද පැවසූ දැරිය ඇගේ ඇඳුම් වෙනම අල්මාරියක ඇති බැව්ද කීවාය. ඇය පාසල් ගියේ කාරයකින් බවත් පාසල නිවසට ආසන්නයේ තිබූ බවත් පැවසුවාය.

sinhalaebooks.com

වරක් ඇය ගමන් කළ මෝටර් රථය අනතුරකට පත් වූ බවත් ඇගේ මතකයේ තිබිණි. අනතුර සිදුවූ අන්දම අනාවරණය කළ දැරිය එම අනතුරෙන් මරණයට පත් වූ අය ගැනද මතකයේ ඇති බැව් ප්‍රකාශ කළාය.

ඇය පැවසුවේ දිගු කලක් රෝහල් ගතව සිටි බවකි. හිස පිටුපස සහ පාදයක වේදනාවක් පැවතුණ බැව්ද ඇය පැවසුවාය. වරක් රෝහලේ සිටියදී ඇඳෙන් වැටීමක් සිදු වූ බවද ඇයට මතක තිබිණි. රෝහලේදී මරණයට පත් වූ බැව් පැහැදිලිව හෙළි කළ දැරිය රෝහලේ සිට මිතුරන් පිරිසක් විසින් සිරුර භූමදානය පිණිස ගෙන ගිය බවද පැවසුවාය.

මෙම පුනර්භව සාධකය පිළිබඳව මහාචාර්ය ස්ටීවන්සන් ඇතුළු පර්යේෂකයන් විසින් සිදු කළ පර්යේෂණයේදී මළ සිරුර ගෙන ගිය අන්දම නිරීක්ෂණය කිරීමට අවධානය යොමු කැරිණි. ඇය අනාවරණය කළ පෙර භවයේ තරුණයා මරණයට පත්ව ඇත්තේ වයස අවුරුදු විසිහතරේදීය. හිස පිටුපස තදබල වේදනාවක් පැවතීම නිසා ඔහු රෝහල් ගත කර ඇත. වේදනාව වැඩිවීමත් සමඟ වරින් වර වමනයද ඇති වී තිබේ. මරණය සිදුවූ බැව් සඳහන් වන බව වාර්තාවේ. එය සඳහන් වී ඇත්තේ (DEVELOPED PAIN AT THE BACK OF HIS HEAD WITH OCCASIONAL VOMITING) යනුවෙනි. මරණය සිදු වී ඇත්තේ දින පහළොවක් පමණ රෝහල් ගතව සිටීමෙන් පසුවය.

sinhalaebooks.com

පෙරභවය හෙළි කළ දැරිය පැවසූ පරිදි ඇගේ සිරුර රෝහලේ සිට ට්‍රක් රථයක් මගින් සුසාන භූමිය වෙත රැගෙන ගිය බැව් සනාථ විය.

පෙරභවයේ මළ සිරුර රැගෙන ගොස් භූමදානය කළ ස්ථානයද නිවැරදිව අනාවරණය කළ තවත් දරුවෙක් උපත ලැබුවේ රඹුක්කන ප්‍රදේශයේදීය. වසන්ත නම් එම දරුවා වෙඩි පහරකට ලක් වී මියගිය බැව් හෙළි කළේය. පියාට තැබූ වෙඩි පහරක් එම දරුවාටද වැදීම නිසා මරණයට පත් වූ බැව් එම දරුවා ප්‍රකාශ කළේය.

1972 වසරේදී උපත ලැබූ ඔහු පිළිබඳව ද මහාචාර්ය ස්ටීවන්සන් විසින් පර්ියේෂණයක් සිදු කෙරුණි. පෙර භවයේ නිවස සොයා යාමටද එදා එම දරුවාට හැකිවිය. බහ තෝරණ වියේ සිට පෙරභවයේ දෙමාපියන් සහ සොයුරා සොයුරියන් පිළිබඳව නිවැරදිව තොරතුරු හෙළි කිරීමට එම දරුවාට හැකියාව තිබිණ. මළසිරුර ඔහු පදිංචිව සිටි නිවසට ආසන්නයට ගෙන ගොස් භූමදානය කළ බැව් එම දරුවා ප්‍රකාශ කළේ ඒ බැව් ඔහු දුටු බවය. එම දරුවා පෙරභව නිවස වෙත ගිය අවස්ථාවේ මළ සිරුර භූමදානය කළ ස්ථානය පෙන්වාදීමට ඔහුට හැකිවිය. පුනර්භව සාධකවලට ප්‍රබල සාක්කියක් ලෙස එම හඳුනාගැනීම පිළිබඳව පර්යේෂණ වාර්තාවලට ඇතුළත් කර තිබේ.